ISLAM GATE
بوابة الإسلام الدعوية

جمعية الدعـــوة والإرشاد
وتوعية الجاليات بالأحســـاء
AL-AHSA ISLAMIC CENTER



سنهالي

# لماذا الإسلام ؟

# ඉස්ලාම් දහම කුමක් සඳහාද?

تأليف: فاتن صبري
ترجمة : محمد سفراس نوفل

# لماذا الإسلام؟
# ඉස්ලාම් දහම කුමක් සඳහාද?

تأليف : فاتن صبري
සැකසුම : ෆාතින් සබ්රී

ترجمة : محمد سفراس نوفل
පරිවර්තනය:
මෞලවි . මොහමඩ් සෆ්රාස් (අල් බයානි)

ح جمعية الدعوة با الأحساء ، ١٤٤٣هـ

***فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر***

جمعية الدعوة با الأحساء
لماذا الإسلام ؟ : باللغة السنهالية. / جمعية الدعوة با الأحساء ؛ محمد سفراس نوفل .- الاحساء ، ١٤٤٣هـ

١٢٠ ص ؛ ..سم

ردمك: ٦-٠-٩١٧١٧-٦٠٣-٩٧٨

١- الاسلام أ.نوفل ، محمد سفراس (مترجم) ب.العنوان

ديوي ٢١٠ ١٤٤٣/٢٠٣٩

**رقم الإيداع: ١٤٤٣/٢٠٣٩**
**ردمك: ٦-٠-٩١٧١٧-٦٠٣-٩٧٨**

# අන්තර්ගතය


| | මාතෘකාව | පිටු |
|---|---|---|
| | කතු වැකිය | **07** |
| 01 | පෙරවදනය | **14** |
| 02 | ජනමාධ්‍ය මගින් සිදුකරනු ලබන සෘණාත්මක ප්‍රචාරණ හමුවේ වුවද ඉස්ලාම් දහම ව්‍යාප්ත වන්නේ ඇයි? | **33** |
| | 1. මැවුම්කරුගේ ඒකීය භාවය පිළිබඳ වූ සංකල්පය ඉස්ලාම් දහම සුරක්ෂිත කරයි. | **35** |
| | 2. විනාශ වීම, වැඩි කිරීම හෝ අඩුකිරීමෙන් පාරිශුද්ධ වූ අල් - කුර්ආනය ඉස්ලාම් දහම සුරක්ෂිත කරයි. | **37** |
| | 3. ඉස්ලාම් ධර්මය ඉපැරණි ධර්ම ග්‍රන්ථ හා ගිවිසුම් තහවුරු කරයි, ධර්ම ශාස්තෘවරුන් හට ගරු කල යුතු බව පවසයි. | **38** |
| | 4. ඉස්ලාම් දහම විශ්වාසයේ නිදහස් බව තහවුරු කරයි, එමෙන්ම සෙසු දහම් හා ඇදහිලි පිළිබඳ විශ්වාසවන්තයින් හුදෙක් සුහදශීලී සංවාදයන් සඳහා ආරාධනා කරයි. | **40** |
| | 5. හුදු තර්කය විතර්ක පරදවා විචාරශීලී ලෙස සහ සවිඥානික ලෙස මෙම විශ්වය අධ්‍යනය කරන මෙන් ඉස්ලාම් දහම ආරාධනා කරයි. | **45** |
| | 6. ඉස්ලාම් ධර්මය මිනිසාව මුල් පව් බරෙන් නිදහස් කොට සමාවද ලබාදෙයි. | **53** |

| | | |
|---|---|---|
| | 7. ඉස්ලාම් දහම මිනිසාව විශ්වය හා බැඳි සුසංයෝගයෙන් යුතු ජීවිතයක් වෙත මඟ පාදයි. | 56 |
| | 8. ඉස්ලාම් දහම තුලින් පතිවත සුරැකීම වෙතත්, විනීත ජීවිතයක් වෙතත් ආරාධනා කරයි. | 57 |
| | 9. ඉස්ලාම් දහම ඉවසීම, මධ්‍යස්ත ලෙස කටයුතු කිරීම සහ සමාව ලබාදීම කෙරෙහි මඟ පෙන්වයි. | 59 |
| | 10. අල්ලාහ්ගේ කරුණාවෙන් විශ්වාසභංගත්වයට පත් වීමක් ඉස්ලාමය තුල නොමැත. | 61 |
| | 11. ඉස්ලාම් දහම සමානාත්මකතාවය, එක්සත් භාවය වෙත කැඳවන අතර වාර්ගික වෙනස්කම්වලට එරෙහිව නැගී සිටීම වෙත ආරාධනා කරයි. | 63 |
| | 12. නිදහසේ දහමයි ඉස්ලාමය: | 68 |
| | - විශ්වාසයේ සහ කැමති දහමක් පිළිගැනීමේ නිදහස. | 68 |
| | - වහල්බවින් නිදහස. | 69 |
| | 13. යුක්තියේ දහමයි ඉස්ලාම්. | 77 |
| | 14. ඉස්ලාම් අයිතිවාසිකම් සුරකියි. | 79 |
| | - සෙසු අය කෙරෙහි තිබෙන අයිතිවාසිකම්. | 79 |
| | - දෙමව්පියන් හට හිමිවෙන සුවිශේෂී ස්ථානය. | 83 |
| | - ඥාතීන්ගේ අයිතිවාසිකම්. | 84 |

| | මාතෘකාව | පිටු |
|---|---|---|
| | - අසල්වැසියගේ අයිතිවාසිකම්. | **84** |
| | - අනාථ දරුවන්ගේ අයිතිවාසිකම්. | **86** |
| | - සතා සිව්පාවුන්ගේ අයිතිවාසිකම්. | **86** |
| | 15. ඉස්ලාම් දහම සමකාලීන ගැටළු විසඳයි. | **89** |
| | 16. යුධ සිරකරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ න්‍යායන් හේතුවෙන් ඉස්ලාම් දහම ඉහළ ස්ථානයක වැජඹේ. | **89** |
| | 17. ඉස්ලාම් දහමෙහි ක්‍රමවත් මූල්‍ය පද්ධතිය ආර්ථිකයෙහි ස්ථාවර භාවය ඇති කිරීමට මඟ පාදයි. | **91** |
| | 18. ඉස්ලාම් දහම ධනය මෙන්ම නිරෝගීභාවය සුරකියි. | **94** |
| | 19. ඉස්ලාම් දහම කාන්තා අයිතිවාසිකම් සුරැකීමෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානය අභිබවයි. | **97** |
| | 20. ආදරය සහ උපකාරයේ දහමයි ඉස්ලාම්. | **115** |
| | 21. දෙලොවෙහිම සතුට සැනසුම තහවුරු කරන එකම දහමයි ඉස්ලාම්. | **116** |
| 03 | මුහම්මද් (නබි තුමා) ගැන විමතියට පත් වූවන්: | **117** |
| | - නැපෝලියන් බොනපාට් | **117** |
| | - මහත්මා ගාන්ධි | **118** |
| | - ලාමාර්ටින් | **119** |
| | - ඇඩ්වර්ඩ් ගිබ්බොන් | **120** |
| | - බොස්වර්ත් ස්මිත් | **120** |

| | මාතෘකාව | පිටු |
|---|---|---|
| | - ඇනී බෙසන්ට් | **121** |
| | - ජේම්ස් මයිකනර් | **123** |
| | - මයිකල් හාර්ට් | **124** |
| | - සරෝජිනී නායිඩු | **126** |
| | - තෝමස් කාලයිල් | **127** |
| | - ස්ටැන්ලි ලින් පෝල් | **127** |
| | - ජෝර්ජ් බර්නාඩ් ෂෝ | **128** |
| 04 | ලුහුඬින් | **129** |

## කතු වැකිය

විවිධ රට රාජ්‍යයන් වෙත වූ මාගේ ගමන් බිමන් හේතුවෙන් බොහෝ භාෂාවන් හසුරුවීම සඳහා පන්නරයක් මෙන්ම බොහෝ සංස්කෘතීන් පිළිබඳ මනා අවබෝධයක් මා හට ලැබුණි.

විවිධ වූ සංස්කෘතීන් සහ ශිෂ්ටාචාර, විවිධ වූ භාෂාවන් මෙන්ම විවිධ වූ විශ්වාසයන් පිළිබඳ සලකා බැලීමේදී එහි වටිනාකම, සදාචාරයන්, මෙන්ම පොදු මානුෂීය මූලධර්මයන් අතර පොදු අන්තර් සබඳතාවයන් මෙන්ම අප අතර තිබෙන ගැටළු, අභියෝගයන්, අභිලාෂයන් අතරද බොහෝ සමානාත්මකතාවයන් දැකගත හැකිවිය.

කෙසේ නමුත් ජනයා ලෙසින් අප හුදෙක්ම (එහි) වටිනාකම, සදාචාරය මෙන්ම මානුෂීය මූලධර්ම තුළ පමණක් නොව එහි ඉතිහාසමය පසුබිම, දහමේ මෙන්ම ප්‍රතිපත්තියේ මුල තුළින්ද මානව සංහතියේ

මුල්ම මිනිසා වූ ආදම් වෙත සම්බන්ධ වෙමු. එමෙන්ම නිසැකවම ආදම් හට දහමක් දර්ශනයක් මෙන්ම විශ්වාසයක් තිබිණ. නමුත් විවිධ දහම් සහ විශ්වාසයන් නිසා පරස්පරතාවයන් ඇති වූයේ මනුෂ්‍යයන් තුලින්මය.

ජනයාගේ දහම පිලිබඳ (ඇදහිලි) හා වැඳුම් පිදුම් මූලික විශ්වාසයන් පිලිබඳ වැඩිදුර සලකා බැලීමේදී දැනගත ගත හැකි කරුණක් නම්, බොහෝ සමාජයන් තම දහම (තමන්ට පෙර ජීවත් වූ, තම මුතුන් මිත්තන්ගෙන්) උරුම කරගත් ඒවා බවයි. තවද එයට විවිධ ආගමික සංකේතද තිබෙනු දකින්නට හැකිය. එමෙන්ම දැඩි පීඩාකාරී අවස්ථාවන්හි ඒ ගැන කියමින් කන්නලව් කිරීම සඳහා මේ විශ්වය තුල මැවුම්කරුවෙකු සිටී යනුවෙන්ද ඔවුන් විශ්වාස කරයි. ඉහත එම දහම් සහ විශ්වාසයන් එකම මුලකින් පැවත එන ඓතිහාසික පසුබිමක් ඇති පිවිතුරු, ඒකීය සහ නිවැරදි (දහම්) බව තහවුරු වේ.

වර්තමානයේ ජීවත් වෙන ජනයා අතර තිබෙන ආගමික උරුමයන් (වන දේව ධර්ම ග්‍රන්ථ) වලත් දෙවිඳුන් ඒකීයයි, වන්දනාවෙන් ඔහුව ඒකීය දෙවියෙකු ලෙසි පිදිය යුතුයි යනුවෙන් වූ චින්තනයන් අන්තර්ගත වී තිබේ. තවද එකී ධර්ම ග්‍රන්ථයන් වල නිත්‍ය ලෙස ඉස්ලාමීය ප්‍රතිපත්තීන්, සහ ඒක දේවත්වය වෙත මග පාදන සාක්ෂි සාධක (බොහෝ) තිබේ.

සියල්ලන්ටම තිබෙන ප්‍රශ්නය නම් ඉස්ලාම් ධර්මය මුල්ම දහම වූයේ කුමක් සඳහාද? එයට ලබා දිය හැකි ඉතාමත් සරල පිළිතුර නම් ලොව මනුෂ්‍ය වර්ගයාගේ මුල්ම පියා ආදම් (අලෛහි සලාම්) තුමාණන්ගේ දහම එය යන්න.

මනුෂ්‍ය වර්ගයාගේ ප්‍රාරම්භයත් සමග බිහි වූ, බොහෝ සමූහයන් (තරඟකාරීත්වයකින් තොරව) ඉවත් වූ ඉස්ලාම් දහම දහම් අතරින් ප්‍රථම, නිවැරදි සහ නිරවුල් දහම වූයේ කුමක් සඳහාද යන්න පිළිබඳව මෙම

පොත මගින් මා විස්තර කර ඇත්තෙමි. සෙසු දහම් සම්බන්ධ නොකර ඉස්ලාම් දහම පමණක්ම විකෘති කිරීම සඳහා මෙන්ම ත්‍රස්තවාදයේ චෝදනාව හා සම්බන්ධ කරනු ලබන්නේ කුමක් සඳහාද යයි (වෙනස්ම ආකාරයකින්) පැහැදිලි කර ඇත්තෙමි.

ඉස්ලාම් දහම ජනයා හට පැහැදිලි කිරීම තම මූලික අරමුණ කරගත් ග්‍රන්ථයකි මෙය. (ඉස්ලාම් දහම) ඒකීය දේව සංකල්පය මත ඒකීය දෙවිඳානන් (අල්ලාහ්) විසින් සියලුම ජන සමාජයන් සඳහා පහළ කරන ලද අනාවරණයක් වේ. අල්ලාහ් (සත්‍ය දෙවිඳුන්) විසින් පත් කරනු ලැබූ සෑම ධර්ම දූතයෙකුම මෙම ප්‍රතිපත්තිය පිළිබඳ ජනයා දැනුවත් කරමින් එය රැක ගැනීම සඳහා දැඩි ලෙස කැපකිරීම් කරමින්, ඒ වෙනුවෙන් ඇප කැප වී කටයුතු කළහ. නියත වශයෙන්ම ඉස්ලාම් දහම මනුෂ්‍යයින්ගේ බුද්ධිය, චින්තනයන් මෙන්ම විශ්වාසයන් කිලුටු වලින් මෙන්ම මුසාවාදයන්ගෙන් පිරිපහදු කිරීම තම අරමුණ කරගෙන තිබේ. තවද සකල ලොව

නිර්මාතෘවරයා පිලිබඳ මතක් කරමින්, ඔහු වෙත හැරීම, ඔහු හා සෘජු සබඳතාවයන් ගොඩනගා ගැනීම සඳහා මග පෙන්වයි.

සම්ප්‍රදායන් සහ සිරිත් විරිත් අතර නැවතී තිබෙන දැඩි සිත් මෙන්ම චින්තන බිඳ දැමීම සඳහාද, නිදහස තහවුරු කොට, සිරවී තිබෙන හදවත් නිදහස් කිරීම සඳහා මෙන්ම නිර්මාණශීලීත්වය වෙත මනුෂ්‍ය වර්ගයා පෙළඹවීම සඳහාද කටයුතු කර තිබේ.
නියත වශයෙන්ම මෙම ග්‍රන්ථය ඉස්ලාම් දහමෙහි සුවිශේෂත්වය, විශිෂ්ඨත්වය මෙන්ම නම්‍යශීලී බව යුග ගණනාවක් ගෙවී ගියද වෙනස්වූ ජන සමාජයන් අතරේ මෙන්ම (ඉස්ලාම් දහමට වූ පිළිගැනීම්) විවිධ ශිෂ්ටාචාර සහ ජන සමාජයන් අතරේද, කාලීන සිදුවීම් ඔස්සේ, දියුණු වෙන ලෝකයන් සමග (සම සමව) කටයුතු කරමින්, එහි කල්පැවැත්ම සහ එහි බලය ශක්තිය වෙහෙසට පත්කරවන උත්සාහයන්, එහි ප්‍රතිරූපය සහ ස්ථිර භාවය විකෘති කිරීම සඳහා දිගින් දිගටම සිදු

කරනු ලබන සෘණාත්මක ප්‍රචාරණයන් ඉදිරියේ තමන්ට එරෙහිවන්නන් හට හතුරුකම් කරන ත්‍රස්තවාදයෙන් පිටු පෙරලන ජනයා එයට විරුද්ධව සටන්කිරීම සඳහා පොළඹවන උත්සාහයන්වලට නොසැලී සිටී. කණගාටුවට කාරණාව නම්; බොහෝ මිනිස්සුන් ඉස්ලාම් පිලිබඳ එහි මූලිකාංගයන්, එහි නීති රීතීන් ගැන හෝ අවම තරමේ ඉස්ලාමයේ ආරාධනාව පිලිබඳවද නොදැන ඉස්ලාම් දහමට එරෙහිව තීන්දු ප්‍රකාශයට පත් කිරීමය. එවන් ඔවුන් හට පාරිශුද්ධ වූ අල් කුර්ආනය තුල අන්තර් ගතවී තිබෙන මඟපෙන්වීම්, උපදෙස්, ප්‍රඥාවනීය දෙසුම්, හා මනුස්සයන් වෙනුවෙන් වූ යහපත් මඟපෙන්වීම් කෙතරම් තිබේදැයි, යන්න පවා ඔවුන් නොදනී. ඉස්ලාම් දහමෙහි යථාර්තය අවබෝධ කරගැනීම පිලිබඳ තිබෙන වැදගත්කම මත නියතව මනුස්සයින් දැනුවත් නොවීම පිලිබඳ සැලකිය යුතු වගකීම් කොටසක් අප කර මත පටවනු ලැබී තිබේ. එම නිසයි, සත්‍යට දුරස්ව සිටින්නන්ගේ දෑස් ඉදිරිපිට තිබෙන

තිරය ඉවත් වී (සත්‍ය දෘශ්‍යමාන වීමට) ඔවුන්ගේ බැල්ම ඔවුන් වෙත හැරීමට, ඉස්ලාමය ගැන තීන්දු තීරණ ගැනීමට ප්‍රථම පාරිශුද්ධ වූ අල් - කුර්ආනය කියවීමට සහ ඉස්ලාමයේ මූලිකාංගයන් දැනගැනීමට (මෙම පොත් පිංච තුලින්) අවස්ථාවක් උදාකර දීම පිණිස මෙලෙස මා ආරාධනා කර සිටින්නේ.

සර්වසම්පන්න සර්වබලධාරී (අල්ලහ්) වෙත මාගේ ප්‍රාර්ථනාව වන්නේ මෙම පොත සත්‍ය සොයන්නන්ගේ, බුද්ධිමතුන් විචක්ෂණශීලීන් මෙන්ම විවෘත හදවත් ඇත්තන්ගේ මං මාවත එළිය කරන්නක් ලෙස පත් කරත්වා. ඉස්ලාමයේ උදාර භාවය ගැන සෑම දෙනා හටම පැහැදිලි කරන සාමයේ පණිවුඩය රැගත් ලිපියක් බවටද පත්කරත්වා.

# පෙරවදනය

නියතව ඉස්ලාමයේ පණිවුඩය මානව සංහතියේ ප්‍රාරම්භයේ සිට - ආදම් (1) අලෛහිස් සලාම් තුමාණන් පටන් අවසන් ධර්ම ශාස්තෘ නබි මුහම්මද් (සල්) තුමාණන් දක්වා සකල ලොව පරිපාලක *(රබ්බුල් ආලමීන්) (2) ඒකීය දෙවිඳානන් වන්දනාමාන කිරීම පිළිබඳව ඔහු හා සෘජු සබඳතා ගොඩනගා ගැනීම පිලිබඳ, වත්පිළිවෙත් ඒකීය දෙවිඳුන් හට පිවිතුරු ලෙස පුද කිරීම පිලිබඳ මෙන්ම, සෑම අවස්ථාවෙහිම අල්ලාහ් වෙතම හැරීම පිළිබඳව, අල්ලාහ්ගේ හැකියාවන් මෙන්ම කැමැත්ත ඉදිරියේ තමාව සම්පූර්ණයෙන් අවනත කරවීම පිලිබඳ, ඔහු විසින් අනාවරණය කරන ලද ග්‍රන්ථ, පහල කරන ලද ධර්ම ශාස්තෘ වරුන් ගැන විශ්වාස කිරීම පිලිබඳ, මලක්වරුන් (දේව දූතවරුන්) ගැන මෙන්ම විනිශ්ච දිනය ගැන විශ්වාස කිරීම පිලිබඳ විය.

---

(1) ආදම් සර්ව බලධාරී අල්ලාහ් විසින් මවනු ලැබූ ප්‍රථම මිනිසා වන්නේය.

(2) දෙවියා යනු සියල්ලෙහිම නිර්මාතෘ ඒකීය මෙන්ම කිසිම අවශ්‍යතාවයකින් තොරවූ, තමාගේ ඉමහත් භාවය අන් කිසිවෙකු හා සංසන්දනය කළ නොහැකි, තමා වෙනුවෙන් සහකාරියෙකු, හෝ දරුවන් තබා ගැනීම තම ඉමහත් භාවයට එය කිසිම විටක යෝග්‍ය වන්නේ නැති සත්‍ය දෙවිඳුන් වන ඔහු කිසිවෙකුට දාව

නොඉපදුනු සහ තමන්ට දාව කිසිවෙකු නොඉපදුනු තමාට කිසිම සමානයක් හෝ ප්‍රතිවාදියෙක් නොමැති සර්ව සම්පූර්ණ එකම දෙවියා වන්නේය.

හේතු සහ කාරණා මත පදනම් වීම යනු මනුෂ්‍යයන් වන අපට අදාළ නියමයන් වන්නේය. නමුත් සත්‍ය දෙවිඳුන් අල්ලාහ් වන ඔහු ස්ථාන මෙන්ම කාලයේ නිර්මාතෘ වන අතර ඔහු ඒවාට අනුකූල ලෙස සිටීමට කිසිම අවශ්‍යතාවයක් නොමැත. හේතු මත පදනම් වූ ක්‍රමවේදයේ නිර්මාණය කළේ අල්ලාහ්ය. එම නිසා හේතු කාරනා මත සිටීමේ අවශ්‍යතාවය අල්ලාහ්ට කිසිසේත්ම නොමැත. ඒවා සියල්ලකින්ම අල්ලාහ් ඉමහත් මෙන්ම සුවිශුද්ධ වන්නේය. අල්ලාහ්වද හේතු කරණා තුලින් සහ කාලය සහ ස්ථානය තුලින් සෙවීමක නිරතවීම අපගේ පැත්තේ තිබෙන වරදකි. අල්ලාහ් වෙනස් නොවේ. කාලය නිර්මාණය කළ අල්ලාහ් කිසිම විටක කාලයෙන් වයෝවෘද නොවේ, කාලයට අවනත වීමක්ද නොවේ. කාලයේ විවිධ කොටස් තුලින් අප ගමන් කරන්නා සේ අල්ලාහ් එලෙසින් ගමන් නොකරයි. ඔහු වෙහෙසට පත් වන්නේද නැත. ඔහුව සුරැකීම සඳහා හෝ පොලොව සමීපයට පැමිණීම සඳහා කිසිම ද්‍රව්‍යක තැබීම අවශ්‍ය නොවේ. අප හේතු කාරණා මත සිටින අතර අල්ලාහ් එලෙසින් නොමැති නිසා මෙලොව අල්ලහ්ව අපේ දෑස් වලට දෘශ්‍යමාන නොවේ. අප ඒවායින් වලක්වනු ලැබූ පිරිස්ය. උදාහරණයකට: කිසිදු ජනේලයක් නොමැති (හතර වටෙන්ම ආවරණය කරන ලද) කාමරයක් තුල හිඳ (තම සියසින් නවීන සන්නිවේදන ක්‍රම භාවිතා නොකර) බැලිය හැක්කේ හැක්කේ කාමරය ඇතුලත පමණක්ය.

සකල ලොවටම අධිපති සත්‍ය දෙවියන් සෑම ජන සමාජයක් වෙතම ධර්ම ශාස්තෘවරු පහළ කළේ එකම පණිවුඩය රැගෙනය. එය ගැලවුම සඳහා ඇති එකම පැහැදිලි මාවත මෙන්ම එය සරල පණිවිඩයකි එය නම් ඒකීය දෙවිඳානන් කෙරෙහි විශ්වාස තැබීමය සහ වැඳුම් පිදුම් තුළින් ඔහුව ඔහුව ඒකීය දෙවියෙකු ලෙස පිදීමය. ඒ පිලිබඳවයි මතු ලොව දාසයා විමසනු ලබන්නේ ඒ ඔවුනොවුන්ගේ ක්‍රියාවන් මතය, එහි අවසන් ප්‍රථිපලය එක්කෝ ඔහුගේ නැවතුම ස්වර්ගය නැතිනම් අපායේ ලෙස සනිටුහන් වනු ඇත. සත්‍ය දෙවිඳානන් තම ධර්ම ශාස්තෘන් පහළ කළේ ධර්ම ග්‍රන්ථ සමගයි ඒතුල නීති, ජීවන මඟ පෙන්වීම්, ආචාර ධර්ම යන සියල්ලම ඇතුලත් වෙයි. (එහි පණිවුඩ) මේ මිහිකත මත තිබෙන්නා වූ සියලුම ජන සමාජයන් වෙතය. එහෙයින් ජනයා කෙරෙහි තිබෙන පරම වගකීම වන්නේ එම (පැහැදිලි වූ දූතත්වය පිළිගෙන පිළිපැදීමය) ඒ මතයි ඔවුන්ගේ විචාරණයන් පවතින්නේ.

නියතව ධර්ම ශාස්තෘවරුන්, දූතවරුන් තම අනුගාමිකයන්ගේ ගමන්මඟ එළිය කරන ආලෝකයක් ලෙස සිටියහ. එම නිසා ඔවුන් හට නිර්වාණයේ මඟ සොයා යෑමේ කර්තව්‍ය පැහැදිලි එකක් බවට පත් විය. ඒ තම ධර්ම ශාස්තෘවරුන්ගේ, දූතවරුන්ගේ ඉගැන්වීම්, මඟ පෙන්වීම් අනුගමනය කිරීම තුලින් මෙන්ම ඒකීය දෙවිඳුන් වන්දනාමාන කිරීම තුලින්ය. සකල ලොවහි පරිපාලක ඒකීය දෙවිඳුන් සෑම සමාජයකම තැන්පත් සහ භියබැතිමත් පුද්ගලයන් අතරින් කෙනෙක්ව ඔවුහු තම සමාජයට ඒකීය දෙවිඳානන් වන්දනා මාන කිරීම පිළිබඳ මෙනෙහි කිරීම සඳහා වක්තෘවරුන්, ධර්ම ශාස්තෘවරුන් ලෙස පත් කළේය. එනමුත් කාලයාගේ ඇවෑමෙන් ඔවුහු සෘජු මාවතෙන් ඉවත්ව ගොස් තමාට සිතැඟි දේවල් පිළිපදින්නට විය. සකල ලොවහි නිර්මාතෘ හැර සෙසු අයව වන්දනා මාන කළෝය. තම දෙවිඳුන් හා තමන් අතර ආදේශකයන් පත්කරගත්තෝය. ඔවුන්වද වදිනු ලබන දෙවිවරුන් ලෙස පත් කර ගත්තෝය. නමුත්

ඉස්ලාමයේ ශුද්ධ වූ පණිවුඩය එලෙසින්ම පිලිපැදි සමාජයක් බවට ඉස්ලාමිය සමාජය, අවසන් ධර්ම ශාස්තෘ මුහම්මද් නබි (සල්) තුමාගේ අනුගාමිකයන් කටයුතු කළෝය. එහි ප්‍රතිපලයකි ශුද්ධ වූ අල් කුර්ආනය ධර්ම ශාස්තෘ හට පහළ කරනු ලැබූ ආකාරයටම කිසිම විකෘති කිරීමකින්, වෙනස්කිරීමකින් තොරව එලෙසින්ම එහි පාරිශුද්ධ භාවය සුරැකී තිබෙන්නේ. දූත මෙහෙවර සඳහා වූ අවසන් අනාවරණය සංස්කරණයේ අවසන් කොටස මෙන්ම නිවැරදිම එක වීම සහ පෙර පහල කරන ලද බොහෝ විකෘති කිරීම් සහ වෙනස් කිරීම් වලට භාජනය වූ ධර්ම ග්‍රන්ථ හැර සකල ලොවහි පරිපාලක ඒකීය දෙවිඳුන්ගේ තෘප්තිය හිමි වූ ග්‍රන්ථය වීමයි තර්කානුකූලද වන්නේ.

ශුද්ධ වූ අල් කුර්ආන් 5:3 (.. **අද දින මා නුඹලාගේ දහම නුඹලාට සම්පූර්ණ කර ඇත්තෙමි. මාගේ දායාදයද නුඹලාට සම්පූර්න කර ඇත්තෙමි. තවද මම ඉස්ලාමය නුඹලාට ආගම ලෙස පිළිගතිමි** ..

ඉස්ලාමයේ මූලික ඉගැන්වීම් අතරින්:
* සලාතය තුලින් ඒකීය දෙවිඳාණන් අතර වූ සබඳතාවය දිගටම පවත්වා ගැනීම.

* මිනිසා තමාගේ අපේක්ෂාවන් ශක්තිමත් කිරීම, තමා පිලිබඳ තක්සේරු කිරීම සඳහා මෙන්ම, කරුණාවේ සිතුවිලි වර්ධනය කිරීම සඳහා, සෙසු අය හා ඇලුණු, බැඳුනු ජීවිතයක් උපවාසය තුලින් ප්‍රගුණ කිරීම.

* (z)සකාතය යන පිළිවෙත තුලින් පුද්ගලයා තම ධනයෙන් ඉතාමත් කුඩා කොටසක් දුගීන්, දුප්පතුන් වෙනුවෙන් යහ මාර්ගයේ වියදම් කිරීමට කටයුතු කිරීම. එය පුද්ගලයෙකුට තමා තුල පරිත්‍යාගශීලී භාවය වර්ධනය කර මසුරුකමෙන් තමාව මුදවා ගැනීම සඳහා අනිවාර්ය කරන ලද වන්දනාවකි.

* හජ් නම් වූ කර්තව්‍ය තුලින් ඉටු කරනු ලබන වත්පිළිවෙත් විශ්වාසවන්තයින් තම නිර්මාතෘ ඒකීය දෙවිඳුන් වෙනුවෙන් නියමිත ස්ථානයක, යම් කිසි කාල වකවානුවක්

සම්පූර්ණයෙන් තමාව මදකට නිදහස් කරගැනීම වේ. (3) එය නමින් විවිධ වූ මිනිස් ගතිපැවතුම්, සංස්කෘතීන්, භාෂාවන්, තරාතිරම්, වර්ණ යනාදීන් අතර එක්සේසත් කරන නිර්මාතෘ ඒකීය දෙවිඳානන් වෙත හැරීම සඳහා වූ අගනා සලකුණක්ය.

-----------------------------------------------------

(3) මක්කා සහ මදීනා යන නගර දෙක පිහිටා ඇත්තේ සෞදී අරාබියේය. පරිශුද්ධ වූ කඃබාව පිහිටා තිබෙන්නේ මක්කා නගරයේය. ඒකීය දෙවිඳානන් වන්දනා කිරීම සඳහා මෙලොව ස්ථාපිත කරනු ලැබූ ප්‍රථම නැමදුම් පළ ලෙසයි මුස්ලිම්වරුන් විශ්වාස කරන්නේ.

කිසිම බෙදා වෙන්කිරීමකින් තොරව සෑම ධර්ම ශාස්තෘ වරයෙකු පිළිබඳවම විශ්වාස කළ යුතු යයි ඉස්ලාම් දහම පවසයි. ඕනෑම නබිවරයෙකු හෝ රසූල් වරයෙක් ප්‍රතික්ෂේප කිරීම යනු ඉස්ලාමිය ප්‍රතිපත්තියට සපුරා පටැහැනි ක්‍රියාවකි. මෙම ක්‍රමවේදය දිව්‍යම ග්‍රන්ථ විශ්වාස කරන්නන් අතර බලවත් සබඳතාවයක් උදා කර තිබේ.

ශුද්ධ වූ අල් කුර්ආන් 2:285 **මෙම දූතයා තම 'රබ්'ගෙන් තමාට පහළ කරනු ලැබූ දෙය විශ්වාස කර ඇත්තේය. මුඃමින්වරුද (විශ්වාස කර ඇත්තෝය, ඔවුන්) සියලුදෙනාම අල්ලාහ්වද, ඔහුගේ මලක්වරුන්ද ඔහුගේ පුස්තකද, ඔහුගේ දූතයින්වද විශ්වාස කර ඇත්තෝය. ඔහුගේ දූතයින්ගෙන් කවුරුන් අතර හෝ වෙනස්කම් නොපෙන්වන්නෙමු: අපි සවන් දුනිමු; අවනත වූවෙමු; අපගේ 'රබ්'! නුඹගේ සමාව අපේක්ෂා කරමු. නුඹ වෙතටම පැමිණීම ඇත' යිද පවසති.**

විවිධ ජන සමාජයන් වෙත පහල කරනු ලැබූ ධර්ම ශාස්තෘවරුන්ගේ නම් ශුද්ධ වූ අල් කුර්ආනයේ (නූහ්, ඉබ්‍රාහීම්, ඉස්මාඊල්, ඉස්හාක්, යාකූබ්, යූසුෆ්, මූසා, දාවූද්, සුලෛමාන්, ඊසා ..) යන නමින්ද, නම්

සඳහන් කරනු නොලැබූ ධර්ම දූතවරුන් ඒ අතර වෙති. ඉන්දු සහ බෞද්ධ ආගමික නායකයින් (උදාහරණයක් ලෙස : රාමා, ක්‍රිෂ්ණා, ගෞතම බුදුන්) ධර්ම දූතවරුන් යනුවෙන් සමහරු පවසයි, එම අනුමානයන් (නිකරුණේ බැහැර කළ හැක්කක්ද නොවන) වහල් භාවයෙන් මිදුණු මතයන් අතර වේ. අරාබිවරුන් වෙත නබි මුහම්මද් (සල්) තුමන් පහල කරනු ලැබුවා සේ වර්තමානයේ ජීවත් වෙන සමහර ජන කොට්ටාශ තමන් වෙතද ධර්ම ශාස්තෘ වරුන් පහල කරනු නොලැබූ බව පවසයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 40:78 **(ඕ:නබි!) අපි නුඹට පෙර බොහෝ දූතයින්ව යවා ඇත්තෙමු. ඔවුන්ගෙන් සමහරුන් ගැන අපි නුඹට පවසා ඇත්තෙමු. තවද ඔවුන්ගෙන් සමහරුන් ගැන අප නුඹට නොපැවසුවෙමු. අල්ලාහ්ගේ අනුමැතියෙන් තොරව කවර දූතකුට වූවද කවර සාක්ෂියක් වූවද ගෙන ඒමට නොහැකිය. අල්ලාහ්ගේ අණ පැමිණියේ නම් යුක්තිය මඟින් විනිශ්චය දෙනු ලබන්නේය. එහිදී නිෂ්ඵලයෝ පාඩු ලබන්නෝය.**

ඉස්ලාම් දහම මිනිසාගේ වටිනාකම මෙන්ම ගරුත්වය ආරක්ෂා කරයි. අයිතිවාසිකම් ලබාගැනීමේදී මෙන්ම වගකීම් ඉටු කිරීමෙහි ලා සෑම මනුස්සයෙකුම එක සමාන වන බව අපට උගන්වයි. ආරක්ෂාව සෑම දෙනා හටම තහවුරු කිරීම තුලින් සාමය අගයන්නන් ලෙස, යුක්තිය ස්ථාපිත කරන්නන් ලෙස සිටින මෙන් අප හට ආරාධනා කරයි. අසල්වැසියන් හා සුහඳව කටයුතු කිරීම, මුදල් හා වස්තූන් සුරක්ෂිත කිරීම, ගිවිසුම් සුරැකීම, සෙසු උසස් මූලධර්ම සුරැකීම පිළිබඳවද අවධාරණය කරයි. මේවා සියල්ල තුලින් දිව්‍යම අනාවරණයන් සියල්ල එකම මුලකින් පැවත එන බව එහි අනුගාමිකයන් හට තහවුරු කරයි.

සෙසු අය හට ගරු කිරීම මෙන්ම ඔවුන්ව යහපත් දෙසුම් මඟින් සහ ප්‍රඥාවෙන් සත්‍ය දහම වෙත ආරාධනා කිරීමහි වැදගත්කමත් ඉස්ලාම් දහම තහවුරු කරයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 16:125 **ඥානය මඟින්ද, ලස්සන උපදේශය මඟින්ද නුඹගේ 'රබ්'ගේ මඟ කරා**

**අඬගසන්න! තවද වඩාත් හොඳාකාරයෙන් ඔවුන් සමඟ තර්ක කරන්න! කවරෙක් තම මඟෙහි ඉවත්වූයේද ඔහු ගැන නුඹගේ 'රබ්'ම වඩාත් හොඳින් දන්නාය. යහමඟ ලබන්නන් ගැනද ඔහුම හොඳින් දන්නාය.**

කර්කශ මෙන්ම දැඩි ක්‍රමවේද තුලින් හෝ ප්‍රචණ්ඩත්වය තුලින් මඟ පෙන්වීම සහ මත ප්‍රකාශ කිරීම ඉස්ලාම් දහම ප්‍රතික්ෂේප කරයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 3:159 **(ඔ:නබි!) අල්ලාහ්ගේ දායාදය හේතුවෙන්ම නුඹ ඔවුන් සමඟ මෘදුව ක්‍රියා කරහිය. නුඹ සැර පරුෂ කෙනෙකු ලෙසද, දැඩි සිතක් ඇත්තෙකු ලෙසද සිටියේ නම් ඔවුහු නුඹ කෙරෙන් ඉවත් වී ගොස් තිබෙන්නෝය. එහෙයින්, නුඹ ඔවුනට සමාව දී, ඔවුන් වෙනුවෙන් සමාව අයැද! කාර්යන්හිදී, ඔවුන් සමඟ සාකච්ඡා කරන්න! නුඹ ස්ථිර නිගමණයකට එළඹියේ නම් අල්ලාහ් වෙත පූර්ණව විශ්වාස තබන්න. නියතව අල්ලාහ් (තමා කෙරෙහි) පූර්ණව විශ්වාස තබන්නන්ට ප්‍රිය කරයි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 21:107 (4) **(ඕ: නබි!) අප නුඹව සකල ලෝවැසියන්ටම ආශිංසනයක් මිස නොයැව්වෙමු.**

-----------------------------------------------------

(04) අල්ලාහ් ශුද්ධ වූ (අල් කුර්ආනයේ) තමන් පිළිබඳ සඳහන් කරන වැකි වල සර්ව නාම පද බහු වචන ලෙසි අප, අපි යනුවෙන් භාවිතා කර තිබේ. එමගින් කියවෙන්නේ අල්ලාහ් ඔහු තමා තමා සෑම අයුරකින්ම පරිපූර්ණයි, සෑම සත් ගුණාංගයකින්ම අංග සම්පූර්ණයි, එමෙන්ම ශ්‍රේෂ්ඨතත්වයෙන් උසස්ම ස්ථානය ඔහු සතුයි යනුවෙන්ය. ඉංග්‍රීසි භාෂාවෙන්ද රජවරු, පාලකයින්, ඉහල තනතුරු හොබවන්නන් තමන්ගේ නියෝගයන් සඳහන් වෙන විශේෂිත ලිපිවල තමන්ව (සර්ව නාමිකව) සඳහන් කරන විට "අපි" යනුවෙන් භාවිතා කරයි. කෙසේ නමුත් අල්ලාහ් තමන්ගේ ඒකීය භාවය ගැන සඳහන් කරනා ශුද්ධ වූ වැකි වල සර්ව නාම - ඒක වචනින් භාවිතා කරයි.

ප්‍රතිපත්ති සහ ගිවිසුම් සුරැකීම අනිවාර්ය කරන ඉස්ලාම් දහම වංචාවෙන් දුරස් විය යුතු බව දැඩි ලෙස අවධාරණය කරයි. එමෙන්ම විනිවිද භාවයෙන් යුතුව සතුරන් ඇතුළුව සෙසු මිනිසුන් සමග ඔවුන් කටයුතු කළ යුතු බවත් පවසයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 8:58 **නුඹලා සලාතය වෙනුවෙන් අඬගැසුවේ නම් ඔවුහු එය විහිළුවක් ලෙසද, සෙල්ලමක් ලෙසද අරගන්නෝය. නියතව මොවුන් අවබෝධ නොකරගත් කණ්ඩායමක්ව සිටීම මෙයට හේතුව වේ.**

ශුද්ධ වූ අල් කුර්ආන් 5:1 **විශ්වාස කලවුණි! ගිවිසුම් පූර්ණව ඉටු කරන්න. (පසුව) නුඹලාට කියවා පෙන්වනු ලබන දෑද, නුඹලා ඉහ්රාම් (ඇඳුම) ඇඳ සිටින විට, දඩයම් කරන දෑද හැර අනෙක් සතුන් නුඹලාට (අනුභව කිරීමට) අනුමත කර ඇත. නියතව අල්ලාහ් ප්‍රිය කරන දෑ නීතිය බවට පත් කරයි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 16:91 **තවද, නුඹලා ගිවිසුම් ඇති කරගත්තේ නම්, අල්ලාහ්ගේ ගිවිසුම් පූර්ණව ඉටු කරන්න. නුඹලා දිවුරුම් තහවුරු කළ පසු ඒවා නොකැඩිය යුතුය. නියතව නුඹලා නුඹලා(ගේ දිවුරුම් වලා)ට අල්ලාහ්වම වගකිවයුත්තා ලෙස කර**

**ඇත්තෙනුය. නියතව අල්ලාහ් නුඹලා කරන දේ ගැන හොඳින් දනියි.**

ඉස්ලාම් දහම ජීවිතය අගයයි. සමගියෙන් සමාදානයෙන් ජීවත්වෙන සිවිල් වැසියන් යුදමය අවස්ථාවන් වලදී වූවද ඝාතනය කිරීම අනුමත නොකරයි. එමෙන්ම දේපොළ, මෙන්ම කුඩා දරුවන් කාන්තාවන් සුරක්ෂිත කිරීම පිලිබඳ අවධාරණය කරයි. එමෙන්ම (යුධමය තත්වයකදී) ඝාතනයට ලක් වූවන්ගේ ශරීර විකෘති කිරීම මෙන්ම එම දේහයන් අයුතු ලෙස ප්‍රදර්ශන කිරීම කිසිසේත්ම ඉස්ලාමයේ මඟපෙන්වීම් අතර නොමැත.

ශුද්ධ වූ අල් කුර්ආන් 2:190 **කවරහු නුඹලා සමඟ සටන් කරත්ද ඔවුන් සමඟ නුඹලාද අල්ලාහ්ගේ මඟෙහි සටන් කරන්න. සීමාව නොඉක්මවන්න. නියතව අල්ලාහ් සීමාව ඉක්මවන්නන්ව ප්‍රිය නොකරන්නේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 60:8-9

8. **කවරහු ආගම් (විෂයෙ)හි නුඹලා සමඟ සටන් නොකළෝද ඔවුනටද, තවද, නුඹලාව නුඹලාගේ නිවෙස්වලින් පිට නොකළෝද ඔවුනටද නුඹලා**

**යහපත් දේ කිරීමද ඔවුන් සමඟ නුඹලා යුක්තිසහගතව ක්‍රියා කිරීමද අල්ලාහ් නුඹලාට වැළැක්වූයේ නැත. නියතව අල්ලාහ් යුක්තිසහගතව ක්‍රියා කරන්නන්ට ස්නේහ කරයි.**

9. **කවරහු ආගම් (විෂයෙ)හි නුඹලා සමඟ සටන් කර නුඹලාව නුඹලාගේ නිවෙස්වලින් පිට කළෝද ඔවුන්වද තවද, කවරහු නුඹලාව පිට කිරීමට උදව් කළෝද ඔවුන්වද ස්නේහයට අයත් වූවන් ලෙස අරගැනීම අල්ලාහ් නුඹලාට වලක්වයි. කවරහු ඔවුන්ව ස්නේහවන්තයින් ලෙස අරගනිත්ද ඔවුන්ම අපරාධකාරයින්ය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 5:32 **මේ හේතුකොට, 'නියතව කවරෙක් ඝාතනය කිරීම නිසා හෝ පොළොවෙහි කලහ ඇති කල හේතුව නිසා හෝ හැර තව කෙනෙකු ඝාතනය කරයිද ඔහු මුළු මිනිස් සමූහයම ඝාතනය කළ කෙනා හා සේ වන්නේය'යිද, කවරෙක් එය ජීවත් කරවයිද ඔහු මුළු මිනිසුන් සියල්ලන්වම ජීවත් කරවූ කෙනා වන්නේය'යිද ඉස්රාඊල්ගේ දරුවන්ට අප නියම කළෙමු. නියතව ඔවුන් වෙතට අපගේ දූතයින් පැහැදිලි සාක්ෂීන් ගෙන ආහ. පසුව නියතව ඔවුන්ගෙන් වැඩි දෙනා මෙයට පසුද පොළොවෙහි සීමාව කඩකරන්නන් ලෙසම සිටිති.**

මිනිස් හැසිරීමෙහි සෑම අංගයක් පිළිබඳවම ඉස්ලාම් දහම ආචාර නීති පනවා, ශක්තිමත්

සමාජයක් සඳහා අඩිතාලම දමමින්, දැවැන්ත සංස්කෘතියක් ගොඩනගා තිබේ. ඉතිහාස පුරාවටම අධ්‍යාපනය සඳහා අඩිතාලම දමා, චින්තනයේ නිදහස ලබා දී ඇත. එමෙන්ම ඉස්ලාම් දහමෙහි බිම්මහල යුක්තිය සාධාරණත්වය නිදහසට කරුණු පිළිගැනීම, මානව මූලධර්මයන්වලට ගරු කිරීම යනාදිය මත, මෙන්ම සාර්ථකත්වයන් කරා යන ගමන වෙත මුස්ලිම් නොවන ජනයාටද එකට එක්වන ලෙස දිරිගන්වයි. ඉහත සියල්ලක්ම විවිධ ජාතිකයන් සහ ජාතින්ගෙන් සහයෝගය මත අති දැවැන්ත සංස්කෘතියක් ගොඩනැගීම සඳහා හේතු සාධක වී ඇත. (5)

නියත වශයෙන් ඉස්ලාම් දහම සමාජයන් අතර විරසක ඇතිකරවන, සාමකාමී ලෙස ජීවත් වෙන සිවිල් වැසියන් බියගන්වන, භීතියට පත්කවරන නවීන පන්නයේ ත්‍රස්ත චින්තන සිතුවිලි පිළිකුල් කරයි. එමෙන්ම තුවාල වූ පුද්ගලයන්, සිරකරුවන්, කාන්තාවන් සහ කුඩා දරුවන්, ඝාතනය කිරීමද පිළිකුල් කරයි. ඒ අතර අන් සතු

දේපොළ විනාශ කිරීම, ඒ අතර තම (දුෂ්ඨ) සිතුවිලි සාක්‍ෂාත් කර ගැනීම පිණිස සදාචාර විරෝධී මාධ්‍යයන් භාවිතා කිරීමද වන්නේය. ((මාධ්‍යයෙහි සියල්ල සාධාරණීකරණය කිරීම ඉස්ලාමීය සංකල්පයක් නොවේ)).

-----------------------------------------------------

(5) ඉස්ලාමීය සංස්කෘතිය සිතීමේ සහ චින්තනයේ නිදහස තහවුරු කිරීම තුලින් ජයග්‍රහණය හිමිකරගෙන ඇත. විවිධ වූ ජාතීන් හා ජාතිකයන් එක්ව ලෝක සංස්කෘතියක් බිහි කිරීමේදී තම දායකත්වය ඉස්ලාම් දහමත් එකට එක්ව සැපයුවා නොවේ නමුත් ඉස්ලාම් දහම වගකිවයුතු තැන හිඳ (ලොව වටිනාම සංස්කෘතියක් බිහි කළේය.) බුද්ධිමය හා සංස්කෘතික ජීවිතයේ සංවර්ධනය උදෙසා විශිෂ්ට කාර්යභාරයක් සිදු කර කළේය. ඊට පෙර එවන් උත්සහයක් සිදු නොකළ තරම් මහා පරිමාණයෙන් එය සිදු විය. අවුරුදු අටසීයක් පමණ ලොව සිතුවිලි චින්තනයන් අතර දෝලනය වන සහ දැනුම බෙදාහරින, ජාත්‍යන්තර භාෂාව බවට පත්ව තිබුනේද අරාබි භාෂාවයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 6:151 **නුඹලාගේ 'රබ්' නුඹලාට වලක්වා ඇති දේ නුඹලාට මම කියවා පෙන්වමි. පැමිණෙන්න! යැයි (නබි!) නුඹ පවසන්න. නුඹලා ඔහුට කිසිවක් සම නොකරන්න. දෙමාපියන් සමඟ හොඳාකාරව ක්‍රියා කරන්න. දුප්පත්කමට (බිය වී) නුඹලාගේ දරුවන්ව ඝාතනය නොකරන්න. (මක්නිසාද යත්) අපිම නුඹලාටද ඔවුන්ටද ආහාර ලබා දෙමු. තවද, නින්දා සහගත ක්‍රියාවන්හි ප්‍රසිද්ධ දේටද රහසිගත දේටද සමීප නොවන්න. අල්ලාහ් වැලැක්වූ කුමණ ජීවයක් වූවද අයිතියක් නොමැතිව ඝාතනය නොකරන්න. නුඹලා අවබෝධ කරගැනීම පිණිස අල්ලාහ් මේවා මඟින් නුඹලාට අණ කරයි.**

ඉස්ලාම් දහම සදාචාර සම්පන්න ගතිගුණ සුරැකීම සඳහා දැඩි විධි විධාන පනවා, ව්‍යාකූල නොවන මාවතක් තුලින් ආත්මාර්ථකාමීත්වයෙන්, තණ්හාවෙන් සහ වෛරයෙන් මෙන්ම අපරාධ කීරීම වෙත, පීඩා ගෙන දීම වෙත, විනයගරුක නොවීම වෙත මඟ පෙන්වන කරුණු වලින් මිදී ආත්ම පවිත්‍රතාවයෙන් යුතුව ජීවත් වීම සඳහා මඟ පෙන්වයි. එමෙන්ම, සෙසු අය හා කටයුතු කිරීමේදී මෘදුවන්, සුහදශීලී, ගෞරවණීය ලෙස, කරුණාවන්ත ලෙස, සහ සාමය යන සියල්ල සෑම ජීවයෙකු අතරම සෑම අවස්ථාවකම පතන කෙනෙකු වීම සඳහා ආරාධනා කරයි.

ඉවසීමේ ගුණාංගය, බුද්ධිමත් ලෙස කටයුතු කිරීමේ ස්වභාවය මෙන්ම වැඩි වැඩියෙන් සමාව ලබා දෙන්නෙකු ලෙස කටයුතු කරන කෙනෙකු ලෙස පත් වීම වෙත දිරි ගන්වයි. ඉහත කරුණු සියල්ල පිළිබඳ ඉදිරියට අපි පැහැදිලි කිරීමට අපේක්ෂා කරමු.

නියතව ඉස්ලාම් දහම තම නිර්මාතෘව නිසි ලෙස හඳුනා ගෙන කටයුතු කරන, අල්ලාහ් පිළිබඳ දැඩි ලෙස සවිඥානික වෙන, (අල්ලාහ් පිළිබඳ) බිය බැතිය රැකගැනීම සඳහා දැඩි ලෙස කැපවෙමින් යහකම් වල නිරතවෙන, පාපී මෙන්ම නිෂ්පල ක්‍රියාවන් වල නිරත නොවී සිට කටයුතු කරන පුද්ගලයන් බිහිකරයි. එමඟින් මිහිමත ඒකීය දෙවිඳුන්ගේ (නීති හා රීතින් නිසිලෙස අනුගමනය කරන) නියෝජිතයෙකු බවට පත් වෙන අතර, මේ මහ පොලොව (සශ්‍රික භූමියක් බවට පත් කර) නඟා සිටුවීමටද එකී පුද්ගලයින් කටයුතු කරයි. එමඟින් එහි ජීවත්වෙන ජනයා හට සෙත සැලසීමටද හැකි වනු ඇත.

## 02. ජනමාධ්‍ය මගින් සිදුකරනු ලබන ඍෘණාත්මක ප්‍රචාරණ හමුවේ වුවද ඉස්ලාම් දහම ව්‍යාප්ත වන්නේ ඇයි?

නබි (ධර්ම ශාස්තෘ) හට අල් කුර්ආනය පහළවූ දා සිට, එතුමා මෙන්ම එතුමාගේ අනුගාමිකයන් විවිධාකාර පීඩාවන් වලට මුහුණ දුන්හ. එම තාඩණ පීඩන ආදිය දේව වැකි පහළවෙමින් පැවති අවස්ථාවන්හි පවා සිදු විය. ඉස්ලාම් දහමෙහි ප්‍රතිරූපය විකෘති කරවන ආකාරයේ උත්සාහයන් ඉදිරියේ ඒ සියල්ලක්ම අභිබවා එය දිගටම පැතිරීය, ව්‍යාප්ත විය, සතුරන් විමතියට පත්කරවන ආකාරයට බොහෝ අනුගාමිකයන් එයට එකතු විය. ඔවුන් අල්කුර්ආනය හුනියමකි, ධර්ම ශාස්තෘව හුනියම් කරුවෙකි. යනුවෙන් අපහාසාත්මක ලෙස වර්ණනා කළෝය. ඔවුන්ගේ එම උඩඟුකම නිසා සත්‍ය හඳුනා ගැනීමට පවා නොහැකි ලෙස ඔවුන්ගේ හදවත් අන්ධ වී ඇති බව අවබෝධ කරගැනීමට ඔවුන්ට නොහැකි විය. ඔවුන්ගේ එම උඩඟුකම සත්‍ය අවබෝධ කරගැනීමට

හරස් වූ තිරයක් විය. ඉස්ලාමය වෙත පැමිණෙන්න යන ආරාධනාව හි ප්‍රධානතම හේතුව ලෝවැසියන්ගේ අපේක්ෂාව බවට පත්වෙයි යයි ඔවුන්ගේ විචාරශීලී බුද්ධියෙන් අවබෝධ කරගත නොහැකි විය. මක් නිසාදයත් ඉස්ලාමයේ ආරාධනාව වූයේ සත්‍ය වෙත, යුක්තිය ස්ථාපිත කිරීම වෙත, තර්කානුකූලව බුද්ධිය උපයෝගී කිරීම වෙතය. එමෙන්ම මිත්‍යා දෘෂ්ඨියෙන්, සහ මිනිසාව සදාචාරය සංසකෘතිය මැයෙන් මිදිය නොහැකි ආකාරයට එහි ගැත්තෙකු බවට පත්කරවන චින්තනයන්ගෙන් ගැලවීමට ඉස්ලාම් ධර්මය මගපෙන්විය. කාන්තාවන් ඇතුළුව සෑම වර්ගයකම, වර්ණ භේද නොතකා සියල්ලන්ගේම අයිතිවාසිකම් ආරක්ෂා කරන්නක් විය. ඒ සෑම වර්ගයකම ස්වාධීනත්වය මෙන්ම ගරුත්වය සුරකින්නක් විය. අප එහි සමහර මහඟුභාවයන් පිළිබඳ විස්තර ඉදිරියට ගෙන එමු.

## 1. මැවුම්කරුගේ ඒකීය භාවය පිළිබඳ වූ සංකල්පය ඉස්ලාම් දහම සුරක්ෂිත කරයි.

ඉස්ලාමය තුළ දේවත්වය පිළිබඳ වූ සංකල්පය ඉතාමත් සරල මෙන්ම ස්වභාවික ලෙස මත පිහිටුවා පැහැදිලි කරනු ලබයි. එමෙන්ම හුදු දාර්ශනික මතයන්ගෙන් මෙන්ම සංකීර්ණත්වයෙන් තොර වූ එය පැහැදිළි සංකල්පයකි. ලොකු කුඩා, උගත් නුගත් සෑම කෙනෙකුටම පහසුවෙන් තේරුම් ගත හැකිය. එය නම්; සියල්ලෙහිම මැවුම්කරු, සකල ආධිපත්‍යයම හිමි පාලකයා, සකල ලොවෙහිම නිර්මාතෘ වන්නේ ඒකීය දෙවියෙකුය. ඔහු මෙන් කිසිවෙකු නොමැත. (නිර්මාණයන්ගෙන් කිසිවක් ඔහුට සමාන නැත), ඔහුට සගයන් නොමැත, ඔහුට දරුවන් නොමැත, ඔහුට සහකාරියෙකුද නොමැත. වත්පිළිවෙත් ඔහු වෙනුවෙන් පිවිතුරු ලෙස ඉටු කළ යුතු වන අතර කිසිම අතරමැදියෙකු සහ සම්බන්ධ නොකොට සෘජුවම ඔහුට පුද කළ යුතුයි.

ශුද්ධ වූ අල් කුර්ආන් : පරිච්ඡේදය 112 (අල් ඉක්ලාස්)
අසීමිත කරුණාවන්තයාවූද අසම දයාවන්තයාවූද අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි.)

1. **අල්ලාහ් එක්කෙනෙකුමයැ යි (නබි) නුඹ පවසන්න!**

2. **අල්ලාහ් (කිසිම) අවශ්‍යතාවයක් නොමැත්තාය.**

3. **ඔහු (කිසිවෙකුව) ප්‍රසූත කළේද නැත. ඔහු (කිසිවෙකුගෙන්) ප්‍රසූත වූයේද නැත.**

4. **තවද, ඔහුට සමානව කිසිවෙකුද නොමැත.**

ශුද්ධ වූ අල් කුර්ආන් 2:255 **(සත්‍ය ලෙසම) නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර වෙන කිසිවෙකු නැත. ඔහු නිත්‍ය ජීවමානය සදාකාලිකය. මද නින්ද හෝ තද නින්ද ඔහුට නොඅල්වන්නේය. අහස්හි ඇති දේද පොළොවෙහි ඇති දේද ඔහුටම හිමිය. ඔහුගේ අනුමැතිය නොමැතිව ඔහු හමුවෙහි කවරෙකුට මැදිහත් විය හැකිද? (මැවුම් වන) ඔවුනට පෙර ඇති දේ ද ඔවුන්ට පසු ඇති දේද ඔහු හොඳින් දනියි. ඔහු සිතූ දේ හැර, ඔහු දැන සිටින දෙයින් කිසිවක් ඔවුන් විසින් දැනගත නොහැක. ඔහුගේ 'කුර්සි' අහස්හිද පොළොවෙහිද ව්‍යාප්තව පවතියි. ඒ දෙකම ආරක්ෂා කිරීම ඔහුට අපහසුවක් නොවේ. ඔහුට වඩාත් උතුම් කෙනාද මහඟු බව ඇත්තාද වේ.**

## 2. විනාශ වීම, වැඩි කිරීම හෝ අඩුකිරීමෙන් පාරිශුද්ධ වූ අල් - කුර්ආනය ඉස්ලාම් දහම සුරක්ෂිත කරයි.

නියත වශයෙන්ම ශුද්ධ වූ අල් කුර්ආනයේ පරිපූර්ණ වැකි ජිබ්රීල් අලෛහිස් සලාම් තුමා මාර්ගයෙන් නබි මුහම්මද් (සල්) තුමා හට එය පහල කරනු ලැබුවා සේම අදටත් සුරක්ෂිතව තිබේ. කිසිදු වෙනස් කිරීමක්, විකෘති කිරීමකින් තොරව තවමත් එය එහි මුල් භාෂාවෙන්ම තිබේ. සකල ලොව පරිපාලකයාගේ පොරොන්දුව පරිදි එලෙසින්ම එය දිගටම රැඳෙනු ඇත. (ශුද්ධ වූ අල් කුර්ආනය වන) එය කිසිවෙකුටත් රහස්‍ය දෙයක් හෝ වසන්කරනු ලැබූ දෙයක් නොවන අතර එය ජනයා අතර අදටත් පරිශීලනයේ පවතින ග්‍රන්ථයකි. එහි පිටපතක් ලබාගෙන එහි කරුණු කියවීම යනු ඕනෑම කෙනෙකුට කළ හැකි දෙයකි.

ශුද්ධ වූ අල් කුර්ආන් 15:9 **නියතව අපිම මෙම පුස්තකය පහළ කර ඇත්තෙමු. තවද නියතව අපිම එය ආරක්ෂා කරන්නන් වෙමු.**

## 3. ඉස්ලාම් ධර්මය ඉපැරණි ධර්ම ග්‍රන්ථ හා ගිවිසුම් තහවුරු කරයි, ධර්ම ශාස්තෘවරුන් හට ගරු කල යුතු බව පවසයි.

ඉස්ලාමයේ තිබෙන සුවිශේෂී භාවය නම් පෙර පහල කරන ලද දිව්‍යම පුස්තක, ග්‍රන්ථ, සහ ගිවිසුම් සත්‍ය බව තහවුරු කිරීම වේ. එය පමණක් නොව, පෙර සමාජයන් වෙත පහල කරනු ලැබූ ධර්ම ශාස්තෘවරුන් මෙන්ම පුස්තක විශ්වාස කිරීම යනු ඉස්ලාමිය ප්‍රතිපත්තියේ විශ්වාස කල යුතු අංගයන් අතරින් ප්‍රධාන අංගයන් වේ. සෑම ධර්ම ශාස්තෘවරයෙකු හටම ගරු කරන අතර, ඔවුන් තුල සකල ලොව පරිපාලක පිලිබඳ පවතින පිවිතුරු භාවය සහ ඒකීය වූ දූත මෙහෙවර මත ඔවුන් අපවාද, අවලාද වලින් මෙන්ම අඩුපාඩු වලින් නිර්දෝෂීන් යනුවෙන් (ඉස්ලාම් දහම) පවසයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 2:136 **අල්ලාහ්වද, අපට පහළ කළ දෙයද, ඉබ්‍රාහීම් ඉස්මාඊල්, ඉස්හාක්, යාකූබ් ආදීන්ටද (මොහුගේ) පෙළපත්වලට පහළ කළ දේද, මූසාටද ඊසාටද (හා අනෙකුත්) නබිවරුන්ටද ඔවුන්ගේ 'රබ්'ගෙන් පිරිනැමූ දේද විශ්වාස කළෙමු. ඔවුන්ගෙන් කවුරුන් අතර හෝ අපි වෙනස්කම් නොපෙන්වන්නෙමු. අප ඔහුටම මුළුමනින්ම යටත්වූවන් (මුස්ලිම්වරුන්) යැයි නුඹලා පවසන්න.**

## 4. ඉස්ලාම් දහම විශ්වාසයේ නිදහස් බව තහවුරු කරයි, එමෙන්ම සෙසු දහම් හා ඇදහිලි පිළිබඳ විශ්වාසවන්තයින් හුදෙක් සුහදශීලී සංවාදයන් සඳහා ආරාධනා කරයි.

ධර්ම ග්‍රන්ථ ලද අයවලුන් වන යුදෙව් සහ ක්‍රිස්තියානි අනුගාමිකයන් සමඟ සංවාද, මෙන්ම විවාදයන් සඳහා දොරටු විවෘත බව ශුද්ධ වූ අල් කුර්ආනයේ විවිධ ස්ථානයන්හි සඳහන්ව ඇත. ඉස්ලාම් දහම සිතුවිලිවල නිදහස් භාවය, ඉවසිලිවන්ත වීම මත සහ යහපත් විලසින් ධර්ම ග්‍රන්ථ ලද අයවලුන් හා විවාද කිරීම මත ගොඩනැගී තිබේ. ශුද්ධ වූ අල් කුර්ආනය අවසන් ධර්ම ග්‍රන්ථය ලෙසත්, ඉස්ලාම් දහම ලොව අවසන් දහම ලෙසත්, මුහම්මද් නබි තුමන් අවසන් ධර්ම ශාස්තෘ ලෙසත් සිටින බැවින් දහමක් ලෙස එයට පෙර පහළ වූ දහම් වල අනුගාමිකයන් සමඟ අලංකාර ලෙස සංවාදයන් වල නිරත සඳහා දොරටු විවෘත කරයි. නමුත් කෙනෙකුට තමන්ගේ අභිමතය පරිදි තමන් කැමති

දෙයක් විශ්වාස කිරීමේ නිදහස ඉස්ලාම් දහම තහවුරු කරයි. (දහම තුල කිසිදු බල කිරීමක් නොමැත) ශුද්ධ වූ අල් කුර්ආනයේ 2 වන පරිච්ඡේදයේ 256 වන වැකිය. එම නිසා සෙසු ඕනෑම කෙනෙකුගේ ගරුත්වයට පාත්‍රවන දෙයක් පිටුපා සොහාදහමට අයත් වූ මෙම දහම වෙත බල කරනු නොලබයි. එමෙන්ම ඉස්ලාම් දහම සෙසු අය හා ඇතිකරගන්නා ගිවිසුම් කොන්දේසි ගරු කොට සලකන අතර (තමා ගිවිසුම් ගත වූ) ඔවුන් මුස්ලිම් නොවන අය වූවත් (ඔවුන් හා ඇති කරගත්) එකඟතාවයන් සුරැකිය යුතුයි. ඒවා කඩ නොකළ යුතුයි යැයි පවසයි. එමෙන්ම (ඉස්ලාම් දහම මෙලෙස) ඔවුනොවුන් අතර ඇති කරගන්නා කොන්දේසි කඩ කරන පුද්ගලයන් සමඟ සබඳතා පැවැත්විය නොයුතු බව මුස්ලිම්වරුන් වලක්වනු ලැබී ඇත.

ශුද්ධ වූ අල් කුර්ආන් 4:105 – 107

**(105). (ඕ:නබි!) නුඹට අල්ලාහ් පෙන්වා දුන් පරිදි නුඹ මිනිසුන් අතර විනිශ්චය දීම පිණිස නියතව අපි නුඹට මෙම පුස්තකය සත්‍යයෙන් යුතුව පහළ කර**

**ඇත්තෙමු. නුඹ වංචා කරන්නන් වෙනුවෙන් තර්ක කරන්නෙකු නොවිය යුතුයි. (106). තවද, නුඹ අල්ලාහ්ගෙන් සමාව අයදින්න! නියතව අල්ලාහ් අධිකව සමා කරන්නා ලෙසද, අසමසම දයා වන්තයා ලෙසද සිටියි. (107). (අන් අයට විපත් ඇති කිරීම මගින්) තමන්ට වංචා කරගත්තවුන් වෙනුවෙන් නුඹ වාද නොකළ යුතුය. නියතව අල්ලාහ් මහා වංචනික වරදකරුවාව ප්‍රිය නොකරන්නේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 60:8 **කවරහු ආගම් (විෂයෙ)හි නුඹලා සමග සටන් නොකළෝද ඔවුනටද, තවද, නුඹලාව නුඹලාගේ නිවෙස්වලින් පිට නොකළෝද ඔවුනටද නුඹලා යහපත් දේ කිරීමද ඔවුන් සමග නුඹලා යුක්තිසහගතව ක්‍රියා කිරීමද අල්ලාහ් නුඹලාට වැළැක්වූයේ නැත. නියතව අල්ලාහ් යුක්තිසහගතව ක්‍රියා කරන්නන්ට ස්නේහ කරයි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 5:57 **විශ්වාස කළවුනි! නුඹලාට පෙර පුස්තක දෙනු ලැබූවන්ගෙන්, නුඹලාගේ ආගම විහිළුවක් ලෙසද, සෙල්ලමක් ලෙසද අරගත්තවුන්වද තවද ප්‍රතික්ෂේප කරන්නන්වද මිතුරන් ලෙස නුඹලා නොඅරගන්න. නුඹලා විශ්වාසවන්තයින් නම් අල්ලාහ්ටම බියවන්න.**

පාරිශුද්ධ වූ අල් කුර්ආනයේ අනේක ස්ථානයන් වල මුස්ලිම්වරුන් ඝාතනය කරන සහ ඔවුන්ව තම නිවෙස්වලින් පලවා හරින

අයත් සමඟ ස්නේහකම් නොපවත්වන මෙන් වූ අණකිරීම් ඍජු විවෘත මෙන්ම පැහැදිලිය.

ශුද්ධ වූ අල් කුර්ආන් 60:9 **කවරහු ආගම් (විෂයෙ)හි නුඹලා සමඟ සටන් කර නුඹලාව නුඹලාගේ නිවෙස්වලින් පිට කළෝද ඔවුන්වද තවද, කවරහු නුඹලාව පිට කිරීමට උදව් කළෝද ඔවුන්වද ස්නේහයට අයත් වූවන් ලෙස අරගැනීම අල්ලාහ් නුඹලාට වළක්වයි. කවරහු ඔවුන්ව ස්නේහවන්තයින් ලෙස අරගනිත්ද ඔවුන්ම අපරාධකාරයින්ය.**

ඒ අතර යුදෙව්වන් සහ ක්‍රිස්තියානි (දහමෙහි අනුගාමිකයන්) සියල්ලන්ම මුස්ලිම්වරුන්ගේ සතුරන් නොවන බවද ශුද්ධ වූ අල් කුර්ආනය පවසයි. ඔවුන් අතරින් යහපත ගෙන සෙසු අයට අණ කරමින් අයහපතෙන් වළක්වාලන අයවලුන් සිටින බව අල් කුර්ආනය පවසයි. යහපත වෙනුවෙන් යුහුසුලුවෙන නිවැරදි ප්‍රතිපත්තිය මත හිඳ කටයුතු කරන ඔවුන්ගේ යහකම් සඳහා වූ කුලිය කිසිම විටක අල්ලාහ් නාස්ති නොකරයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 3:113-114

113. **ඔවුන් (සියලු දෙනාම) සමාන වූවන් නොවේ. පුස්තකය ඇත්තන් ගෙන් (සත්‍යයෙහි) නොසැලී සිටින පිරිසක්ද සිටිති. ඔවුහු අල්ලාහ්ගේ වැකි රාත්‍රී කාලයන්හි කියවා, සිරස පහත් (සුජූද්) කරති.**

114. **ඔවුහු අල්ලාහ්වද, අන්තිම දිනයද විශ්වාස කරති. තවද, යහකම් අණ කර, අයහකම් කෙරෙන් වලක්වා, යහපත් කාර්යයන් කිරීමෙහිද ඉක්මන් වෙති. ඔවුහු යහපත් අයගෙන් සිටින්නන් වෙති.**

ශුද්ධ වූ අල් කුර්ආන් 3:199 **නියතව පුස්තකය ඇත්තන්ගෙන්, අල්ලහ්වද, නුඹලාට පහළ කළ දෙයද, තමන්ට පහළ කරනු ලැබූ දෙයද, අල්ලාහ්ට බිය වූවන් ලෙස විශ්වාස කරන්නෝද සිටිති. ඔවුහු අල්ලාහ්ගේ වැකි අල්ප වටිනාකමකට නොවිකුණන්නෝය. මෙවැන්නන්ට අයත් කුලිය ඔවුන්ගේ 'රබ්' හමුවෙහි ඔවුනට ඇත. නියතව අල්ලාහ් විභාග කිරීමෙහි තීව්‍රවන්තයාය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 2:62 **නියතව විශ්වාස කළවුන්, යුදෙව්වන් කිතුනුවන් හා සාබියීන්වරුන් (ආදීන්ගෙන්) කවරහු අල්ලාහ්වද අන්තිම දිනයද විශ්වාස කර, යහකම් කළෝද ඔවුන්ගේ 'රබ්'ගෙන් ඔවුන්ට නියමිත කුලිය ඇත. ඔවුන්ට කිසිදු බියක්ද නැත, ඔවුහු දුක්ද නොවන්නෝය.**

## 5. හුදු තර්කය විතර්ක පරදවා විචාරශීලී ලෙස සහ සවිඥානික ලෙස මෙම විශ්වය අධ්‍යනය කරන මෙන් ඉස්ලාම් දහම ආරාධනා කරයි.

අන්ධ විශ්වාසය කිසිසේත් ඉස්ලාම් දහම අනුමත කරන්නේ හෝ ඒ වෙත ආරාධනා කරන්නේ නැත. එනමුත් සියලුම මනුස්සයින්ව අල්ලාහ්ගේ වැකීන් (ශුද්ධ වූ වාක්‍යයන්) පිළිබඳ අධ්‍යන කරන ලෙසත් (අල්ලාහ්ගේ) විචිත්‍ර නිර්මාණයන් ගැන සිතා බලන ලෙසත් ආරාධනා කරයි. මේ මිහිතල මත ගමන් කරන මෙන්ද විශ්වය පිළිබඳ ගවේෂණාත්මක ලෙස බලනමෙන් හා (ඒ සියල්ල පිළිබඳ නිසියාකාරව හඳුනා ගැනීම පිණිස) මනස උපයෝගී කරන මෙන් පවසයි, චින්තන සහ තර්කනයන් තුළින් (උක්ත කරුණු කාරනා) සාක්ෂාත් කර ගන්නා ලෙස පවසයි. එය පමණක් නොව එක් වතාවකට වඩා ගවේෂණාත්මක ලෙස එහි අභ්‍යන්තරය මෙන්ම ඇතුලාන්තය දෙස නැවත නැවත බලන මෙන්ද පවසයි. එවිට

(එම උත්සාහයන් වල ප්‍රතිඵලය) අනිවාර්යයෙන්ම ඔහුට ලැබෙනු ඇත. - නිසැකවම - නිර්මාණකරුවෙකු සිටිය යුතු බව ඔහුගේ හදවත තහවුරු කරයි. මෙම විශ්වය අරමුණකින්, උවමනාවෙන් මෙන්ම යම් කිසි අරමුණක් වෙත වූ ගමන පහසු කිරීම සඳහා ඇති කරන ලද්දක් යන පූර්ණ සහ දැඩි විශ්වාසය වෙත ඔහු ලඟා වෙනු ඇත. එමෙන්ම ඔහු අවසාන වශයෙන් ඉස්ලාම් දහමේ ආරාධනාව වෙත ලඟා වී සිටිනු දැකගනී, එය නමින් "ඒකීය දෙවිඳුන් හැර අන් කිසිම දෙවියෙකු නොමැත - ලා ඉලාහ ඉල්ලල්ලාහ්" වේ. (ඉස්ලාමයේ මූලික සංකල්පයයි එය)

ශුද්ධ වූ අල් කුර්ආන් 67:3-4

**3. ඔහුම අහස් හතම තට්ටු වශයෙන් මැව්වේය. නුඹ අර්රහ්මාන්ගේ මැවීමෙහි කිසිම දෝෂයක් නොදකින්නෙහිය. නැවත (වතාවක්) බැල්ම හරවන්න! (එහි) යම් පැලීමක් දකිහිද?**

4 **පසුව දෙවතාවක් බැල්ම හරවන්න! බැල්ම උදාසීනත්වයට පත්වී, පහත් තත්වයට වූවක් ලෙස නුඹ දෙසට හැරෙන්නේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 41:53 **නියතව මෙය සත්‍යය යන්න ඔවුනට පැහැදිලි වන තෙක් (ලොවේ) විවිධ පැතිවල හා ඔවුන් අතරද අපි අපගේ සාක්ෂීන්ව ඔවුනට පෙන්වන්නෙමු. නියතව නුඹගේ 'රබ්' සියල්ල බලාගෙන සිටියි යන්න ඔහුගේ විෂයෙහි ප්‍රමාණවත් නොවේද?**

ශුද්ධ වූ අල් කුර්ආන් 2:164 **අහස් හා පොළොව මවා තිබීමෙහිද, රැය හා දවාල මාරුවෙන් මාරුවට පැමිණීමෙහිද, මිනිසුන්ට ප්‍රයෝජනවත් දෑ මුහුදෙහි ගෙන යන නැව්හිද, අහසින් වර්ෂාව අල්ලාහ් පහළ කර, පොළොව මළ පසු එමගින් ඔහු එය ප්‍රාණවත් කිරීමෙහිද, ඔහු සියලු වර්ගයේ ජීවීන් එහි ව්‍යාප්ත කර තිබීමෙහිද, සුළං කැරකීමට සැලැස්වීමෙහිද, අහස් පොළොව අතර වසඟ කරනු ලැබ ඇති වලාකුලෙහිද, අවබෝධ කරගන්නා සමාජයට නියතව බොහෝ සාක්ෂි ඇත.**

ශුද්ධ වූ අල් කුර්ආන් 16:12 **ඔහුම රාත්‍රියද, දවාලද, සූර්යයාවද, චන්ද්‍රයාවද නුඹලාට වසඟ කර දුන්නේය. තාරකාවන්ද ඔහුගේ අණට වසඟ කරනු ලැබූ ඒවාය. නියතව මෙහි අවබෝධ කරගන්නා සමූහයාට බොහෝ සාක්ෂින් ඇත.**

ශුද්ධ වූ අල් කුර්ආන් 51:47 **අපිම අහස ශක්තියෙන් අධිකවූවක් ලෙස සැකසුවෙමු. තවද, නියතව අප ව්‍යාප්ත කිරීමේ හැකියාව ඇත්තාන්ය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 23:18-19

18. **අපිම අහසින් වැස්ස (නියමිත) ප්‍රමාණයකින් පහල කර, එය පොළොවෙහි තැන්පත් කර තැබුවෙමු. නියතව එය අපි නැති කර දැමීමටද හැකියාව ඇත්තන්ය.**

19. **තවද, එමගින් නුඹලාට ඉඳි හා මිදි වතු නිර්මාණය කළෙමු. ඒවායෙහි නුඹලාට අධිකව පලතුරු ඇත්තේය. නුඹලා ඒවායින් අනුභව කරහුය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 39:21 **නියතව අල්ලාහ් අහසින් වර්ෂාව පහළ කර, එය උල්පත් ලෙස පොළොවෙහි ගැලීමට සලස්වා තිබීමද, පසුව එමඟින් නොයෙක් වර්ණවලින් යුත් බෝග පිටකිරීමද නුඹ නොබැලුවෙහිද? පසුව ඒවා වියලී, කහ වර්ණයට පත්වීම නුඹ දකිහිය. පසුව ඔහුම ඒවා කොළ රොඩු බවට පත් කරයි. නියතව මෙහි බුද්ධිය ඇත්තන්ට උපදේශය ඇත්තේය.** (6)

ශුද්ධ වූ අල් කුර්ආන් 21:30 **නියතව අහස් හා පොළොව සම්බන්ධ තිබුණි. අපිම එම දෙකම වෙන් කළෙමු යන්නද ජීවීන් එක් එක් දෙයම අපිම ජලයෙන් නිර්මාණය කළෙමු යන්නද ප්‍රතික්ෂේප කළවුන් නොදන්නෝද? ඔවුන් විශ්වාස කරන්න එපායැ?** (7)

ශුද්ධ වූ අල් කුර්ආන් 21:31 **තවද, පොළොව ඔවුන්ව පෙරලා නොදැමීම පිණිස, එහි අපි කඳු ඇතිකළෙමු. තවද, (තමන් කැමති ස්ථානවලට) සේන්දු වීම පිණිස එහි විශාල මාර්ගද අපි ඇති කළෙමු.** (8)

ශුද්ධ වූ අල් කුර්ආන් 23:12-14 (9)
12. **නියතව අපි (පළමු) මිනිසාව (කිරි) මැටි මූලයෙන් මැව්වෙමු.**

13. **පසුව අපි ඔහුව ආරක්ෂිත ස්ථානයක ශුක්‍රාණු බිංදුව ලෙස තැබුවෙමු.**

14. **පසුව ශුක්‍රාණු බිංදුව (ගර්භාෂයේ) ඇලී සිටීමට හැකි දෙයක් ලෙස මැව්වෙමු. පසුව, (ගර්භාෂයේ) ඇලී සිටීමට හැකි දෙය මස් පිඩක් කළෙමු. පසුව, මස් පිඬුව ඇට කටු බවට පත් කර, මසින් ඇටකටු ආවරණය කළෙමු. පසුව, ඔහුව වෙනත් මැවීමක් කළෙමු. මැවුම්කරුවන්ගෙන් වඩාත් ශ්‍රේෂ්ඨයා වූ අල්ලාහ් භාග්‍ය ඇත්තෙකු වූයේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 22:5 **මිනිසුනි! (මරණයට පත්වූ පසු) නැගිට්ටුවීමෙහි නුඹලා සැකයෙහි සිටින්නේ නම්, (දැනගන්න!) නියතව අපිම නුඹලාව පසින්ද, පසුව ශුක්‍රාණු බිංදුවෙන්ද, පසුව (ගර්භාෂ සිව්යෙහි) ඇලී සිටින දෙයින්ද, පසුව හැඩගස්වනු නොලැබූද වූ මස් පිණ්ඩෙන්ද මැව්වෙමු. නුඹලාට පැහැදිලි කිරීම පිණිසම(මෙසේ විස්තර කරමු.) අපි සිතන දේ ගර්භාෂයන්හි නියමිත කාලයක් වන තෙක් තැන්පත් කරමු. පසුව නුඹලාව බිලිදෙකු ලෙස පිට කරමු. නුඹලාගේ තරුණ බව නුඹලා ලබා ගැනීම පිණිස (ජීවන කාලය ඇති කළෙමු.) (තරුණ වියේදී) මරණයට පත්වන්නෝද නුඹලා අතර සිටිති. තවද, දැනගත් පසු කිසිවක් නොදන්නෙකු සේ විය හැකි**

**මහලු වයස දෙසට ගෙන යනු ලබන්නෝද නුඹලා අතර සිටිති. නුඹ පොලොව වියලුන එකක් ලෙස දකිහිය. අප එය මත වැස්ස පහළ කළේ නම් එය සශ්‍රිකව වර්ධනය වී, සියලු වර්ගයේ ලස්සන භෝග පැල කරයි. (10) - (11)**

---------------------------------------------------

6. නූතන විද්‍යාවේ සොයාගැනීමකට අනුව වූ ජල චක්‍රය පිළිබඳ මීට අවුරුදු 500 කට පෙරම ඒ පිළිබඳ වර්ණනා සිදුකොට තිබේ. ඉන් පෙර මනුස්සයින් විශ්වාස කළේ ජලය සාගර සහ භූගත උල්පත් මඟින් ලැබෙන බවයි, ඒ අනුවයි ජල චක්‍රය සෑදී තිබෙන්නේ යනුවෙන් ඔවුහු විශ්වාස කළෝය. එමෙන්ම, භූමියේ ඇති තෙතමනයෙහි ඝනකම වැඩිවෙන ජලය ඇති වූ බවයි. ඒ අතර පාරිශුද්ධ වූ අල් කුර්ආනය පැහැදිලි ලෙස ජලය හටගන්නා ආකාරය පිළිබඳ අවුරුදු 1400 කට පෙරම ඒ ගැන විස්තර කර තිබේ.

7. ජීවීන්ගේ ශරීරය තුල වැඩිපුරම තිබෙන්නේ ජලය බව නවීන විද්‍යාවට සොයාගෙන තිබේ. ජීවයෙකුගේ ශරීරයේ ප්‍රධාන සංඝටකය වන්නේ ජලයයි. නමුත් ධර්ම ශාස්තෘ මුහම්මද් (සල්) තුමන්ගේ කාලයේ දැනුමට ප්‍රත්‍යක්ෂ වූ කාරණාවක් නොවීය. එමෙන්ම ශාක අතර පවතින සමතුලිත භාවය ගැනත් (දැනුමක් නොතිබුණි.)

8. භූමියෙහි, පෘතුවි තලයෙහි සමතුලිතතාවය සුරැකීම සඳහා කඳු මඟින් සිදුවෙන කර්යභාර්යයන් පිළිබඳ මෑත කාලීන න්‍යායන් පෙන්වා දෙන්නේ, සාපේක්ෂව බලන කල කඳුවල ඉහල කොටස ඝනකමින් අඩුය, එහි පහල කොටස ඝනකමින් වැඩි දැවැන්ත පර්වතයන් තිබේ යනුවෙන්ය. මෙය ශුද්ධ වූ අල් කුර්ආනයේ ඉගැන්වීම් හා සමාන වෙන න්‍යායකි.

9. කැනේඩියානු විද්වත් (කීත් මූර්) ව්‍යුහ සහ කළල විද්‍යාව පිළිබඳ දැවැන්තයෙකු ලෙස සලකනු ලබයි. බොහෝ විශ්ව විද්‍යාල හරහා විශිෂ්ට

විද්‍යාත්මක ගමනක යෙදුනු (අත්දැකීම්, දැනුම් සම්බාරයක්) ඔහු සතු වේ. ජාත්‍යන්තර අධ්‍යාපනික සංවිධාන ගණනාවක මුල්පුටු ඔහු විසින් හොබවනු ලැබීය. "කැනඩා - ඇමරිකා ව්‍යුහ සහ කළල විද්‍යා සංගමය", "ජීව විද්‍යාව පිළිබඳ සම්මේලනය", එමෙන්ම "කෙනේඩියානු රාජකීය වෛද්‍ය සංගමයේ" සාමාජිකයෙකු වශයෙන්ද තේරී පත් විය. එමෙන්ම "සෛල විද්‍යාව පිලිබඳ ඇකඩමියේ" මෙන්ම "ව්‍යුහ විද්‍යාව පිලිබඳ ඇමරිකානු වෛද්‍යවරුන්ගේ සංගමයේ" මුල්පුටුව හොබවිය. 1980 වැනි වසරේ, (කීත් මූර්) තමා ඉස්ලාම් දහම වැළඳගන්නා බව ප්‍රසිද්ධියේ දනුවත් කළා. නූතන විද්‍යාව අභිවන පාරිශුද්ධ වූ අල් කුර්ආනය පරිශීලනය කිරීමෙන් පසුව, විශේෂයෙන් කළල සම්බන්ධයෙන් සඳහන් වෙන ශුද්ධ වූ වැකි පිලිබඳ අධ්‍යනය කිරීමෙන් පසුවයි ඔහු මෙම ප්‍රකාශය සිදු කළේ. තමා ඉස්ලාම් දහම වැළඳගත් අවස්ථාව ගෙන කරුණු දක්වන විට : හැත්තෑව දශකයේ අග භාගයේදී "මොස්කොව්" නගරයේ "විද්‍යාත්මක ආශ්චර්යයන්" පිලිබඳ ජාත්‍යන්තර සමුළුවක් සඳහා මා ආරාධනා කරනු ලැබුවෙමි. එහිදී සමහර මුස්ලිම් විද්වතුන් විශ්වය පිලිබඳ ශුද්ධ වූ අල් කුර්ආනයේ වැකි ඉදිරිපත් කළහ. විශේෂයෙන්: "ඔහුම අහසෙහි සිට පොලොව දක්වා වූ කාර්යයන් පාලනය කරයි. පසුව, නුඹලා ගණනය කරන වර්ෂ දහසකට සමාන දවසක එය ඔහු කරා ඉහල යන්නේය. සජදා නම් වූ පරිච්ඡේදයේ 5 වන වැකිය. එලෙස, දිගටම ඔවුන් ශුද්ධ වූ වැකීන් ඉදිරිපත් කරන්නට විය. ඒ අතර කළල වර්ධනය සහ එහි සැකැස්ම, මිනිස් නිර්මාණ යනාදිය පිලිබඳ කරුණු ඉදිරිපත් කළෝය. ඔවුන් කරුණු ඉදිරිපත් කල තොරතුරු වැඩියෙන් දැනගැනීම පිණිස මා නිහඬව ඒවාට සවන් දුන්නෙමි. ඇත්තටම ඒවා බොහෝ ප්‍රශ්නවලට පැහැදිලි, ප්‍රබල පිළිතුරු විය. මාගේ හදවතේ එම කරුණු පිලිබඳ යහපත් ස්ථාවරයක් ඒ වන විටත් ඇති වී තිබුණි. මෙයයි මාගේ බලාපොරොත්තුව යයි මාගේ හිතටම මා පැවසුවෙමි. මා දීර්ඝ කාලයක් තිස්සේ මෙම කරුණු කාරනා පිළිබඳවයි නවීන තාක්ෂණය භාවිතයෙන් සොයමින් සිටියේ. නමුත් පාරිශුද්ධ වූ අල් - කුර්ආනය උක්ත කරුණු කාරණා පිලිබඳ තොරතුරු පරිපූර්ණ මෙන්ම හරවත් ලෙස නවීන තාක්ෂනයට පෙරම තොරතුරු ගෙනහැර දක්වා තිබේ.

10. විශ්වයේ ඇති සියල්ලක්ම එහි නිර්මාතෘගේ පාලනය යටතේ සිදුවෙයි. සෑම දෙයක් පිළිබඳවම පූර්ණ සවිස්තරාත්මක තොරතුරු සහ නිරපේක්ෂ හසල දැනුම, මෙන්ම සෑම දෙයක්ම තමාගේ කැමැත්තට අනුව නතු කිරීමේ හැකියාව සහ ශක්තිය ඇත්තේ ඔහුටය. ඉර ග්‍රහලෝක මෙන්ම මන්දාකිනි, ඉතාමත් සූක්ෂම ලෙස ක්‍රියා කරයි. මෙම සූක්ෂම භාවය සහ හැකියාව මිනිසුන් මැවීම සඳහා ද එය අදාළ වේ, අප ශරීරය තුල ඇති ප්‍රාණය ගැන මදක් සිතා බැලුවොත් ශරීරය හා ප්‍රාණය සසඳා බැලූ විට ප්‍රාණය මිනිස් ශරීර තුල තැබූ තැනැත්තා එම ප්‍රාණය සතුන්ගේ ශරීර තුල විසීමටත්, ශාක කොටස් අතර යෑමටත් පහසුකම් නොමැති බව පහසුවෙන් හඳුනාගත හැක. (පුනරුත්පත්තිය හෝ පුනර් ජීවයක් තුලින් එකම ප්‍රාණය විවිධවූ ශරීර කූඩු තුල ජීවත්වෙයි යන විශ්වාසය)

ඒකීය දෙවිඳුන් මිනිසාව සෙසු ජීවින් අතරින් සුවිශේෂී ජීවයා බවට පත්කළේ මිනිසාවයි. ඒ, හොඳ හා නරක තෝරා ගැනීමේ හැකියාව තිබෙන බුද්ධිය ලබා දී, එමෙන්ම තමා වටා සිදුවෙන දේවල් පිලිබඳ තොරතුරු පහසුවෙන් ග්‍රහණය කරගැනීමට හැකියාව ලබා දී, එමෙන්ම ඔහුව මේ මිහිමත නියෝජිතයා ලෙස පත්කොට, ඔහුව සුවිශේෂී කොට, ගෞරවකොට, සෙසු ජීවින් අතරින් සෑම ආකාරයෙන්ම උසස් කිරීම තුලින්ය. එමෙන්ම නිර්මාතෘ (ඒකීය දෙවිඳුන්)ගේ සාධාරණත්වය නම්, (මිනිසුන්ගේ කල් ක්‍රියාවන් මත ඔහුගේ අවසන් විනිශ්චය සඳහා) විනිශ්ච දිනයක් ස්ථාපිත කර තිබීමය. එහිදී කුසල් හා අකුසල් කිරනු ලබයි. එමෙන්ම ස්වර්ගය හා අපාය ඇති කර තිබේ. කවරෙකු අංශු මාත්‍රයක් තරම් යහපතක් සිදු කරයිද (විනිශ්ච දිනය නම් වූ) එදින ඔහු එය දැකගනී, කවරෙක් අංශු මාත්‍රයක් තරම් අයහපතක් සිදු කරයිද ඔහු එය (විනිශ්ච දිනය නම් වූ) එදින දැකගනී. ශුද්ධ වූ අල් කුර්ආනයේ 99 වන පරිච්ඡේදයේ 7 සහ 8 වන වැකිය.

11. මෙයයි නූතන විද්‍යාවේ නවීනතම සොයාගැනීම් අනුව කළල වර්ධනයක ඇති නිවැරදි අවධීන්.

ශුද්ධ වූ අල් කුර්ආන් 96:1 **ඕ:නබි! සියල්ල මැවූ නුඹගේ 'රබ්'ගේ නාමයෙන් නුඹ කියවන්න.**

ශුද්ධ වූ අල් කුර්ආන් 39:9 **(ප්‍රතික්ෂේප කරන්නා ශ්‍රේෂ්ඨයෙකුද?) නැතිනම් එලොව ගැන බිය වී, තම 'රබ්'ගේ ආශිංසණය කෙරෙහි අපේක්ෂාව තබා, රාත්‍රී කාලයන්හි සුජූදු කළ කෙනෙකු ලෙසද යටත් බව පෙන්වමින් පහත් වන්නාද? දන්නෝ හා නොදන්නෝ සමාන වන්නෝදැ?යි (නබි!) නුඹ අසන්න! බුද්ධිමත්හුම උපදෙස් ලබන්නෝය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 35:28 **තවද, මේ අන්දමටම මිනිසුන් අතරෙහිද, උරගයන් අතරෙහිද, සතුන් අතරෙහිද වෙනස් වූ විවිධ වර්ණ ඇත. අල්ලාහ්ගේ ගැත්තන්ගෙන් ඔහුට බිය වන්නන් උගතුන්මය. නියතව අල්ලාහ් සියල්ලම අභිබවූ කෙනාය; අධිකව සමා කරන්නාය.**

## 6. ඉස්ලාම් ධර්මය මිනිසාව මුල් පව් බරෙන් නිදහස් කොට සමාවද ලබාදෙයි.

සෑම ළදරුවෙකුම කිසිඳු පාපයකින් තොරව උපත ලබයි. ආදම් (අලෛහිස් සලාම් තුමා) හට අල්ලාහ් සමාව ලබා දීම යනු මානව සංහතියේ පසුතවිලිවීම් පාපෝච්චාරනයන් මෙන්ම සමාව අයැදීම් ඔහු විසින් පිළිගනු

ලබන බවට දැක්විය හැකි නිදසුනකි. සෑම මනුෂ්‍යයෙකුම තමාගේ වැරැද්දට වගකිව යුතුවේ. (එක් එක් ආත්මයක්ම තමා ඉපයූ දෙයට උකස් කරනු ලැබ ඇත්තෝය.) ශුද්ධ වූ අල් කුර්ආනයේ අල් මුද්දස්සිර් නම් වූ 74 වන පරිච්ඡේදයේ 38 වන වැකිය. මෙයයි ඒකීය දෙවිඳුන්ගේ සර්ව සාධාරණ නීතිය ධර්මය වන්නේ. අල්ලාහ් කිසිම විටක පුද්ගලයෙකු ඔහු විසින් නොකරන ලද පාපයක් / අකුසලක් පිළිබඳ විමසනු නොලබයි. එමෙන්ම කිසිම පුද්ගලයෙකු තම මැවුම් කරු ඒකීය දෙවිඳුන් කෙරෙහි නිසි ලෙස විශ්වාසය කොට, යහකම් නොකර අපායෙන් මිදී ස්වර්ගයට පිවිසිය නොහැක. මෙම දෙවිඳුන් විසින් ලබා දෙනු ලැබ, ඕනෑම දෙයක් තමාගේ අභිමතය පරිදි තෝරා බේරාගෙන සිදුකල හැකි ලෙස පහසුකම් සලසා දී තිබෙන්නේ, පරීක්ෂණයක් සඳහා මෙන්ම මතු දිනයක විමසනු ලැබීම සඳහාය. ඔහු තම ක්‍රියාකාරකම් සඳහා පමණක් වග උත්තරකරුවෙකුවේ, (මෙයයි ඉස්ලාමිය ඉගැන්වීම වන්නේ).

ශුද්ධ වූ අල් කුර්ආන් 35:18 කිසිම ජීවයක් තවත් ජීවයක පවෙහි බර නොඋසුලන්නේය. (පව්) බර දැඩි වූ ජීවය එය ඉසිලීමට (කිසිවෙකු හෝ) අඬගැසූවද, (අඬගසනු ලැබූ කෙනා) නෑයකුව සිටියද එහි සිට කිසිවක් ඔහු මත පටවනු නොලබන්නේය. කවරහු තමන්ගේ 'රබ්' ට අදෘශ්‍යමාන තත්වයෙහිද බිය වී, සලාතය සහතික කරත්ද ඔවුනටම නුඹ අවවාද කරහිය. කවරෙක් පිරිසිදු වෙයිද ඔහු තමා වෙනුවෙන්ම පිරිසිදු වෙයි. අල්ලාහ් හමුවට ආපසු යෑම ඇත. **(12)**

## නබි මුහම්මද් (සල්) තුමන් පැවසුවා : (( (මේ මිහි පොළොව මත) උපත ලබන සෑම ළදරුවෙකුම සොබා ධර්මයට අයත් දහමෙහිය උපත ලබයි, ඔහුගේ දෙමව්පියන් (භාරකරුවන් ඇතුළු ඔහුගේ සමාජය නිවැරදි සංකල්පයේ නොමැති) යුදෙව්වෙකු හෝ කිතුණුවෙකු බවට හෝ ගින්නට යදින්නෙකු බවට පත් කරන්නේය.)) මූලාශ්‍රය : බුහාරි

---

**(12)** “දරුවෙක් කරන වරදක් නිසා ඔහුගේ පියාව මරා නොදැමිය යුතුයි. පියෙක් කරන වරදක් නිසා ඔහුගේ දරුවාව මරා නොදැමිය යුතුයි. මරණ දණ්ඩනය දිය යුත්තේ වරද කළ තැනැත්තාට පමණයි. ද්විතිය කතාව 24 : 16

## 7. ඉස්ලාම් දහම මිනිසාව විශ්වය හා බැඳි සුසංයෝගයෙන් යුතු ජීවිතයක් වෙත මඟ පාදයි.

විශ්වයේ ඇති සෑම නිර්මාණයක්ම තම නිර්මාතෘගේ ගුණ මහිමය සිහිපත් කරයි. ඉස්ලාම් දහම මංපෙත් විවර කර එම කර්තව්‍ය තවත් පහසු කර නිර්මාතෘ හා නිර්මාණයන් අතර තව තවත් ශක්තිමත් කිරීමට කටයුතු කරයි. තම නිර්මාතෘවරයා වන දෙවිඳුන් වෙත මඟ පෙන්වන සොබා දහමට අයත් වූ නිවැරදි මාවත වෙත ඔහුව යොමුකරවයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 3:83 **අල්ලාහ්ගේ ආගම නොවන්නක්ද මොවුන් ප්‍රිය කරන්නේ? අහස්හිද පොළොවෙහිද ඇති සියල්ලම කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් ඔහුටම යටත් වේ. තවද, ඔවුහු ඔහු හමුවට පමුණුවනු ලබන්නෝය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 13:15 **අහස හා පොළොවෙහි ඇති දේද, ඒවායෙහි සෙවණද කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ උදයෙහිද සවසෙහිද අල්ලාහ්ටම සුජුද් කරති.**

## 8. ඉස්ලාම් දහම තුලින් පතිවත සුරැකීම වෙතත්, විනීත ජීවිතයක් වෙතත් ආරාධනා කරයි.

සදාචාරාත්මක වටිනාකම් පහත වැටෙන විට. පවුල් ජීවිත පවා අවුල් සහගත තත්වයකට පත් වේ. ඇතිවිය හැකි එවන් ප්‍රශ්න වලට විසඳුම් ක්‍රම රැසක් ඉස්ලාම් දහම ගෙන එයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 7:26 **ආදම්ගේ දරුවනි! නුඹලාගේ රහසාංග වසන, වස්ත්‍රද, අලංකාරයද අපි පහල කර ඇත්තෙමු. නුමුත්, (බිය බැති බව නැමති) 'තක්වා' වලට අයත් වස්ත්‍රයම වඩාත් ශ්‍රේෂ්ඨ වේ. මේවා ඔවුන් උපදෙස් ලැබීම පිණිස (පවසනු ලබන) අල්ලාහ්ගේ වැකිවේ.**
ශුද්ධ වූ අල් කුර්ආන් 24:30-31

30. **ඔවුන් තමන්ගේ බැලීම් පහත් කරගත යුතු යැයිද, තමන්ගේ පතිවත රැකගත යුතු යැයිද (නබි) නුඹ විශ්වාසවන්ත වූ පිරිමින්ට පවසන්න! මෙය ඔවුනට වඩාත් පිරිසිදු වේ. නියතව ඔවුන් කරන දේ ගැන අල්ලාහ් හොඳින් දන්නාය.**

31. **(ඕ:නබි!) නුඹ විශ්වාසවන්ත වූ ගැහැණුන් හමුවෙහි, ඔවුන් තමන්ගේ බැලීම් පහත් කරගත**

**යුතු යයිද, තමන්ගේ පතිවත රැකගත යුතු යයිද, ඔවුන්ගේ අලංකාරයෙහි පිටතට පෙනෙන දේ හැර ඔවුන් වෙන කිසිවක් හෙළි නොකළ යුතු යැයිද, තමන්ගේ හිස් වැසුම් වස්ත්‍රය තමන්ගේ පියයුරු මත දමා ගන්නා ලෙසද ඔවුනට පවසන්න! තවද, ඔවුන් තමන්ගේ අලංකාරය තමන්ගේ ස්වාමි පුරුෂයින් හෝ තමන්ගේ පියවරුන් හෝ තමන්ගේ ස්වාමි පුරුෂයින්ගේ පියවරුන් හෝ තමන්ගේ පිරිමි දරුවන් හෝ තමන්ගේ ස්වාමි පුරුෂයින්ගේ පිරිමි දරුවන් හෝ තමන්ගේ සහෝදරයින් හෝ තමන්ගේ සහෝදරයින්ගේ පිරිමි දරුවන් හෝ තමන්ගේ සහෝදරියන්ගේ පිරිමි දරුවන් හෝ තමන්ගේ ගැහැණුන් හෝ තමන්ගේ වහලුන් හෝ ගැහැණුන් කෙරෙහි ඇල්මක් නැති (ඔවුනට) සමීපව ජීවත් වන (මහලු) පිරිමින් හෝ ගැහැණුන්ගේ රහස් ස්ථාන ගැන අවබෝධ නොකරගත් කුඩා ළමුන් යනාදීන් හමුවෙහි හැර අනෙක් අය හමුවෙහි හෙළි නොකළ යුතුය. තමන් දන්වනු ලැබීම පිණිස තමන්ගේ පාදවලින් තට්ටු කිරීමද නොකළ යුතුය. විශ්වාසවන්තයනි! නුඹලා ජය ලැබීම පිණිස නුඹ සියලුදෙනාම අල්ලාහ්ගෙන්ම පාපවලට සමාව අයදින්න.**

ශුද්ධ වූ අල් කුර්ආන් 33:59 **ඕ:නබි! නුඹගේ බිරියන්ටද, නුඹගේ දූවරුන්ටද, විශ්වාසවන්තයින්ගේ ස්ත්‍රීන්ටද, ඔවුන් තමන්ගේ හිස් ආවරණය තමන් කෙරෙහි එල්ලෙමින් තිබෙන සේ සකසාගන්නා ලෙසට පවසන්න! ඔවුන් දැනගැනීම පිණිසද, රිදීම් ඇති නොකර සිටීම පිණිසද මෙය ඉතා සමීප දෙයක් වේ.**

**තවද, අල්ලාහ් අධිකව සමා කරන්නා ලෙසද, අසමසම දයාවන්තයා ලෙසද සිටියි.**

## 9. ඉස්ලාම් දහම ඉවසීම, මධ්‍යස්ත ලෙස කටයුතු කිරීම සහ සමාව ලබාදීම කෙරෙහි මඟ පෙන්වයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 2:143 **නුඹලා අනෙක් මිනිසුන්ට සාක්ෂිකරුවන් ලෙස සිටීම පිණිසද, මෙම දූතයා නුඹලාට සාක්ෂිකරු ලෙස සිටීම පිණිසද මේ අන්දමට නුඹලාව මධ්‍යස්ත සමාජයක් බවට පත් කළෙමු. (ආගම හැර) පිටුපා යන්නන්ගෙන් මෙම දූතයා පිළිපදින්නා කවරෙක්ද? යන්න අපි දැනගැනීම පිණිස, නුඹලා කලින් මුහුණ හරවාගෙන සිටි කිබ්ලාව වෙනස් කළෙමු. අල්ලාහ් යහමඟ පෙන්වූවන්ට හැර අනෙක් අයට මෙය බරක්ම වේ. අල්ලාහ් නුඹලාගේ විශ්වාසය අපතේ හරින්නෙකු නොවේ. නියතව අල්ලාහ් මිනිසුන් කෙරෙහි මහා කරුණාවන්තයාද, අසම දයාවන්තයාද වේ.**

ශුද්ධ වූ අල් කුර්ආන් 109:6 **නුඹලාට නුඹලාගේ ධර්මය මට මාගේ ධර්මය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 7:31 **ආදම්ගේ දරුවනි! සලාතය ඉටු කරන සෑම තැන්හිම (වස්ත්‍රය නැමැති) නුඹලාගේ අලංකාරත්වය අරගන්න. තවද, අනුභව කරන්න; නාස්ති නොකරන්න. නියතව ඔහු නාස්ති කරන්නන්ව ප්‍රිය නොකරන්නේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 17:29 **(නුඹ වියදම් නොකර) නුඹගේ අත නුඹගේ ගෙලෙහි බඳිනු ලැබූවක් ලෙස නොකරගන්න. තවද, (සියල්ලම වියදම් කර) එය මුළුමනින්ම විවෘතද නොකළ යුතුය. එසේ වූයේ නම්, නුඹ නින්දාවට පත් කරනු ලැබූ කෙනෙකු ලෙසද, පසුතැවිලි වන කෙනෙකු ලෙසද වන්නෙහිය.**

((ව්‍යාපාර කටයුත්තකදී වික්කත්, මිලදී ගත්තත්, තමා ලබා දුන් ණයක් නැවත පියවනමෙන් ඉල්ලා සිටියත් යහපත් ලෙස කටයුතු කරන්නන් හට අල්ලාහ්ගේ කරුණාව හිමිවේවා!)) යයි වරක් අවසන් ධර්ම ශාස්තෘ නබි මුහම්මද් (සල්) තුමාණන් ප්‍රර්ථනා කළා
මූලාශ්‍ර ග්‍රන්ථය: බුහාරි

## 10. අල්ලාහ්ගේ කරුණාවෙන් විශ්වාසභංගත්වයට පත් වීමක් ඉස්ලාමය තුල නොමැත.

ශුද්ධ වූ අල් කුර්ආන් 1:1 **අසීමිත කරුණාවන්තයාවූද අසමසම දයාවන්තයාවූද අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

ශුද්ධ වූ අල් කුර්ආන් 39:53 **තමන්ට තමන්ම (අපරාධ කර) සීමාව ඉක්මවූ මාගේ ගැත්තනි! නුඹලා අල්ලාහ්ගේ ආශිංසණයෙහි විශ්වාසය අත් නොහැරිය යුතුය. නියතව අල්ලාහ් සියලුම පව් සමා කරන්නේය. නියතව ඔහු අධිකව සමාකරන්නාය; අසම දයාවන්තයායයි (නබි) නුඹ පවසන්න!**

ශුද්ධ වූ අල් කුර්ආන් 7:56 **පොළොවෙහි ප්‍රකෘතිමත් බව ඇති වූ පසු නුඹලා එහි කලහ ඇති නොකරන්න. බියෙන් යුතුවද ආශාවෙන්ද ඔහුව අඬගසන්න. නියතව අල්ලාහ්ගේ කරුණාව, යහකම් කරන්නන්ට සමීපව ඇත්තේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 6:54 **අපගේ වැකි විශ්වාස කළවුන් නුඹ වෙත පැමිණියේ නම්, 'නුඹලා කෙරෙහි ශාන්තිය ඇතිවේවා!' යැයි පවසන්න! නුඹලාගේ 'රබ්' කරුණාව පෙන්වීම තමා කෙරෙහි යුතුකම කරගත්තේය. නියතව නුඹලාගෙන් කවරෙක් නොදන්නා හේතුවෙන් යම් කිසි අයහපතක් කර,**

**ඊට පසුව සමාව අයැද තමාව නිවැරදි කරගත්තේ නම් නියතව ඔහු සමාකරන්නාය; අසමසම දයාවන්තයාය.**

නබි මිත්‍ර අබූ හුරෛරා (රලි) තුමන් : නබි මුහම්මද් (සල්) තුමාණන් පැවසූ බව මෙලෙස වාර්තා කරයි : ((අල්ලාහ් සෑම නිර්මාණයක්ම නිර්මාණය කිරීමෙන් පසු, තම ඉමහත් වූ සිංහාසනයේ ඉහලින් "නියතව මාගේ කරුණාව මාගේ කෝපය අභිබවා ගියේය". යනුවෙන් සටහන් කොට එල්ලා තැබුවේය.)) මූලාශ්‍ර ග්‍රන්ථය: බුහාරි මුස්ලිම් (මුත්තෆකුන් අලෛහි)

## 11. ඉස්ලාම් දහම සමානාත්මකතාවය, එක්සත් භාවය වෙත කැඳවන අතර වාර්ගික වෙනස්කම්වලට එරෙහිව නැගී සිටීම වෙත ආරාධනා කරයි.

නිර්මාතෘ අල්ලාහ් අනේක අප්‍රමාණ සංඛ්‍යාත ජීවින් අතර මනුෂ්‍යයින්ව ගරුකොට තිබේ. ඔහු සෑම ජාතිකයින් මෙන්ම ජාතීන් අතර සමානාත්මතාවය වෙත ආරාධනා කරයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 17.70 **නියතව අප ආදම්ගේ දරුවන්ව ගෞරවයට පත් කළෙමු. තවද අප ගොඩ බිමෙහිද, මුහුදෙහිද ඔවුන්ව උසුලා ගියෙමු. තවද අපි පිරිසිදු දෑයින් ඔවුනට ආහාර ලබා දුනිමු. අපි මැවූ බොහෝ දෑට වඩා මොවුන්ව වඩාත් උසස් කළෙමු.**

නියතව ඉස්ලාම් දහම තුල තරාතිරම මෙන්ම ගරුත්වය මනිනු ලබන්නේ පුද්ගලයෙකු දෙවිඳුන් කෙරෙහි දක්වන බිය බැතිය මතයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 49.13 **මිනිසුනි! නියතව අප නුඹලාව පිරිමියෙකු හා ගැහැණියෙකුගෙන් මවා,**

**නුඹලා එකිනෙකාව හඳුනාගැනීම පිණිස නුඹලාව ජාතීන් ලෙසද, ගෝත්‍ර වශයෙන්ද කළෙමු නුඹලා අතරින් වඩාත් බිය බැති භාවය ඇත්තාම නියතව අල්ලාහ් හමුවෙහි වඩාත් ගෞරවයට හිමි කෙනාය. නියතව අල්ලාහ් හොඳින් දන්නාය; සූක්ෂමයාය.**

නබි මුහම්මද් (සල්) තුමාණන් පැවසූහ: ((විශ්වාස වන්තයිනි! නියතව ඔබ සැමගේ දෙවිඳුන් ඒකීයයි, ඔබ සැමගේ මුල් පියාද එකම එක්කෙනෙකි, එම නිසා කිසිම අරාබි ජාතියෙකුට අරාබි නොවන්නෙකුට වඩා ශ්‍රේෂ්ඨත්වයක් නොමැත. එමෙන්ම කිසිම අරාබි නොවන්නෙකුට අරාබි ජාතිකයෙකුට වඩා ශ්‍රේෂ්ඨත්වයක්ද නොමැත. එමෙන්ම සුදු ජාතියෙකු කළු ජාතිකයෙකුට වඩා හෝ කළු ජාතිකයෙකු සුදු ජාතිකයෙකුට වඩා උසස් වන්නේ නැත. (නියම උසස්වීම තිබෙන්නේ) බියබැතිය මතයි.))
මූලාශ්‍රය: අහමද්

ඒකීයත්වය සහ සමානාත්මතාවය එකම ස්ථානයකින් පටන්ගන්නා ආකාරය අනේක ඉස්ලාමීය වත්පිළිවෙත් තුලින් දැකගත හැකිය.

1. සලාතය තුල මුස්ලිම්වරුන් එකම පේළියේ සමීපව සිටගනී, කෙනෙකුට පැත්තේ තවත් කෙනෙක් මෙලෙස සිටගන්නා විට තම දෙපැත්තේ සිටින අයව ඔවුන්ගේ ජාතිය හෝ ජාතිකත්වය මෙන්ම තරාතිරමක් මත කිසිම බෙදීමක් සිදු කරනු ලබන්නේ නැත.

2. වහල්භාව සම්පූර්ණයෙන් තුරන් කිරීම වෙත ජනයාව ඉස්ලාම් දහම ආරාධනා කරයි. ඒ මත බොහෝ වත් පිළිවෙත් හි උගනපූර්නයක් ලෙස වහලුන් නිදහස් කිරීම පත් කොට තිබේ.

3. හජ් වන්දනාවෙහි, සියලුම මුස්ලිම්වරුන් එකම ස්ථානයක, එකම කාලයක, එක සමාන වර්ණයෙන් යුතු එකම ආකාරයේ ඇඳුම්වලින් සැරසී, සමාජය තුල තමන් අතර පවතින වර්ග භේද සියල්ල නොතකමින් හජ් නම් වූ ඒ උතුම් කර්තව්‍ය (දෙවිඳුන් වෙනුවෙන්) ඉටු කරයි.
ගෞරවනීය අල්ලාහ්ගේ ශුද්ධ වූ මාලිගය මාලිගය (නොහොත්) අල් කඃබාව (13) ඒකීය

දෙවිඳානන් වන්දනාමාන කිරීම සඳහා වූ ප්‍රථම පල්ලිය ලෙසත්, විශ්වසවන්තයින් තම සලාතයේදී ඒ වෙත හැරී නමස්කාර කිරීම සඳහා වූ සංඛ්‍යාවක්, සලකුණක් ලෙසත් පත් කර තිබේ. එමෙන්ම වටා ලොවේ නානාපතාර පෙදෙස් වල ජීවත්වෙන මුස්ලිම්වරු සලාතය ඉටුකිරීම සඳහා එය වටා පෙළගැසෙති. එමෙන්ම එය වටා මුස්ලිම්වරුන් වාමාවර්තව තවාෆ් (නොහොත් සක්මන් කිරීමේ කර්තව්‍ය සිදු) කරයි. එය විශ්වයේ චලනය, ග්‍රහ වස්තූන්හි චලනය, හිරු වටා ග්‍රහලෝක මෙන්ම ඉලෙක්ට්‍රෝන චලනය, මිනිසාගේ සිරුර තුල රුධිර සංසරණය යන සෑම ස්වභාවික චලනයන් වලට සමානුපාතික චලනයකි.

---------------------------------------------------

(13) ගෞරවනීය කඃබාවට යනු හතරැස් (සමචතුරශ්‍රාකාර) ගොඩනැගිල්ලකි, එය ඝනාකාරයි. එය පිහිටා ඇත්තේ (සෞදි අරාබියේ) මක්කා නගරයේ (අල් හරම් නම් වූ ගෞරවනීය) නැමදුම්පළ මැද පිහිටා ඇත. මෙම ගොඩනැගිල්ලට දොරක් තිබේ. එයට ජනේල් පිහිටා නොමැත. එහි තුල කිසිවක් නොමැත අතර එය කිසිවෙකුගේ සුසානයක්ද නොවේ. එය සලාතය සඳහා ඉදි කරනු ලැබූ කාමරයකි. කඃබාව තුල සලාතය ඉටු කරන මුස්ලිම්වරයා හට ඔහු තමා කැමති දිශාවකට සලාතය ඉටු කල හැක. කඃබාව ඉතිහාසයේ අවස්ථා ගණනාවකදී ප්‍රතිසංස්කරණය කරනු ලැබිණි. ධර්ම ශාස්තෘ ඉබ්‍රාහීම් තම පුතණුවන් හා එක්ව කඃබාව එහි අත්තිවාරමෙන් ඉහලට නැංවීය. කඃබාවේ එක් මුල්ලක "හජර් අල් අස්වද්" යන නමින් ගලක් පිහිටා ඇත. එම ගල සාමාන්‍ය සෙසු ගල් මෙන් ගලකි.

එය මුල්ම මිනිසා ගෙන් සිට පැවත එන්නෙකි. එම ගල මුස්ලිම්වරුන් වෙත යා කෙරෙන සංකේතයකි.

නියත වශයෙන්ම ශුද්ධ වූ අල් කුර්ආනය වන්දනාකරුවන් හා සොබා දහම අතර තිබූ බැඳීම් පිළිබඳ ස්ථාන රැසක උදාහරණ රාශියක් මඟින් අපට පැහැදිළි කරයි. උදාහරණයක් ලෙස: කඳු, මෙන්ම කුරුල්ලන් ධර්ම ශාස්තෘ "දාවූද්" අලෛහිස් සලාම් තුමා සමඟ එක්ව අල්ලාහ්ව සුවිශුද්ධ කිරීම පිළිබඳ පුවත සඳහන් කල හැක. "නියතව අපි දාවූද්ට අපගෙන් දායාදය ලබා දුනිමු. 'ඕ: කඳුනී! පක්ෂීනි! ඔහු සමඟ එක් වී සුවිශුද්ධ කරන්න. තවද, අපි ඔහුට යකඩය සැහැල්ලු කර දුනිමු".

නියතව ඉස්ලාම් දහම අනේක ස්ථානයන්හි සම්පූර්ණ විශ්වයම දෙවිඳුන්ව පුදන, දෙවිඳුන්ගේ ඉමහත් භාවය පවසන සකල ලොවහි නිර්මාතෘගේ මැවීම් යනුවෙන් තහවුරු කරයි. මේ මහ පොළොවෙහි සොභාවය වන්නේ තමා වටා භ්‍රමණය වීම සිදු වීම මත රැය දවාල ඇතිවීම වේ. එලෙසින්ම මෙම භූමිය භ්‍රමණය වෙන

ආකාරයටම, මුස්ලිම්වරුන් කඃබාව වටා සක්මන් කිරීම සඳහා සහ සම්බන්ද වීම, මෙන්ම, මුස්ලිම්වරු දෛනිකව ඉටුකරන අනිවාර්ය පස්වේල සලාතයන් ලොවේ සෑම ප්‍රදේශයකම ශුද්ධ වූ කඃබාවට මුහුණ ලා සිදු කරනු ලැබීම යන කර්තව්‍යන් මෙම විශ්වයේ ක්‍රියාකාරීත්වයට කිසියම් ආකාරයකින් සමානවේ.

## 12. නිදහසේ දහමයි ඉස්ලාමය:

## - විශ්වාසයේ සහ කැමති දහමක් පිළිගැනීමේ නිදහස.

නියතව අයිතිවාසිකම් අතරින් ඉතාමත් වැදගත්ම අයිතිවාසිකම වන්නේ ඇදහිල්ලේ නිදහස මෙන්ම විශ්වාසයේ නිදහසයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 2:256 **මෙම (ඉස්ලාම්) ධර්මය (වැළඳ ගැනීම) හි කිසිදු බල කිරීමක් නැත. මංමුලාවේ සිට යහමඟ වඩාත් පැහැදිලි විය. කවරෙක් (අල්ලාහ් හැර නැමදුම් ලබන) 'තාගූත්'ව ප්‍රතික්ෂේප කර, අල්ලහ්ව විශ්වාස කරයිද ඔහු නියතව නොකැඩන ශක්තිමත් කඹයක් තදින් අල්වාගත් කෙනා වේ. තවද අල්ලාහ් සියල්ලට සවන්දෙන්නාද හොඳින් දන්නාද වේ.**

## - වහල්බවින් නිදහස. (වහල්බවට විරුද්ධව සටන් කිරීම)

ඉස්ලාම් දහමට පෙර සිටම සමාජය තුල සුලභ ලෙස ජනයා අතර වහල් භාවය පැවත තිබේ. එයට කිසිම පාලන ක්‍රමවේදයක් නොතිබුණි. තමා ගත්තු ණය පියවීමට නොහැකි වන්නන් ඉබේම ණය ලබා දුන් අයට වහලුන් ලෙසට පත් වෙයි. එමෙන්ම යුධ සිරකරුවන් ඉබේම වහලුන් ලෙසට පරිවර්තනය වෙයි. සමහර රට රාජ්‍යන් වල වහලුන් සතා සිව්පාවුන් මෙන් දඩයම් කරනු ලැබීය. වහලුන් යනු මුදල් වලට විකිණෙන, ගනු ලබන වස්තුවක් ලෙස සලකනු ලැබීය. මිනිස්සුන්ට සම්පත් / මුදල් සොයා දෙන වස්තුවක් ලෙස, විශේෂයෙන් රදළ පංතියේ අයට. තවද කෙනෙකු සතු ඉහල සංඛ්‍යාවක වහලුන් ප්‍රමාණය ඔහුගේ තරාතිරම, ගෝත්‍රික බලය, සශ්‍රීක භාවය මනිනු ලබන සංකේතයක් විය.

ඉස්ලාම් දහමට බලය යොදා මෙයට විරුද්ධ මතුපිටින් කටයුතු කිරීමට හැකියාව තිබුණි.

නමුත් ඒතුලින් සමාජය තුල වෛරය ක්‍රෝධය මෙන්ම සතුරුකම්ද (ක්ෂණිකව) ඉහල යාමට යාම නොවැලක්විය හැකි කරුණක් වනු නොඅනුමානයි. එමෙන්ම එකල වහල් සේවය සුලභ දෙයක් ලෙස සලකා ඒ මත රැඳී වෙළහෙළදාම් කරමින් සිටි අයගේ ආර්ථිකයට මරු පහරක්ද වන්නටත් තිබුණි. (ඒ සියල්ලද සලකා) ඉස්ලාම් දහම මෙම වහල් සේවනය තුරන් කිරීම සඳහා අනුගමනය කළේ වෙනස්ම ක්‍රමවේදයකි. එනම්, ප්‍රථමයෙන්ම සමාජය තුල වහලුන්, යුධ සිරකරුවන් පිලිබඳ පැවති ආකල්ප සහ මතවාද වෙනස් කළේය. සමාජය තුල වහලෙකු නිදහස් කරනු ලැබීමෙන් පසු ඔහු සෑම අතින්ම නිදහස් පුද්ගලයෙකු ලෙස සමාජය තුල සලකනු ලැබීය. කිසිම විටක ඔවුන්ට අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා හෝ වරප්‍රසාද ලබා ගැනීම සඳහා උද්ඝෝෂණ කිරීම්, වර්ගවාදී අරගල කිරීම්, සිවිල් වැසියන්ගෙන් හිංසනයන් හෝ පීඩා වලට මුහුණ පෑම් යන කිසිවක් ඔවුනට ඇතිවූයේ නැත. නියතව

කඩු භාවිතා කර හෝ රුධිර හැලීමකින් තොරව සියලුම වර්ගයේ වහල්භාවයේ උල්පත් සිඳී යාමට ඉස්ලාම් දහමට සැලැස්විය හැකිවිය.

ඉස්ලාම් දහමට පෙර පැවති වහල්භාවයේ ප්‍රභවයන් සමහරක්:

- යුද්ධයකදී සිර භාරයට ගනු ලබන සිරකරුවන් එදා වහලුන් බවට සලකනු ලැබීය.

- පාලකයා නැත්නම් රාජ්‍ය නායකයා තම පාලිත ජනයාගෙන් තමන් කැමති ඕනෑම කෙනෙක්ව තම වහලා ලෙස පත්කර ගත්තේය.

- පියා හෝ සීයාගෙන් පැවතෙන්නන් කෙරෙහි පරම බලය ඇති තැනැත්තා ඔවුන්ගේ අභාවයෙන් පසු ඔහුව විකිණීම හෝ තවත් කෙනෙකුට තෑග්ගක් ලෙස පිරිනැමීම හෝ තමාගේ ණයක් බේරීම සඳහා භාවිතා කල හැකිය.

ඉහත අවස්ථා තුනෙන් පහළ අවස්ථා දෙකම සම්පූර්ණයෙන්ම ඉස්ලාම් දහම නිෂ්ඵල

බවට පත් කළේය. පාලකයා හට තමන් කැමති කෙනෙක්ව වහල්ලු බවට පත්කරගැනීම සඳහා තිබූ අවස්ථාව නැති කළේය. එමෙන්ම ඉස්ලාම් දහම පාලකයා හෝ එහි ජනයා තම අයිතිවාසිකම් නිදහසේ භුක්ති විඳිමින් තම වගකීම් නිදහසේ ඉටුකිරීමට ඇති හැකියාව පිරිනැමුවේය. සැමට යුක්තිය, සාධාරණත්වය තහවුරු කළේය.

සිරකරුවන්ට සතුරාට මෙන් සලකනු ලබන යුද්ධයයි වහල්භාවය සඳහා මූලිකම කාරණය වන්නේ. එම නිසා එහිද සීමා පනවන ලද නව ක්‍රමවේදයන් ඇති කරන ලැබුවේය. එහි අවසන් අධියරය වූයේ ක්‍රමානුකූලව වහලුන් නිදහස ලැබීමය. (වත්පිළිවෙත් තුල ඇතිවෙන යම් යම් අඩුපාඩු) ඌනපූර්ණ කිරීමේදී, දෙවිඳුන් වෙත වැඩි වැඩියෙන් සමීප වෙනුවෙන් දාන ධර්මයන් කිරීමේදී, යහකම්හි උනන්දුවෙන් යුතුව නිරතවීම සඳහා වහලුන් නිදහස් කරනමෙන් වූ දිරිගැන්වීම් වැනි යහකම්

තුලින් අවසානයේ වහල්භාවය තුරන් කිරීම ක්‍රමානුකූලව සිදුකරනු කරනු ලබයි.

වහල්භාවය ඇති වීමට ප්‍රධාන ලෙස හේතු කාරණා වූයේ රට රාජ්‍යයන් අත්පත් කරගැනීම සඳහා බටහිර වාදීන් සිදුකල යුද්ධයන්ය. එහෙත් ඉස්ලාම් දහම (සටන් කිරීම) අනුමත කළේ තම දහම, මෙන්ම තම ජීවිත ආරක්ෂාව මෙන්ම තම සේසත සුරැකීම පිණිස පමණි.

එවන් වූ අනිවාර්ය යුදමය අවස්තාවකදී පවා මුස්ලිම්වරුන් සැල කරනු ලැබුවේ තම ප්‍රතිවාදීන් සමඟ යහපත් ලෙස කටයුතු කරන මෙන්ය. (එවැනි අවස්ථාවක) යුධ සිරකරුවන් එහිදී තම නිදහස දඩ මුදල් ගෙවීමෙන් නැතහොත් කියවීමට, ලිවීමට නොදත් කුඩා දරුවන් හට අධ්‍යාපනය ලබා දීමෙන් ලබා ගත හැකිව තිබුනි. ඉස්ලාම් දහම තුල දරුවෙකු ඔහුගේ මවගෙන්ද, භාර්යාවක් තම සැමියාගෙන්ද, සහෝදරයෙකු තම සහෝදරයාගෙන්ද (සාපරාදී ලෙස) වලක්වාලනු නොලැබුණි.

වහලුන්ගේ නිදහස සඳහා දැවැන්ත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක පටන් ගැනුණි. ආගමික වත්පිළිවෙත්හි ඇතිවෙන අඩු පාඩු ඌන පූර්ණ කිරීම සඳහා වහලුන් නිදහස් කිරීම. ඒ අතර; කවරෙකු කිසිම හේතුවකින් තොරව රමළාන් මස උපවාසය අත් හරින්නේද ඔහු වහලෙකු නිදහස් කළ යුතු වීම නොහැකි නම් වෙනත් දිනයක උපවාස රැකීම සිදු කළ යුතුයි. එමෙන්ම අනපේක්ෂිත ඝාතනයක් සිදුකළහොත් ඒ වෙනුවෙන්, එමෙන්ම සාවද්‍ය ලෙස දිවුරීම, එමෙන්ම තම භාර්යාව මවට සමාන කිරීම වැනි සිදුවූ අතපසුවීම් වෙනුවෙන් වන්දි ලෙස මෙවැනි අවස්ථා ගණනාවකදී (වහලුන් නිදහස් කිරීම) ප්‍රතිකර්ම ලෙස දැක්විය හැක.

ඉස්ලාමයේ පරමාර්ථය එකී පිළිකුල් සහගත ක්‍රමවේදය නිවැරදි ලෙස සහ කෙටි කාලයක් තුල සමාජයෙන් තුරන් කිරීමයි. එම නිසයි වහල් බවින් සිටි කාන්තාව බිහි කරන දරුවා වහලෙක් නොවේ, ඔහුව මිලට විකිණිය නොහැක යන නීතිය පනවනු ලැබුවේ.

එමෙන්ම ඒ වහල් කාන්තාව තමාගේ හාම්පුතා මියගියවිට ක්ෂණිකව වහල් බවෙන් නිදහස හිමිකරගනී. එවන් ක්‍රමයක් ඊට කලින් වූ දහම් වල නොතිබුණි. මක් නිසාදයත් එකී වහල් කාන්තාව තම හාම්පුතා නිසා දරුවෙකු ප්‍රසූත කළාය, එම නිසා ඇයට එම වරප්‍රසාදය හිමි විය. එමෙන්ම වහලෙකු හට තමාගේ හාම්පුතාට මුදල් දී තමාව නිදහස්කරගත හැක. නොඑසේනම් ඔහුට තම හාම්පුතා හට කිසියම් කාලයක් සේවය කර තමාගේ නිදහස පැතීමටද හැක.

ශුද්ධ වූ අල් කුර්ආන් 24:33 **විවාහ වීමට පහසුකම් නොමැත්තන්, අල්ලාහ් තම දායාදයෙන් ඔවුන්ව ධනවතුන් කරන තෙක් පතිවත රැකගත යුතුය. නුඹලාගේ වහලුන්ගෙන් කවරහු උරුම පත්‍රය (ලියවා) අයදින්ද, ඔවුන් හමුවෙහි නුඹලා යම්කිසි යහපතක් දුටුවේ නම් ඔවුනට ලියා දෙන්න. අල්ලාහ් නුඹලාටලබා දී ඇති සම්පත්වලින් නුඹලා ඔවුනට ලබාදෙන්න. පතිවත රැකගැනීමට ප්‍රියකරන වහල් ගැහැණුන්ව, මෙලොවෙහි අල්ප දෙයලබා ගැනීම පිණිස ලිංගික අපචාරයට බල නොකරන්න. කවුරුන් හෝ ඔවුනට බල කළේ නම්, ඔවුන් බල**

කරවනු ලැබූ පසුව නියතව අල්ලාහ් අධිකව සමා කරන්නාය; අසම දයාවන්තයාය.

තමාගේ නිදහස වහලෙකු ප්‍රිය කළේ නම් ඒ බව තම හාම්පුතාගෙන් ඉල්ලා සිටිය හැක. දෙපාර්ශවයෙහිම පොදු එකඟතාවයක් මත එසේ සිදු කිරීමෙන් ඔහුගේ හාම්පුතාද ඔහුගේ නිදහස වෙනුවෙන් උපකාර කරනු ඇත.

එමෙන්ම ඉස්ලාම් දහමෙහි පැහැදිලි නීතිය වන්නේ. මුස්ලිම් ජන සමාජයේ උපකාරය මත හෝ ඉස්ලාමීය රජයක් නම් රජයේ භාණ්ඩාගාරයෙන් ඔහුව නිදහස් කිරීමට කටයුතු කළ හැකි බවයි. එමෙන්ම පොදු භාණ්ඩාගාර මුදලින් ධර්ම දූත නබි මුහම්මද් (සල්) තුමාණන්ද වහලුන් නිදහස් කිරීමට කටයුතු කර තිබේ.

## 13. යුක්තියේ දහමයි ඉස්ලාම්.

**ඉස්ලාම් දහම බොහෝ ස්ථාන වල යුක්තිය සහ සෙසු අයගේ අයිතිවාසිකම් සුරැකීම තහවුරු කරයි. මන්දයත් යුක්තිය නොමැති වීම, අයිතිවාසිකම් නැතිවීම මත දූෂණය, භීෂණය සහ සම්බන්ධ කරනු ලැබී තිබේ.**

ශුද්ධ වූ අල් කුර්ආන් 7:85 **මද්යන් වැසියන්ට ඔවුන්ගේ සහෝදර ෂුඅයිබ්ව (දූතයා ලෙස යැව්වෙමු). ඔහු, 'මාගේ සමූහයනි! නුඹලා අල්ලාහ්ටම නැමදුම් කළ යුතුය. ඔහු හැර (සැබවින්ම) නැමදුම් ලැබීමට සුදුසු කෙනා නුඹලාට (වෙන කිසිවෙකු) නොමැත. නුඹලාගේ 'රබ්'ගෙන් පැහැදිලි සාක්ෂිය නියතව නුඹලාට පැමිණ තිබේ. එහෙයින්, මිනුමද කිරුමද පූර්ණව ඉටු කරන්න. ජනයාට ඔවුන්ගේ ද්‍රව්‍යන් අඩු නොකරන්න. පොළොවෙහි ප්‍රකෘතිමත් භාවය සිදු වූ පසු එහි කලහ ඇති නොකරන්න. නුඹලා විශ්වාසවන්තයින් වේ නම් මෙය නුඹලාට ශ්‍රේෂ්ඨ වන්නේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 5:8 **විශ්වාස කළවුනි! අල්ලාහ් වෙනුවෙන් නීතිය ඉටු කරන්නන් ලෙසද (එයට) සාක්ෂිකරුවන් ලෙසද සිටින්න. එක් කණ්ඩායමක් කෙරෙහි ඇති අප්‍රියතාවය, නුඹලා නීතිය ඉටු නොකර සිටීමට නුඹලාව නොපෙළඹවිය යුතුය.**

**නුඹලා නීතිය ඉටු කරන්න. එයම බිය බැති භාවයට ඉතා සමීප වේ. තවද, අල්ලාහ්ට බියවන්න. නියතව අල්ලාහ් නුඹලා කරන දෑ ගැන හොඳින් දන්නා වේ.**

ශුද්ධ වූ අල් කුර්ආන් 4:58 **භාරයෙහි ඇති දෑ එයට අයත්වූවන්ට භාර දෙන ලෙසද, ජනයා අතර නුඹලා විනිශ්චය ලබාදෙන්නේ නම් යුක්තිසහගතව විනිශ්චය ලබාදෙන ලෙසද නියතව අල්ලාහ් නුඹලාට අණ කරයි. නියතව අල්ලාහ් නුඹලාට දෙන උපදේශය වඩාත් හොඳ වේ. නියතව අල්ලාහ් හොඳින් සවන්දෙන්නා ලෙසද, බලන්නා ලෙසද සිටියි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 16:90 **නියතව අල්ලාහ් යුක්තිය( ස්ථාපිත කිරීම කෙරෙහිද), උපකාර කිරීම, මෙන්ම සමීප නෑදෑයන්ට (දාන මානයන්) දීම කෙරෙහිද ඔබලාට අණ කරයි. තවද ඔහු පහත් වදන්, පිළිකුල් සහගත දේවල්, මෙන්ම සීමාව ඉක්මවීම කෙරෙහිද වලක්වයි. නුඹලා උපදෙස් ලැබීම පිණිස අනුශාසනා කරයි.**

## 14. ඉස්ලාම් අයිතිවාසිකම් සුරකියි.
## - සෙසු අය කෙරෙහි තිබෙන අයිතිවාසිකම්.

ආදරය, ස්නේහය, මෘදු භාවය, හා සෙසු අයට ගරු කිරීම මත සමාජ යුතුකම් හා වගකීම් ගොඩනැංවිය යුතු බව ඉස්ලාම් දහම අප හට උගන්වයි. එමෙන්ම සමාජය හා සම්බන්ධ කරන සෑම යුතුකමක්, වගකීමක් පිළිබඳවම ප්‍රමිතීන් මෙන්ම පාලනයන් ඉස්ලාම් දහම තුල ඇති කර තිබේ.

ශුද්ධ වූ අල් කුර්ආන් 58:11 **විශ්වාස කළවුනි! 'සභාවන්හි ඉඩ ලබා දෙන්නැ' යි නුඹලාට පවසනු ලැබුවේ නම් නුඹලා ඉඩ ලබා දෙන්න. අල්ලාහ් නුඹලාට ඉඩ ලබා දෙන්නේය. නුඹලා, නැගී සිටින්නැ' යි පවසනු ලැබුවේ නම් එවිගසම නැගී සිටින්න. නුඹලාගෙන් කවරහු විශ්වාස කර, දැනුමද දෙනු ලැබ ඇත්තෝද ඔවුනට අල්ලාහ් තරාතිරම් උසස් කරන්නේය. තවද, අල්ලාහ් නුඹලා කරන දේ ගැන හොඳින් දන්නාය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 4:19 **විශ්වාස කළවුනි! ස්ත්‍රීන්ව බලහත්කාරයෙන් අයිති කරගැනීමට නුඹලාට අනුමැතිය නොමැත. ඔවුන් ප්‍රසිද්ධියේ යම්**

**නින්දාසහගත ක්‍රියාවක් කළේ නම් හැර ඔවුනට නුඹලා දුන් දෑයින් සමහරක් පැහැර ගැනීම සඳහා ඔවුනට හිංසා නොකරන්න. ඔවුන් සමඟ හොඳාකාරව ජීවත්වන්න. නුඹලා ඔවුන්ව අප්‍රිය කළද (ඉවසා ගන්න.) මන්ද, නුඹලා යමක් අප්‍රිය කළද, අල්ලාහ් එහි අධික යහපත තැබීමට පිළිවන.**

ශුද්ධ වූ අල් කුර්ආන් 4:36 **නුඹලා අල්ලාහ්ට නැමදුම් කරන්න. ඔහුට කිසිවක් සම නොකරන්න. තවද දෙමාපියන්, සමීප නෑයන් වන අසල් වැසියන්, නෑයන් නොවන අසල් වැසියන්, සමීපයෙහි සිටින යහළුවන්, මගීන්, නුඹලාගේ වහලුන් යනාදීන් සමඟ හොඳාකාරව ක්‍රියා කරන්න. නියතව අල්ලාහ් අහංකාරකම පෙන්වා, උඩඟුවන්නන්ට ප්‍රිය නොකරන්නේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 24:27 **විශ්වාස කළවුනි! නුඹලාගේ නිවෙස් නොවන කවර නිවෙස්වලට වූවද නුඹලා අනුමැතිය නොඉල්වාද, එහි සිටින්නන්ට සලාමය නොපවසාද ඇතුළු නොවිය යුතුයි. නුඹලා උපදෙස් ලැබීමට මෙයම නුඹලාට ශ්‍රේෂ්ඨ වේ.**

ශුද්ධ වූ අල් කුර්ආන් 24:28 **නුඹලා එහිදී කිසිවෙකුව නොදුටුවේ නම්, නුඹලාට අනුමැතිය ලබා දෙන තෙක් නුඹලා එහි ඇතුළු නොවිය යුතුය. නුඹලා උපදෙස් ලැබීමට මෙයම නුඹලාට ශ්‍රේෂ්ඨ වේ.**

ශුද්ධ වූ අල් කුර්ආන් 49:6 **විශ්වාස කළවුනි! පව්කාරයෙක් නුඹලා හමුවට යම් පුවතක් ගෙන ආවේ නම්, පැහැදිලිතාවය ලබා ගන්න. (මක්නිසාද යත්) නුඹලා නොදන්නා හේතුවෙන් සමූහයකට නපුරක් කරන්නෙහුය. එනිසා නුඹලා කළ දෙය වෙනුවෙන් නුඹලා ශෝකයට පත්වූවන් ලෙස වන්නෙහුය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 49:9 **විශ්වාසවන්තයින්ගෙන් දෙපිරිසක් තමන් අතර රණ්ඩු කරගත්තේ නම්, ඔවුනතර සුහදතාවයක් ඇති කරන්න. ඔවුන්ගෙන් පිරිසක් අනෙක් පිරිස කෙරෙහි සීමාව ඉක්මවා ක්‍රියා කළේ නම්, අල්ලාහ්ගේ අණ කරා හැරෙන තෙක් සටන් වදින්න. ඔවුන් (කීකරු වී) පැමිණියේ නම් ඔවුනතර යුක්තිය මගින් සුහදතාවය ඇති කරන්න. තවද, යුක්තිගරුකව ක්‍රියා කරන්න. නියතව අල්ලාහ් නීතිය ඉටුකරන්නන්ට ප්‍රිය කරයි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 49:10 **විශ්වාසවන්තයින් සියලු දෙනාම සහෝදරයින්මය! එහෙයින්, නුඹලාගේ සහෝදරයින් දෙදෙනෙකු අතර සුහදතාවය ඇති කරන්න. නුඹලා ආශිංසණය ලබනු පිණිස අල්ලාහ්ට බියවී ක්‍රියා කරන්න.**

ශුද්ධ වූ අල් කුර්ආන් 49:11 **විශ්වාස කළවුනි! කණ්ඩායමක් තවත් කණ්ඩායමක් සමච්චල් නොකළ යුතුය. මොවුන්ට වඩා ඔවුන් ශ්‍රේෂ්ඨයින් විය හැකිය. කවර ස්ත්‍රියක් වූවද තවත් ස්ත්‍රියක්ව**

**(සමච්චල් නොකරන්න.) මොවුනට වඩා ඔවුන් ශ්‍රේෂ්ඨ විය හැකිය. නුඹලා, නුඹලා අතර දොස් පැවරීම් නොකරන්න. තවද, විකට නම් වලින් නොඅඬගසන්න. විශ්වාස කළ පසු නපුරු නම් තැබීම වඩාත් නපුරක් වේ. කවරහු (මේවායින්) නොමිදුනෝද ඔවුන් අපරාධකාරයින්ය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 49:12 **විශ්වාස කළවුනි! සිතුවිලි අතරින් බොහෝ දෙයින් වැලකී සිටින්න. නියතව සිතුවිලි අතරින් සමහර ඒවා පාප වේ. තවද, නුඹලා රහසිගතව පරීක්ෂා නොකරන්න. තවද, නුඹලාගෙන් සමහරු තවත් සමහරුන් ගැන කේලාම් කීම් නොකළ යුතුය. නුඹලාගෙන් කවරෙක් හෝ තම මළ සහෝදරයාගේ මාංශය අනුභව කිරීමට ප්‍රිය කරන්නේද? නුඹලා එය පිළිකුල් කරන්නෙහුය. තවද, අල්ලාහ්ට බියවී ක්‍රියා කරන්න. නියතව අල්ලාහ් අධිකව සමා කරන්නාය; අසම දයාවන්තයාය.**

අනස් ඉබ්නු මාලික් (රළි) තුමන් වාර්තා කරයි. නබි තුමාණන් පැවසූහ : ((තමා ප්‍රියකරන දෙය තම සහෝදරයාට පිළිගන්වනතෙක් ඔබලාගෙන් කිසිවෙකු (නියම) විශ්වසවන්තයෙකු වන්නේ නැත.)) මූලාශ්‍ර ග්‍රන්ථය: බුහාරි සහ මුස්ලිම්

## - දෙමව්පියන් හට හිමිවෙන සුවිශේෂී ස්ථානය.

ශුද්ධ වූ අල් කුර්ආන් 17: 23 – 24
**23. නුඹගේ 'රබ්' තමාට හැර (වෙන කිසිවෙකුටත්) නුඹලා නැමදුම් නොකළ යුතු යැයිද, දෙමාපියන්ට යහකම් කරන ලෙසද, දෙමාපියන්ට යහකම් කරන ලෙසටද අණ කර ඇත්තේය. එම දෙදෙනාගෙන් කෙනෙක් හෝ නැතිනම් එම දෙදෙනාම හෝ නුඹ හමුවෙහි මහලු බවට පත්වූයේ නම්, ඔවුන් දෙස බලා, 'උෆ්' (චි) යැයි පැවසීම හෝ එම දෙදෙනාවම එළවීම හෝ නොකළ යුතුය. එම දෙදෙනාටම යහපත් වදනම පවසන්න! 24. නුඹ එම දෙදෙනා වෙනුවෙන් කරුණාව සමඟ නිහතමානී බව නැමති පියාපත පහත් කරන්න! 'මාගේ 'රබ්'! බාලවියේ සිටි කල එම දෙදෙනාම මාව රැක බලාගත්තා සේ එම දෙදෙනාටම නුඹ කරුණාව පහළ කරනු මැනවි'යි පවසන්න.**

ශුද්ධ වූ අල් කුර්ආන් 46:15 **මිනිසා තමාගේ දෙමාපියන්ට උපකාර කළ යුතු යි, අපි උපදෙස් දුනිමු. ඔහුගේ මව ඔහුව දුෂ්කරතාවයෙන්ම දරාගෙන, ඔහුව අපහසුවෙන් ප්‍රසූත කළාය. ඔහුව (ගර්භාෂයෙහි) දැරීම හා ඔහුට කිරි වැරීම මාස තිහක් වේ. ඔහු තම තරුණ බවට පූර්ණව පිවිස, සතලිස් වියට පැමිණෙන කල, 'මාගේ 'රබ්'! නුඹ මට හා මාගේ දෙමාපියන්ට කළ අනුග්‍රහවලට මා තුති කිරීම පිණිසද, නුඹ තෘප්තිමත් වන යහකම් මා**

**කිරීම පිණිසද මට ආශිංසණ පහළ කරනු මැනවි! මට මාගේ පෙළපත ප්‍රකෘතිමත් කර දෙනු මැනවි! නියතව මම නුඹගෙන් සමාව අයැද හැරුණෙමි. නියතව මා මුලුමනින්ම යටත් වූ කෙනෙකු වූයෙමි යි (ප්‍රර්ථනා කර) පවසන්නේය.**

## - දාතීන්ගේ අයිතිවාසිකම්.

ශුද්ධ වූ අල් කුර්ආන් 17:26 **තවද, සමීප නෑයන්, දුප්පතුන්, මගීන් යනාදින්ගේ අයිතීන් ලබා දෙන්න! නුඹ නාස්ති නොකරන්න.**

නබි මිත්‍ර අබූ හුරෛරා (රළි) තුමන් වාර්තා කරයි: නබි මුහම්මද් (සල්) තුමන් : ((**අල්ලාහ් මත දිවුරා පවසමි ඔවුහු විශ්වාස නොකළෝය, ඔවුහු විශ්වාස නොකළෝය, ඔවුහු විශ්වාස නොකළෝය.**)) යැයි වරක් පැවසුවා. එවිට ධර්ම දූතයාණන් : ඔවුහු කව්රුන්ද යයි, රැස්ව සිටි මිත්‍ර සහාබාවරුන් විමසූ විට ((තම අසල්වැසියා තමාගේ හිංසා පීඩාවන්ගෙන් ආරක්ෂාව නොලබන පුද්ගලයා වේ.)) යනුවෙන් පැවසූහ. මූලාශ්‍ර ග්‍රන්ථය : බුහාරි මුස්ලිම් (මුත්තෆකුන් අලෛහි)

නබි මිත්‍ර ජාබිර් (රළි) තුමන් වාර්තා කරයි: නබි මුහම්මද් (සල්) තුමන් පැවසුවා : ((අසල්වැසියෙකු හට තම සහොදර අසල්වැසියා වෙනුවෙන් මැදිහත් වීමට වැඩි අයිතියක් ඇත. තම සහෝදර අසල්වැසියා නොසිටියත්, ඔවුන් දෙදෙනා භාවිතා කරන්නේ එකම මාර්ගයක් නම්, (එම අයිතිය ඔහුට තිබේ). මූලාශ්‍ර ග්‍රන්ථය : මුස්නද් අහමද්

නබි මිත්‍ර අබූ ස(z)ර් (රළි) තුමන් වාර්තා කරයි: නබි මුහම්මද් (සල්) තුමන් පැවසුවා : අබූ ස(z)ර්! ඔබ යම් ව්‍යංජනයක් (හොද්දක්) හැදුවේ නම් එයට මදක් ජලය වැඩිකොට එය ඔබේ අසල්වැසියාටත් ලබා දෙන්න. මූලාශ්‍ර ග්‍රන්ථය : මුස්ලිම්

නබි මිත්‍ර ඉබ්නු අබ්බාස් (රළි) තුමන් වාර්තා කරයි: ((කවරෙකුට ඉඩමක් තිබී ඔහු එය විකිණීමට තීරණය කරයි නම් ප්‍රථමයෙන් එය තම අසල්වැසියාට (විකිණීම සඳහා) ඉදිරිපත් කරන්වා.)) මූලාශ්‍ර ග්‍රන්ථය : සුනන් ඉබ්නු මාජා

## - අනාථ දරුවන්ගේ අයිතිවාසිකම්.

ශුද්ධ වූ අල් කුර්ආන් 93:9 **එහෙයින්, නුඹ අනාථ දරුවන්ට අප්‍රසන්නතාවය නොපෙන්විය යුතුයි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 2:220 **මෙලොවටද එලොවටද ඵල ලබා දෙන දේ ගැන (මෙසේ පැහැදිලි කරයි.) තවද, අනාථ දරුවන් ගැනද නුඹගෙන් විමසති. ඔවුනට නියමිත ප්‍රකෘතිමත් කිරීම් සිදුකිරීම හොඳය! නුඹලා ඔවුන් සමඟ එක් වී ජීවත් වන්නේ නම් (ඔවුන්) නුඹලාගේ සහෝදරයින් වේ. තවද, ප්‍රකෘතිමත් කරන්නාගෙන්, කලහ ඇති කරන්නාව අල්ලාහ් හොඳින් දනියි. අල්ලාහ් සිතා සිටියේ නම් නුඹලාට දුෂ්කරතාව ඇති කර තිබෙන්නේය. නියතව අල්ලාහ් සියල්ල අභිභවූ කෙනාද අධික ඥානවන්තයාද වන්නේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 4:8 **(දේපළ) බෙදාදීමේ දී (උරුමකරුවන් නොවන) නෑයන්, අනාථයින්, දුප්පතුන් යනාදීන් පැමිණියේ නම් එයින් ඔවුනටද (ස්වල්පයක්) දෙන්න. තවද ඔවුනට ප්‍රිය වදන්ම පවසන්න.**

## - සතා සිව්පාවුන්ගේ අයිතිවාසිකම්.

ශුද්ධ වූ අල් කුර්ආන් 6:38 **පොළොවෙහි ඇති ජීවීන්ද, තම පියාපත් ජෝඩුවලින් ඉගිලෙන පක්ෂීන්ද, නුඹලා වැනි සමූහයන්ය! (ආරක්ෂා කරනු ලැබූ) සටහන්**

**ලේඛණයෙහි අප කිසිවක් අත් හැර දැම්මේ නැත. පසුව ඔවුහු තමන්ගේ 'රබ්' වෙත එක්රැස් කරවනු ලබන්නෝය.**

නබි මිත්‍ර අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රලි) තුමන් වාර්තා කරයි: නබි මුහම්මද් (සල්) තුමන් පැවසුවා :((පූසෙකු හේතුවෙන් කාන්තාවක් වේදනාවට ලක්කරනු ලැබීය. ඇය මිය යාම දක්වා (එම පූසාව) සිරකර තැබුවාය. ඒ හේතුවෙන් ඇය අපායට පිවිසීය. ඇය එම පූසාව සිරකර තැබූ පසු, (එම පූසාට) ආහාර සැපයුවේද නැත, එමෙන්ම ඇය ජලය ලබා දුන්නේද නැත. එමෙන්ම ඇය එම පූසාව පොළොවේ ආහාර සොයා අනුභව කිරීමට සැලැස්වූයේද නැත)) මූලාශ්‍ර ග්‍රන්ථය : බුහාරි මුස්ලිම් (මුත්තෆකුන් අලෛහි)

නබි මිත්‍ර අබූ හුරෛරා රලි තුමන් (රලි) තුමන් වාර්තා කරයි: නබි මුහම්මද් (සල්) තුමන් පැවසුවා : ((පුද්ගලයෙකු (දැඩි) පිපාසය නිසා පස් කන සුනඛයෙකු දුටුවේය. ඔහු තම සපත්තුවක් රැගෙන එය පුරවා වතුර ගෙනවිත් එම සුනඛයාගේ පිපාසය

සංසිදුවිය. ඉන් පසු ඔහු අල්ලාහ් වෙත ප්‍රර්ථනා කළේය. එවිට අල්ලාහ් ඔහුව ස්වර්ගයට පිවිසෙන්නට සැලස්වීය)) මූලාශ්‍ර ග්‍රන්ථ : බුහාරි සහ මුස්ලිම්

නබි මිත්‍ර අබූ යඃලා (රළි) තුමන් වාර්තා කරයි: නබි මුහම්මද් (සල්) තුමන් පැවසුවා : ((නියතව අල්ලාහ් සෑම දෙයකම "ඉහ්සානය" (ප්‍රවීණතාවය, පරිපූර්ණත්වය) නියම කර තිබේ, එම නිසා ඔබ සත්වයෙකු ඝාතනය කළේ නම් යහපත් ක්‍රම අනුගමනය කරන්න, බිලි දුන්නේ නම් යහපත් ආකාරයට බිලි දෙන්න, ඔහු තම පිහිය මුවහත් කර ගනිත්වා! (තමා විසින් කපන) තම සත්වයා සැහැල්ලු කරත්වා)) මූලාශ්‍ර ග්‍රන්ථය : මුස්ලිම් **(14)**

---

14 මස් මාංශ යනු (පුද්ගලයෙකුට) ප්‍රෝටීන් ලබාගත හැකි මූලික මඟකි. මිනිසා සතුව පැතලි හා උල් වූ දත් පිහිටා තිබේ. මෙම දත් වර්ග දෙකම මස් ඉරීමට සහ හැපීමට උපකාරී ලෙස ආකෘතිකරණය වී තිබේ. එමෙන්ම අල්ලාහ් මිනිසාට මස් මාංශ මෙන්ම ශාක හැපීමට හැකි ආකාරයේ දත් නිර්මාණය කර තිබේ. එමෙන්ම ආහාර ජීර්ණ පද්ධතියද ඊට සරිලන ආකාරයට සකස් කොට, ශාක කොටස් මෙන්ම සහ සත්ව මාංශ දිරවන ආකාරයට හැඩගස්වා තිබේ.

## 15. ඉස්ලාම් දහම සමකාලීන ගැටළු විසඳයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 7:56 **පොළොවෙහි ප්‍රකෘතිමත් බව ඇති වූ පසු නුඹලා එහි කලහ ඇති නොකරන්න. බියෙන් යුතුවද ආශාවෙන්ද ඔහුව අඬගසන්න. නියතව අල්ලාහ්ගේ කරුණාව, යහකම් කරන්නන්ට සමීපව ඇත්තේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 30:41 **මිනිසුන්ගේ අත් උපයා ගත් දේ හේතුවෙන් ගොඩබිමෙහිද මුහුදෙහිද කලහ ඇති වී තිබේ. ඔවුන් (පාපයෙන්) ආපසු හැරීම පිණිස (මේ අන්දමට සෝදිසි කරයි.)**

## 16. යුද සිරකරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ න්‍යායන් හේතුවෙන් ඉස්ලාම් දහම ඉහළ ස්ථානයක වැජඹේ.

මුහම්මද් (සල්) තුමන් තම අනුගාමිකයන් හට යුද සිරකරුවන් සමඟ යහපත් ලෙස කටයුතු කරන මෙන් අණ කළේය. තමන්ට පෙර ඔවුන්ට අහාරපාන මෙන් ඇඳුම් පැළඳුම් ලබා දෙන මෙන් අණ කළේය.

ශුද්ධ වූ අල් කුර්ආන් 76:8 – 9
8. **තවද ඔවුහු, ප්‍රියකරන ආහාරය (අල්ලාහ් වෙනුවෙන්) දුප්පතාටද, අනාථ දරුවාටද, සිරකරුවාටද ලබා දෙන්නෝය.**
9 **අපි නුඹලාට අල්ලාහ්ගේ (කීර්තිමත්) මුහුණ උදෙසා ආහාර ලබාදෙමු. අපි නුඹලාගෙන් කවර කුලියක් හෝ තුති කිරීමක් හෝ අපේක්ෂා නොකළෙමු (යිද,)**

(යුදමය අවස්ථාවන් වල) තමන් වෙත භාර වූ සතුරන් වෙත කරුණාව දක්වන මෙන් ඉස්ලාම් දහම මුස්ලිම්වරුන් හට අණ කරයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 9:6 **සම කරන්නන්ගෙන් කවරෙක් හෝ නුඹගෙන් අභය පැතුවේ නම්, ඔහු අල්ලාහ්ගේ වදනට සවන්දෙන තෙක් ඔහුට අභය ලබා දෙන්න. පසුව ඔහු ආරක්ෂාකාරී වන ස්ථානයෙහි ඔහුව භාරදෙන්න. නියතව ඔවුන් නොදත් සමූහයා ලෙස සිටීම මෙයට හේතුවය.**

යුධමය අවස්ථාවන් වල ස්ත්‍රීන්, දරුවන්, ආබාධිතයන්, රෝගීන්, ආගමික නායකයන්, මෙන්ම මහලු අය, ඝාතනය කිරීමෙන්

වැලැක්වීම. මක් නිසාදයත් ඔවුන් (සතුරු සේනාවක) සටන්කරුවන් නොවේ.

### 17. ඉස්ලාම් දහමෙහි ක්‍රමවත් මූල්‍ය පද්ධතිය ආර්ථිකයෙහි ස්ථාවර භාවය ඇති කිරීමට මඟ පාදයි.

**මුදල් පිළිබඳ සංකල්පය නම් එය ව්‍යාපාර සඳහා, භාණ්ඩ හුවමාරුව සඳහා, සේවාවන් සැපයීම සඳහා, ගොඩනැඟිලි සහ සංවර්ධන කටයුතු සඳහා (අවශ්‍ය වෙන සාධකයකි). මුදල් ඉපයීම සඳහා මුදල් ණයට ලබා දුන්නේ නම්, අප මූලික අවශ්‍යතාවයක් සඳහා මුදල් යෙදවූ බවයි එයින් කියවෙන්නේ. භාණ්ඩ හුවමාරුව වෙනුවෙන් සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් වූ විකල්පයක් ලෙසින් අප මුදල් භාවිතා කරන්නේ මුදල් වල ප්‍රධානතම පරමාර්ථය ලෙසයි.**

නියත වශයෙන්ම ණය මුදල් කෙරෙහි අනිවාර්ය කරනු ලබන පොලිය ණයකරුවන්

හට ලබා දෙනු ලබන්නේ (පොලිය යනු) ගත් ණය පියවීම සඳහා කෙරෙනි දිරිගැන්වීමකි, එම පොලී කිසිම ආකාරයකින් පාඩුවක් නොවේ යයි පවසමින්ය. නමුත් වසර කීපයක් ගෙවී යාමත් එකපිට එක ගොඩගැසෙන එම පොළිය දුප්පතුන් පොහොසතුන් අතර පැහැදිලි පරතරයක් පෙන්නුම් කරයි. අවසන් දශක කීපයක් තුල රාජ්‍ය සහ පුද්ගලික ආයතනද මෙයට විශාල ලෙස සම්බන්ද වී ඇත. සමහර රටවල ආර්ථික ක්‍රමයේ බිඳ වැටීම් උදාහරණ ගණනාවක් අප දැක ඇත්තෙමු. නියත වශයෙන්ම අන් කිසිම අපරාධයකට කළ නොහැකි අති දැවැන්ත (සමාජ) දූෂණ පහසුවෙන්ම පොලිය විසින් පතුරුවා හරිනු ලබයි. (15)

---

15. ක්‍රිස්තියානි දහමට අනුව පොලිය යනු හෙළාදැකිය යුතු දෙයක් බව තෝමස් ඇක්වයිනාස් (කිතුනු දහම හැදෑරූ විද්වතෙක්) පවසනවා. දෙවන සියවසෙහි (කිතුණු) ආගමික නායකයන්ගේ (එකමුතුව) තම අනුගාමිකයන් හට පොලිය තහනම් කිරීමෙන් අනතුරුව පොලියෙහි ලෞකීය මෙන්ම ධාර්මික පැතිකඩ පිලිබඳ සැලකිල්ලට ගත් කිතුණු සභාව විසින් පොලිය තහනම් කරන ලදී. තෝමස් ඇක්වයිනාස්ගේ මතයට අනුව පොලිය තහනම් කිරීමට හේතු වූ කරුණු කාරණා අතුරින්,

**ණය ලබා දුන් තැනැත්තා විසින් කල් ලබාදීම වෙනුවෙන් අය කරනු ලබන පොලිය කිසිම විටක සාධාරණ එකක් නොවේ. මක්නිසාද යත් අය කරනු ලබන එම පොලිය අය කරනු ලබන්නේ කාලයට සාපේක්ෂවයි, එමෙන්ම ඔවුහු එය දකින්නේ ව්‍යාපාරික ගනු දෙනුවක් ලෙසයි. නමුත් ඈත අතීතයේ දාර්ශනියකෙකු වූ ඇරිස්ටෝටල් විශ්වාස කළේ මුදල් යනු හුවමාරුව සඳහා වෙන විකල්පයක් මිස එමඟින් මුදල් ඉපයීම නොවේ, යනුවෙන්ය. එමෙන්ම එය සමාජය තුල ධනවතුන් දුප්පතුන් අතර සුලභව භාවිතා කරනු ලැබූවත් පොලිය පිලිබඳ ප්ලේටෝගේ මතය වූයේ එය සූරාකෑමක් ලෙසයි. ග්‍රීකයින්ගේ කාලයේ පොලිය රජකළේය. එකල ණයකරු විසින් ගනු ලැබූ ණය පියවීමට නොහැකි වුවහොත් ණය ලබා දුන් තැනැත්තා ඔහුව කඩවීදියට ගෙනගොස් විකුණා දැමීමට කටයුතු කළේය. රෝමානුවන් අතරත් එහි විශාල වෙනසක් නොතිබුණි. මෙම කරුණු කාරනා පිලිබඳ පිරික්සීමේ දී, පොලිය තහනම් දෙයක් බවට පත් කරන ලද්දේ දහම් නිසාම නොවේ යයි විශේෂයෙන් සඳහන් කල යුතුයි. ක්‍රිස්තියානි දහමේ සම්ප්‍රාප්තියට ප්‍රථම සියවස් තුනකට පෙර සිටම මෙම පොලිය තහනම් දෙයක් බවට පත්වී තිබුණි. එමෙන්ම ඉන්ජීල් (නොහොත් බයිබලයෙහි මෙන්ම) ඊට කලින් පහල කරනු ලැබූ තව්රාත් තුලද මෙම පොලිය තහනම් කරනු ලැබූ දෙයකි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 3.130 **විශ්වාස කළවුනි! නුඹලා ප්‍රගුණයෙන් අධික වන පොලිය අනුභව නොකරන්න. නුඹලා ජය ලැබීම පිණිස අල්ලාහ්ට බිය වී ක්‍රියා කරන්න.**

ශුද්ධ වූ අල් කුර්ආන් 30.39 **මිනිසුන්ගේ සම්පත් සමඟ (නුඹලාගේ සම්පත) අධික වීම පිණිස නුඹලා පොලියට දුන්නේ නම් (එය) අල්ලාහ් ඉදිරියේ වර්ධනය නොවේ. (එනමුත්) අල්ලාහ්ගේ (කීර්තිමත්) මුහුණ අපේක්ෂා කර, නුඹලා (z)සකාතය දුන්නේ**

**නම් එවැන්නන් කීප වතාවකින් අධික කරගත්තවුන් වන්නෝය.**

## 18. ඉස්ලාම් දහම ධනය මෙන්ම නිරෝගීභාවය සුරකියි.

නියතව අල්ලාහ් තම මැවීම් වෙත දක්වන කරුණාව මෙන්ම මෘදුවන් භාවය මත සෑම (වර්ගයේම ගුණ) යහපත් ආහාරයක්ම අනුභව කිරීම සඳහා අප හට අනුමැතිය ලබා දී ඇත. එමෙන්ම සෑම අහිතකර ආහාරයක්ම අනුභවයෙන් වලක්වාලනු ලැබ ඇත්තෙමු.

ශුද්ධ වූ අල් කුර්ආන් 7.157 **ඔවුහුම (සාක්ෂරතා දැනුම නැති එනම්) උම්මි නබි වන මෙම දූතයාව පිළිපදින්නෝය. ඔහු සම්බන්ධව ලියවා තිබෙන දේ, තමන් හමුවෙහි ඇති තව්රාතයෙහිද ඉන්ජීලයෙහිද දැකගන්නෝය. ඔහු ඔවුනට යහපත අණ කර, අයහපතෙන් ඔවුන්ව වළක්වන්නේය. තවද, ඔවුන්ගේ ඉසුලුමද, ඔවුන් මත තිබූ විලංගුද ඔවුන්ගෙන් ඉවත් කරන්නේය. කවරහු ඔහුව විශ්වාස කර, ඔහුව ගෞරවයට පත් කර, ඔහුට උදවුද කර, ඔහුට පහළ කර ඇති (කුර්ආනය නමැති) ආලෝකයද පිළිපදිත්ද ඔවුන්ම ජයග්‍රාහකයින්ය.** (16)

ශුද්ධ වූ අල් කුර්ආන් 2.219 **(ඕ:නබි!) සුරාව හා, සූදුව ගැන ඔවුහු නුඹලාගෙන් අසති. 'ඒ දෙකෙහිම මහත්වූ හානියක්ද, මිනිසුන්ට (සමහර) ප්‍රයෝජනද ඇත. නමුත් ඒ දෙකෙහි ප්‍රයෝජනයට වඩා ඒ දෙකෙහි හානිය අධික වේ' යැයි පවසන්න! තවද, තමන් කුමක් වියදම් කළ යුතුදැයිද නුඹගෙන් අසති. '(අවශ්‍යතාවට හැර) ඉතිරිව ඇති දෙය 'යි පවසන්න! නුඹලා සිතා බැලීම පිණිස අල්ලාහ් නුඹලාට මෙසේ වැකි පැහැදිලි කරයි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 5.90 විශ්වාස කළවුනි ! **මත් පැන් (බීම)ද, සූදු සෙල්ලමද, (නැමදුම් කිරීම සඳහා) සිටවනු ලැබූ ඒවාද, නිමිති බලන ඊතලද පිළිකුල් කළ යුතු ෂෙයිතාන්ගේ ක්‍රියාවල ඇති ඒවාය. එහෙයින්, නුඹලා ජය ලැබීම පිණිස ඒවායින් වැලකී සිටින්න. (17)**

---------------------------------------------------

**16. ඌරා අපිරිසිදු සතෙකි. එහි මාංශය මිනිසාට හානිකරයි. එය අපවිත්‍රයෙහි ජීවත්වෙයි. ස්වාභාවිකවම මිනිසා එයට ලංවීම, ස්පර්ශ කිරීම පවා පිළිකුල් කරයි. එමෙන්ම එය අනුභව කරන පුද්ගලයා සමබර නොවන කෙනෙකකු නොවේ යන්නට එයම කදිම සාධකයකි. ඌරා පිලිබඳ නවීන විද්‍යාව තුලින් කරුණු ගණනාවක් තහවුරු කොට තිබේ. ඒ අතරින් ඌරු මස් අධි මේදය සහිත බවත්, සෙසු ආහාර වල අන්තර්ගත වෙන මේද සහ අම්ල සමඟ සසදන කළ ඉහළ ඝනත්වයෙන් යුතු මේද සහ අම්ල ප්‍රමාණයක්ද එහි අන්තර්ඝතයි. මහා බඩවැලේ, ගුද මාර්යේ සහ පුරස්ථි ග්‍රන්ථියේ පිළිකා ඇති වීමට දායක වෙයි. එහි රුධිරය තරබාරුවට මෙන්ම ප්‍රතිකාර කිරීමට අපහසු ඒ ආශ්‍රිත රෝග ගණනාවකට මඟපාදයි.**

**17. ඇල්කොහොල් භාවිතය හේතුවෙන් පුද්ගලයෙකුට සංවේදී භාවය නැතිවී යනු ඇත. එමෙන්ම එය මිනිසාගේ හැසිරීම**

අසාමාන්‍ය කරයි. ඔහුගේ දුර්ගුණාංගයන් ඔහුට අනේක සතුරන් බිහි කරයි. තම නිවැසියන් මෙන්ම තම මිතුරන්ව පවා ඝාතනය කිරීමට හේතු කාරණා වෙයි. සූදුවද එහි නිරත වන්නන් අතර සතුරුකම් ඇති වීමට හේතු කාරණා වෙනු ඇත.

## 19. ඉස්ලාම් දහම කාන්තා අයිතිවාසිකම් සුරැකීමෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානය අභිබවයි.

හුඟක් දෙනෙකු නොදන්නා කරුණක් නම් මුස්ලිම් කාන්තාවක් ඇය තමාට ඉස්ලාම් දහම තුල හිමිවෙන වරප්‍රසාද අත්හැර එක්සත් ජාතීන්ගේ සංගමයෙන් තමාගේ අයිතිවාසිකම් ඉල්ලා සිටින විට ඇයට අත් වන්නේ පාඩුවකි. මන්දයත් ඉස්ලාම් දහම තුල ඇය වැඩි වරප්‍රසාද ලබමින් ජීවත් වන්නීය.

ඉස්ලාම් දහමට පෙර කාන්තාව වෙළෙඳ භාණ්ඩයක් ලෙස සලකනු ලැබීය. ඇය වෙළෙඳ භාණ්ඩයක් ලෙස ප්‍රදර්ශනය කෙරුණි, නැත්නම් ඇයගේ අනුමැතියකින් තොරව, ඇයගේ හැඟීම්ද නොසලකමින් කැමති කෙනෙකුට ඇයව විවාහය සඳහා කැඳවාගෙන යා හැකිව තිබුණි.
පිරිමියා මෙන් සම අයිතිවාසිකම් තමන්ටද තහවුරු කරන ලෙස ඉල්ලමින් මෙම කාල

වකවානුවේ කාන්තාවන් දැඩි පරිශ්‍රමයක් දරයි. නමුත් නිදර්ශනය කවරේදයත් තමාට හිමි විශිෂ්ඨ මෙන්ම සුවිශේෂී ස්ථානය ඇය එමඟින් අහිමි කරගන්නා බවයි.

අල්ලාහ් ඇයව සුවිශේෂී කාර්යයන් සඳහා නිර්මාණය කළේය. ඒ අතරින් දරු ප්‍රසූතිය, ස්වභාවික මව් කිරි දීම, දරුවන් බලාගැනීම, වැනි තවත් බොහෝ සුවිශේෂී කර්තව්‍යන් ඒ අතර වේ.

සකල ලොව පරිපාලනය කරන්නා වූ අල්ලාහ් ඉදිරියේ අනිවාර්ය වන්දනාවන් ඉටුකිරීම පිලිබඳ පිරිමින් හා කාන්තාවන් එක සමාන අය ලෙස සලකනු ලබයි. ඔවුන්ගෙන් අපේක්ෂා කරනු ලබන්නේ වන්දනාවන් නිසි ලෙස ඉටු කල යුතුයි යන්නයි. උදාහරණ ලෙස, සලාතය, සකාතය, මක්කාව වෙත ගොස් හජ් වන්දනාව ඉටු කිරීම සඳහන් කල හැක.

නියතව ඉස්ලාම් දහම ඉපැරණි අරාබි සංස්කෘතීන් හා සංසන්දනය කිරීමේදී කාන්තාවගේ තත්වය යහපත් එකක් බවට පත් කොට තිබේ. ඒ අතරින් ගැහැණු දරුවන් පණපිටින් වැළලීම තහනම් කළේය. කාන්තාවට ස්වාධීන පෞරුෂත්වයක් ලබා දුන්නේය. ගිවිසුම්ගත කරුණු මත පදනම් කරුණු ක්‍රමානුකූල එකක් බවට පත් කළේය. ඒ අතරින් විවාහය මත ඇයට හිමිවිය යුතු (මහර් නමැති) විවාහ තෑග්ග පිලිබඳ වගකීම සුරක්ෂිත එකක් බවට පත් කළේය. දේපොළ උරුමය පිලිබඳ ඇයට හිමිවිය යුතු අයිතිවාසිකම් සුරක්ෂිත එකක් බවට පත් කළේය. ඇයගේ පෞද්ගලික දේපොළ පිලිබඳ අයිතිවාසිකම් සුරැකීමට කටයුතු කළේය. එමෙන්ම තමාගේ සම්පත් කළමනාකාරීත්වය සඳහා නිදහස තහවුරු කළේය.

ඉස්ලාමයට පෙර කාන්තාව දේපොළ වලට උරුමකම් කීමෙන් වලක්වනු ලැබුවා. ඉස්ලාමයේ පැමිණීමත් සමඟ ඇයටත්

දේපොළ සඳහා උරුමකම් කීමට අවස්තාව හිමිවිය. එපමණක් නොව දාතීත්වය සහ පෙළපත මත පිරිමියාට වඩා වැඩි කොටසක් කාන්තාව හිමි කරගෙන සිටී. කාන්තාවට අවස්ථා 30 කදී මෙන්ම පිරිමියා අවස්ථා හතරකදීද එවැනි සුවිශේෂී කොටස් හිමි කරගෙන සිටින්නෝය. **(18)** එමෙන්ම කාන්තාවට ඇය දික්කසාද කරනු ලබන අවස්ථාවන්හි, මෙන්ම සැමියාගේ වියෝවෙන් පසු ඇයට සැමියාගේ නිවසේ රැඳී සිටිය හැක. එමෙන්ම ඇය මෙන්ම ඇයගේ දරුවන් ද මූල්‍යමය උපකාර කරනු ලැබීමට සුදුසුකම් ලබන්නිය.

---

18. පුද්ගලයෙකු පිරිමි දරුවෙකු සහ ගැහැණු දරුවෙකු හැර මිය ගියේ නම්, එහි පිරිමි දරුවා ගැහැණු දරුවා මෙන් දෙගුණයක් කොටස් හිමිකරගනී, කෙසේ නමුත් පිරිමියා (ගැහැණු දරුවා) මෙන් නොව ඔහු (තම භාර්යයාවට), ඔහුගේ දරුවන්ට වියදම් කිරීමේ වගකීම ඔහු සතුයි.තවත් පැතිකඩකින් බලන කළ කාන්තාව තම සැමියාගේ පැත්තෙන්ද ඇගේ දරුවන් සමග කොටස් හිමිකර ගනී. එමෙන්ම එම කාන්තාව හිමිකරගන්නා කොටස් ඇයගේ පෞද්ගලික දේපොළ වේ. ඇයගේ කැමැත්ත පරිදි එම දේපොළ පරිහරණය කල හැක. දැඩි අවශ්‍යතාවයකදී මෙන්ම පීඩාකාරී තත්වයකදී ඇයට එම දේපොළ පිරිනැමිය හැක.

ශුද්ධ වූ අල් කුර්ආනයේ කිසිම ස්ථානයක "හව්වා" (ආදම් - අලෛහිස් සලාම් තුමාගේ බිරිඳ) කිසිම විටක ආදම් අලෛහිස් සලාම් තුමා විසින් සිදුකරනු ලැබූ එම වැරැද්දට හේතු වූවාය, යයි සඳහන් නොවේ. එයට ප්‍රතිවිරුද්ධ ලෙස ආදම් තුමා, එතුමාය තමන් විසින් සිදුකරනු ලැබූ එම වැරැද්දට වගකිවයුත්තා යයි අල් කුර්ආනයේ සඳහන් වැකිවලින් පෙන්නුම් කරන සංඥාව විය. ආදම් - අලෛහිස් සලාම් තුමා පමණි තම වැරැද්ද වෙනුවෙන් පසුතැවිලි වූයේ, අදාළ එම වැරැද්ද වෙනුවෙන් සකල ලෝ පාලක සත්‍ය දෙවිඳුන් අල්ලාහ්ගෙන් පාපොච්චාරණ සඳහා වූ වදන් ලබාගත්තේ.

ශුද්ධ වූ අල් කුර්ආන් 2:37. **පසුව ආදම් තම 'රබ්'ගෙන් සමහර වදන් ලබා(ගෙන එමගින් සමාවද ඉල්ලා) ගත්තේය. එහෙයින් ඔහු ඔහුට සමා කළේය. අධිකව සමාකරන්නාද, අසමසම දයාවන්තයාද නියතව ඔහුම වේ.**

නබි මුහම්මද් (සල්) තුමන් පැවසූ බව නබි මිත්‍ර අබූ හුරෛරා (රළි) තුමන් වාර්තා කරයි:

ඔබලා අතරින් විශ්වාසයේ පරිපූර්ණවන්තයින් වන්නේ අලංකාර සත්ගුණාංගයෙන් හෙබි තැනැත්තාය. ඔබලා අතරින් යහපත්ම කෙනා වන්නේ තම බිරිඳට යහපත්ම පුද්ගලයා වන්නේය.
මූලාශ්‍ර ග්‍රන්ථය : අත් තිර්මිදී (මෙය හසන් යන කාණ්ඩයට අයත් සම්මත හදීසයක් යැයි විද්වත් තිර්මිදී (රහ්) තුමාණන් පවසයි.)

ශුද්ධ වූ අල් කුර්ආන් 33.35 **නියතව මුස්ලිම්වරුන් වන පිරිමින්ටද, මුස්ලිම්වරුන් වන ගැහැණුන්ටද, විශ්වාසවන්තයින් වන පිරිමින්ටද, විශ්වාසවන්තයින් ගැහැණුන්ටද, කීකරු පිරිමින්ටද, කීකරු ගැහැණුන්ටද, සත්‍ය කථා කරන පිරිමින්ටද, සත්‍ය කථා කරන ගැහැණුන්ටද, ඉවසිලිවන්තයින් වන පිරිමින්ටද, ඉවසිලිවන්තයින් වන ගැහැණුන්ටද, සිතෙහි බිය ඇති පිරිමින්ටද, සිතෙහි බිය ඇති ගැහැණුන්ටද, දන්දෙන පිරිමින්ටද, දන්දෙන ගැහැණුන්ටද, උපවාස කරන පිරිමින්ටද, උපවාස කරන ගැහැණුන්ටද, තමන්ගේ පතිවත් රැකගන්නා පිරිමින්ටද, පතිවත රැකගන්නා ගැහැණුන්ටද, අල්ලාහ් සමාවද ඉමහත් කුලියද පිළියෙළ කර තබා ඇත්තේය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 04.19 19.
**විශ්වාස කළවුනි! ස්ත්‍රීන්ව බලහත්කාරයෙන් අයිති කරගැනීමට නුඹලාට අනුමැතිය නොමැත. ඔවුන් ප්‍රසිද්ධියේ යම් නින්දාසහගත ක්‍රියාවක් කළේ නම් හැර ඔවුනට නුඹලා දුන් දෑයින් සමහරක් පැහැර ගැනීම සඳහා ඔවුනට හිංසා නොකරන්න. ඔවුන් සමඟ හොඳාකාරව ජීවත්වන්න. නුඹලා ඔවුන්ව අප්‍රිය කළද (ඉවසා ගන්න.) මන්ද, නුඹලා යමක් අප්‍රිය කළද, අල්ලාහ් එහි අධික යහපත තැබීමට පිළිවන.**

ශුද්ධ වූ අල් කුර්ආන් 16.97 **පිරිමියෙක් හෝ ගැහැණියෙක් හෝ විශ්වාස කළ තත්වයෙහි යහකම් කළේ නම් ඔහුට යහ ජීවනයක් ලබා දෙන්නෙමු. ඔවුන් කරමින් සිටි යහකම් වෙනුවෙන් අපි ඔවුන්ගේ කුලිය ඔවුනට දෙන්නෙමු.**

ශුද්ධ වූ අල් කුර්ආන් 2.187 **උපවාස (කාල) රාත්‍රියෙහි නුඹලාගේ බිරියන් සමඟ සංසර්ගයේ යෙදීම නුඹලාට අනුමත කරනු ලැබ ඇත. ඔවුන් නුඹලාට වස්ත්‍රය ලෙසද, නුඹලා ඔවුන්ට වස්ත්‍රය ලෙසද සිටිහුය. නුඹලාට නුඹලාම (රහසිගතව) ද්‍රෝහීකම් කරමින් සිටි බව අල්ලාහ් හොඳින් දනියි. එහෙයින් නුඹලාගේ පාප සමාව භාරගෙන නුඹලාට සමා කළේය. මෙතැන් සිට (උපවාස කාල රාත්‍රියෙහි) නුඹලාගේ බිරියන් සමඟ සංසර්ගයේ යෙදී අල්ලාහ් නුඹලාට නියම කළ දේ සොයාගන්න. තවද ෆජ්ර් වේලාව නැමති සුදු නූල (රාත්‍රිය නමැති) කලු නූලෙන් පැහැදිලිව පෙනෙන තෙක් අනුභව කරන්න; පානය**

**කරන්න; පසුව රාත්‍රිය වන තෙක් උපවාසය සම්පූර්ණ කරන්න. තවද නුඹලා මස්ජිද්වල (නැවතී) ඉඃතිකාෆ් සිටින විට ඔවුන් සමඟ සංසර්ගයේ නොයෙදෙන්න. මේවා අල්ලාහ්ගේ සීමාවන් වේ. එහෙයින්, මේවාට සමීප නොවන්න. මිනිසුන් (තමාට) බිය වී ක්‍රියා කිරීම පිණිස අල්ලාහ් තම වැකි ජනයාට මෙසේ පැහැදිලි කරයි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 30.21 **නුඹලා බිරියන් හමුවෙහි සැණසීම ලැබීම පිණිස, ඔහු නුඹලාගෙන්ම නුඹලා වෙනුවෙන් ඔවුන්ව මවා තිබීමද, තවද ඔහු, නුඹලා අතර කරුණාවද ආදරයද ඇති කර තිබීමද ඔහුගේ සාක්ෂීන්හි ඇති ඒවාය. නියතව මෙහි කල්පනා කරන සමූහයාට බොහෝ සාක්ෂීන් ඇත.**

ශුද්ධ වූ අල් කුර්ආන් 4.127 – 128

127. **(ඕ:නබි!) ඔවුහු ස්ත්‍රීන්ගේ විෂයෙහි නුඹගෙන් ආගමික විනිශ්චය විමසති. 'ඔවුන්ගේ විෂයෙහිද, අනාථ ස්ත්‍රීන්ට නියම කරනු ලැබූ දෙය නුඹලා ඔවුන්ට නොදී ඔවුන්ව විවාහ කර ගැනීමට ප්‍රිය කරන විෂයෙහිද, දුබල කරනු ලැබූ කුඩා ළමුන්ගේ විෂයෙහිද, අනාථයින්ගේ විෂයෙහි යුක්තිය ඉටු කිරීම ගැනද, මෙම පුස්තකයෙහි නුඹලාට කියවා පෙන්වනු ලබන දෑහිද අල්ලාහ් නුඹලාට විනිශ්චය දෙන්නේයැ'යි (නබි) නුඹ පවසන්න! නුඹලා යහකම්හි කුමන දෙයක් කළද නියතව අල්ලාහ් එය ගැන හොඳින් දන්නා ලෙස සිටියි.**

ශුද්ධ වූ අල් කුර්ආන් 128. **ස්ත්‍රියක් තම ස්වාමි පුරුෂයා ගෙන් වෙනස්කම් හෝ ඉවතලීම් පිලිබඳ බිය වූයේ නම් එම දෙදෙනාම තමන් අතර එකඟතාවය ඇති කරගැනීමෙහි ඔවුනතර වරදක් නැත. සුහද එකඟතාවයම වඩාත් හොඳ වේ. ජීවයන් මසුරුකමට ඇතුලත් කරනු ලැබ ඇත. නුඹලා ත්‍යාගශීලිත්වයෙන් ක්‍රියා කර, (අල්ලාහ්ටද) බිය වී ක්‍රියා කළේ නම් නියතවශයෙන්ම අල්ලාහ් නුඹලා කරන දෑ ගැන හොඳින් දන්නා වේ.**

අල්ලාහ් පිරිමි පාර්ශවයට (තමා යටතේ සිටින) ගැහැණු පාර්ශවය වියදම් කිරීම කෙරෙහි අණ කර තිබේ. කාන්තාවකට තම පවුල නඩත්තු කිරීම සඳහා කිසිම ආකාරයේ වියදමක් දැරීමට කාන්තාවකට කිසිම වගකීමක් නැත. එමෙන්ම ඉස්ලාම් දහම කාන්තාවගේ පෞර්ෂත්වය මෙන්ම අනන්‍යතාවය සුරකියි.

යුගදිවියට පිවිසීමෙන් පසුව වුවද ඇයගේ පෙළපත් නාමය දිගටම පවත්වා ගැන යාමට ඉස්ලාම් දහම අනුමැතිය ලබා දී ඇත. පිළිකුලෙන් වූවද ඉස්ලාම් දහම දික්කසාදය අනුමත එකක් බවට පත්කොට තිබේ.

විවාහය යනු අඹු සැමියා අතර එකතු කරන සබැඳියකි, බලවත් ගිවිසුමකි. සතුටින් ජීවත් වන්නට නොහැකි වේ නම් අඹු සැමි දෙදෙනාටම එහිදී දික්කසාදයේ තීරණය ගැනීමට ප්‍රථමයෙන් අලංකාර උපදෙස් මඟින්, මැදිහත්කරුවෙකු මඟින්, මෙන්ම හදවත් සන්සුන් වීම සඳහා කිසියම් කාල සීමාවක් ලබා දීම තුලින් එය විසඳීම සඳහා උත්සාහ කලයුතුයි.

ශුද්ධ වූ අල් කුර්ආන් 04.35 **තවද (අඹු සැමියන් වන) එම දෙදෙනා අතර වෙන්වීමක් සිදුවේ යැයි නුඹලා බිය වූයේ නම්, ඔහුගේ පවුලෙන් තීරකයෙකුවද, ඇයගේ පවුලෙන් තීරකයෙකුවද ඔවුනතර (සමාදානය ඇති කිරීම පිණිස) යවන්න. මෙම දෙදෙනාම (එම දෙදෙනා අතර) එකඟතාවයක් ගැන ප්‍රිය කළේ නම් අල්ලාහ් එම දෙදෙනා අතර එකඟත්වය ඇති කරන්නේය. නියතව අල්ලාහ් හොඳින් දන්නා ද, ඉතා සූක්ෂමයාද වේ.**

"ඊසා" (අලෛහිස් සලාම්) තුමාගේ මව ශුද්ධ වූ අල් කුර්ආනයේ නම සඳහන් වෙන එකම කාන්තාවයි. එමෙන්ම එහි සඳහන් වෙන සංසිද්ධීන් වල කාන්තාව අති විශාල

කාර්යභාර්යක් ඉටු කර තිබෙන බව පෙනේ. ඒ අතරින් ධර්ම දූතයෙකු වූ සුලෛමාන් (අලෛහිස් සලාම්) තුමා හා සබඃ දේශයේ රැජින බල්කීස් අතර වූ සිදුවීම්, එහි අවසානය වූයේ ඇය විශ්වසවන්තියක් බවට පත් වීමය.

ශුද්ධ වූ අල් කුර්ආන් 27.23 **නියතව මම ඔවුන්ව රජ කරන ස්ත්‍රියක දුටුවෙමි. ඇය (අවශ්‍ය) සියලුම ද්‍රව්‍යයන් දෙනු ලැබ ඇත්තීය. තවද, ඇයට ඉමහත් සිංහාසනයක්ද ඇත.**

**අවසන් ධර්ම ශාස්තෘ නබි මුහම්මද් (සල්) තුමාණන් කාන්තාවන්ගේ අදහස් විමසා ඔවුන්ගේ (අගනා) උපදෙස් අනේක අවස්ථාවන්හි පිළිගත් බව ඉස්ලාමීය ඉතිහාසය අපට පැහැදිලි කරයි. කාන්තාවන් හට පිරිමින් මෙන් පල්ලියට පැමිණීම සඳහා අනුමැතියද ලබා දී ඇත. යුදමය අවස්ථාවන්හි පවා කාන්තාව තුවාල කරුවන් හට**

සත්කාර කිරීමේ කටයුතු වල නිරතවී ඇත. එමෙන්ම ව්‍යාපාර කටයුතු වල නිරත වීම, අධ්‍යාපන මෙන්ම දැනුම සෙවීමේ කටයුතු වලදී තරඟකාරීත්වයකින් යුතුව නිරත වීමටද අනුමැතිය ඉස්ලාම් දහම තුල ඇයට හිමිය.

වසර 1400 ට පෙර සිටම ඉස්ලාමිය කාන්තාවන් හට තමන්ගේ මතය දැරීමට, මෙන්ම හඬ නැගීමට අයිතිය ඉස්ලාම් දහම ලබා දී ඇත. නමුත් මෙම නිදහස බටහිර කාන්තාවන් හිමිකරගත්තේ ගෙවුණු සියවසේ වන අතර ඔවුන් එය හිමිකරගත්තේද දැඩි පීඩාවන් වලට මුහුණ දෙමින්, වීදි විරෝධතාවන් පවා පැවැත්වීමෙන් අනතුරුවය.

ඉස්ලාම් දහම බහු විවාහයද අනුමත කළේය. එය එසේ වුවද, සමහරු සිතා සිටින්නාක් මෙන් එය සෑම මුස්ලිමෙකුම

## එලෙස කල යුතු යයි බලකරනු ලබන මූලික සිද්ධාන්තයක් නොවේ. එය විකල්පයකි අනුමැතියකි.

ශුද්ධ වූ අල් කුර්ආන් 04.03 **අනාථයින් (ව විවාහ කර ඔවුන්ගේ) විෂයෙහි සාධාරණව ක්‍රියා කිරීමට නොහැකි යැයි බිය වන්නේ, නම් නුඹලා ප්‍රිය කරන ස්ත්‍රීන්ගෙන් දෙදෙනෙකු, තිදෙනෙකු හෝ සිව්දෙනෙකු විවාහ කරගන්න. නුඹලා (මොවුන් අතර) සාධාරණ ලෙස ක්‍රියා කිරීමට නොහැකි යැයි බියවන්නේ නම් එක තැනැත්තියක්ව (විවාහ කරන්න) නැතිනම් නුඹලාගේ වහල් ස්ත්‍රීන්ව (ප්‍රමාණවත් කරගන්න.) නුඹලා අයුක්තිය නොකර සිටීමට මෙයම ඉතාම සමීප වේ.**

(බහු විවාහය සඳහා වෙන කොන්දේසි අතරින්) සාධාරණත්වයෙන් කටයුතු කල නොහැකි නම් එකම භාර්යාව ගැන සෑහීමට පත්ව කටයුතු කල යුතු බව පවසන ලොව එකම ධර්ම ග්‍රන්ථයයි පාරිශුද්ධ වූ අල් කුර්ආනය. නමුත් ඉස්ලාමයට පෙර බහු විවාහය සඳහා සීමාවක් නොතිබුණි. බොහෝ පිරිමින් හට ගැහැණුන් දහයක් තිබුණි සමහර විට එය සීයක් පමණ විය. එහි සීමාවට පාලනයක් නොවීය. ඉස්ලාමයේ

පැමිණීමත් සමඟ එහි (උපරිම) ප්‍රමාණය හතර දක්වා සීමා කෙරුණි. ඉස්ලාම් දහම බහු විවාහයේදී දෙකක්, තුනක්, හතරක් දක්වා අනුමැතිය ලබා දුන්නේය. එලෙස විවාහ වෙන කෙනා හට ශාරීරික ශක්තිය, වියදම් දැරීමේ ශක්තිය මෙන්ම සාධාරණත්වයෙන් යුතුව (භාර්යාවන් අතර) කටයුතු කිරීම. යන කොන්දේසි පරිපූර්ණ ලෙස සුරැකිය යුතුයි. මෙම කරුණු පහසුවෙන් (සියල්ලන්ටම) ලඟා කරගැනීමට හැකි දෙයක් නොවේ.

ශුද්ධ වූ අල් කුර්ආන් 04.129 **නුඹලා කොපමණ ප්‍රිය කළත් බිරියන් අතර සාධාරණව ක්‍රියා කිරීමට නුඹලාට නොහැකිය. නුඹලා තැනැත්තියකට මුළුමනින්ම නැඹුරු වී අනෙක් තැනැත්තියව (අහසේ) පාවෙන තැනැත්තියක් ලෙස නොහරින්න. නුඹලා නුඹලාව නිවැරදි කර (අල්ලාහ්ට) බිය වී ක්‍රියා කළේ නම් නියතව අල්ලාහ් අධිකව සමා කරන්නා ලෙසද, අසමසම දයාවන්තයා ලෙසද සිටියි.**

**සොබාදහමේ නියමය අනුව පිරිමි සහ ගැහැණු දරුවන්ගේ උපත් සම අනුපාතයකින් තිබේ. නමුත් එම**

දරුවන් අතරින් පැවැත්මේ වැඩි අවස්ථාව පිරිමි දරුවන්ට වඩා ගැහැණු දරුවන් යන්න විද්‍යාත්මකව තහවුරු වූ කරුණකි. එමෙන්ම යුධ සටන්වලදී ඝාතනයට කාන්තාවන්ට වඩා පිරිමින් වැඩි සංඛ්‍යාවක් ඝාතනය වේ. කාන්තා මරණ අනුපාතයට වඩා පිරිමි මරණ අනුපාතයද ඉහළයි. එහි ප්‍රථිපලයකි වැන්දඹු කාන්තාවන්ගේ ප්‍රතිශතය වැන්දඹු පිරිමින්ට වඩා ඉහළයි අගයක පැවතීම. ලෝක ජනගහණයේ කාන්තා ආයු අපේක්ෂාව පිරිමි ආයු අපේක්ෂාවට වඩා ඉහළ අගයක් ගනී. ඒ අනුව ලෝක ජනගහනයෙන් වැඩිපුරම සිටින්නේ පිරිමින්ට වඩා කාන්තාවන්ය, යන පූර්ව නිගමනයට එළඹිය හැක. මේ කරුණු පදනම් කරගෙන සලකා බැලීමේදී සෑම පිරිමියෙකුම එක් භාර්යාවකි යනුවෙන් නීති පැනවීම ගැලපෙන එකක් නොවේ.

බහු විවාහ සඳහා සම්බාධක පැනවී තිබෙන ජන සමාජයන් හි එක් පිරිමියෙකුට විවාහ නීතියෙන් එපිට බොහෝ කාන්තාවන් සමඟ අනියම් සම්බන්දතාවයන් මෙන්ම ආදරවන්තියන් සිටිනු දකින්නට පුළුවන්ය. මෙම තත්වය මත අදාළ එම ආදරවන්තියන් අනාරක්ෂිත මෙන්ම පහත් මට්ටමේ ජීවිතයක් ගත කරයි. ඇයට හෝ ඇයගේ දරුවන් හට කිසිම අයිතිවාසිකමක් (අදාළ එම පිරිමි ආදරවන්තයා හෝ අයථා සම්බන්දතාවය පවත්වන තැනැත්තාගෙන්) නොමැත. නමුත්, අදාළ එම ජන සමාජයන් අතර විවාහයෙන් එපිට තමාගේ ජාතියෙන්ම (වර්ගය / කුලය / ගෝත්‍රය) තුලින් ඇති කරගනු ලබන, සබදතාවයන් කෙරෙහි කිසිම සම්බාධක නොමැති වීම පුදුමයට කරුණකි. එමෙන්ම කිසිම වගකීමක් භාර නොගෙන (පිරිමියා සමඟ) සම්බන්දකම් පැවැත්වීම,

දෙමව්පියන් නොමැතිව දරුවන් පිළිගැනීම, ඇතුළු තවත් බොහෝ කරුණු කෙරෙහි කිසිම ගැටළුවක් එකී සමාජයන් තුල නොමැත. එනමුත් පිරිමියෙකු නිත්‍යානුකූල ලෙස එකකට වඩා වැඩි කාන්තාවන් ගණනක් විවාහ කරගැනීම සඳහා නීතියෙන් අවසර නොදෙයි. ඉස්ලාම් දහම මෙම කාරණාවේදී බුද්ධිමත් ලෙස සලකා බහු විවාහය සඳහා අනුමැතිය ලබා දී තිබේ. කාන්තාවගේ ආරක්ෂාව, ගරුත්වය, මෙන්ම අයිතිවාසිකම් සුරකීමක් ලෙසින් (ඇති එම අවසරය) තවමත් යුග දිවියට එළඹී නොමැති පිරිමි සහකරුවෙකු සොයාගත නොහැකි වාතාවරණයකදී ඒ සඳහා කාන්තාවන්ගේ ප්‍රශ්නයට විවාහක පිරිමියෙකු හා විවාහ වීම යන විකල්පය ඉස්ලාම් දහම ඉදිරිපත් කරයි. එසේ නොමැති විට ඇය තවත් ආදරවන්තියක් (පමණක්) වීමට සිදුවෙනු වෙනු ඇත.

**මේ සෑම අවස්ථාවකම, (අදාළ කාන්තාවගේ සැමියා යනුවෙන්) විවාහ ගිවිසුමේ සඳහන් කිරීම තුළින් තම සැමියාට පමණක්ම අයිති කාන්තාව බවට පත්වීමට හැකියාව ඇයට ලැබෙනු ඇත. එමෙන්ම අනිවාර්යෙන්ම පිළිපැදිය යුතු සහ අවලංගු නොකළ යුතු මූලික කොන්දේසියකි.**

වැදගත් කාරණාව නම් ඉස්ලාම් දහම පිරිමින් හට ලබා නොදී කාන්තාවට (සුවිශේෂී ලෙස) ලබා දී තිබෙන අයිතිවාසිකම් පිලිබඳ සමාජය තුල කථා නොකිරීමයි. පිරිමියා (සමකාලයේ තවත් පිරිමියෙක් සමඟ) විවාහ නොවූ කාන්තාවක් විවාහ කරගැනීම මත තමාව සීමා කරගනී නමුත් කාන්තාව (සමකාලයේ) විවාහ නොවූ සහ විවාහ වූ යන කාණ්ඩ දෙකින් (කැමති එකකින්) ඇය විවාහ කරගනු ලබන්නීය. එමඟින් දරුවන්ගේ පෙළපත සුරැකීම මෙන්ම දරුවන්ගේ අයිතිවාසිකම් මෙන්ම

තම පියාගෙන් ලද දේපොළ රක්ෂණයද එමඟින් සිදු වේ. එනමුත් ඉස්ලාම් දහම කාන්තාවකට විවාහක පිරිමියෙකුව (ඔහුට) විවාහක භාර්යාවන් හතරක් නොසිටින කාළය පුරාවට (බහු විවාහ පදනම මත) විවාහ කර ගැනීමට අනුමැතිය ලබා දෙයි.

එවිට කාන්තාවට පිරිමින් අතරින් තමාගේ සහකරුවා තේරීම සඳහා වැඩි අවස්ථාවක් හිමි වෙනු ඇත. එමෙන්ම තම සැමියාගේ (අනෙකුත්) භාර්යාවන් කෙසේ ඔහු හා කටයුතු කරන්නේද යන්න පිළිබඳවත් ඇයට දැනගත හැකවේ. එමෙන්ම විවාහය පිළිබඳ මනා අවබෝධයකින් යුතුව විවාහ දිවියට මුල පිරිය හැක.

## 20. ආදරය සහ උපකාරයේ දහමයි ඉස්ලාම්.

ශුද්ධ වූ අල් කුර්ආන් 03.123 **නුඹලා බලයෙන් හීන වී සිටි කල්හි බද්ර් (සටනෙ)හි අල්ලාහ් නුඹලාට නියතව උදව් කළේය. එහෙයින්, නුඹලා තුති කිරීම පිණිස අල්ලාහ්ට බියවී ක්‍රියා කරන්න.**

ශුද්ධ වූ අල් කුර්ආන් 5.2 **විශ්වාස කළවුනි! අල්ලාහ්ගේ සලකුණු, පූජ්‍ය මාස, බිලි සතා, (බිලි දීම වෙනුවෙන්) ලකුණු කරනු ලැබූ ඒවා, තමන්ගේ 'රබ්'ගේ දායාදයද, තෘප්තියද අපේක්ෂා කළවුන් ලෙස බයිතුල් හරාමය දෙසට පැමිණෙන්නන්වද (අගෞරවයට පත් කිරීම) නුඹලා දෙයක් නොකරගන්න. නුඹලා ඉහ්රාමයෙන් ඉවත් වූයේ නම් නුඹලාට දඩයම් කළ හැක. මස්ජිදුල් හරාමයට යන්න නොදී නුඹලාව වැළැක්වූ එක් කණ්ඩායමක් කෙරෙහි ඇති අප්‍රියතාවය (ඔවුන් කෙරෙහි) සීමාව ඉක්මවීමට නුඹලාව නොපෙළඹ විය යුතුය. යහකම් කිරීමෙහිද (අල්ලාහ්ට) බිය වී ක්‍රියා කිරීමෙහිද එකිනෙකාට උදවු කරගන්න. තවද පව් කිරීමෙහිද, සීමාව ඉක්මවීමෙහිද එකිනෙකාට උදවු නොකරන්න. තවද අල්ලාහ්ට බියවන්න නියතව අල්ලාහ් දඬුවම් දීමෙහි දැඩි කෙනා වේ.**

## 21. දෙලොවෙහිම සතුට සැනසුම සනාථ කරන එකම දහමයි ඉස්ලාම්.

ශුද්ධ වූ අල් කුර්ආන් 03.19 **නියතව අල්ලාහ් හමුවෙහි (අනුමත කරනු ලැබූ) දහම ඉස්ලාමය. පුස්තකය දෙනු ලැබූවන් තමන්ට දැනුම ලැබුණ පසුවද තමන් අතර තිබූ ඊර්ෂ්‍යාව හේතුවෙන්ම හැර මත භේද පෙන්වූයේ නැත. කවරහු අල්ලාහ්ගේ වැකි ප්‍රතික්ෂේප කරත්ද (ඔවුන්ව) නියතව අල්ලාහ් විභාග කිරීමෙහි තීව්‍රවන්තයාය.**

ශුද්ධ වූ අල් කුර්ආන් 03.85 **කවරෙක් ඉස්ලාම් නොවන්නක් ආගම ලෙස පිළිගැනීමට ප්‍රිය කරයිද එය ඔහුගෙන් පිළිගනු නොලබන්නේය. එලොවෙහි ඔහු පාඩුවූවන්ගෙන් කෙනෙකු වන්නේය.**

## 03. මුහම්මද් (නබි තුමා) ගැන විමතියට පත් වූවන්:

ඉතිහාසයේ දිගටම ධර්ම ශාස්තෘ මුහම්මද් (සල්) තුමන් ගැන බොහෝ අය තමන්ගේ විමතිය පළ කොට තිබේ. ඒ අතරින් මුස්ලිම් නොවන නායකයන්ද වන්නෝය. විමතියෙන් වූ එවන් ප්‍රකාශ තුලින් ඉස්ලාමයේ වැදගත්කමටද හිමිවූයේ සුවිශේෂී ස්ථානයකි. එවන් සුවිශේෂී සමහර මත ප්‍රකාශ පහතින්.

### - නැපෝලියන් බොනපාට්

" එකම සත්‍ය මෙන්ම මිනිස් සංහතිය නිත්‍ය සතුට වෙත මඟ පෑදිය හැකි කුර්ආනය මත පදනම් වූ ඒකාකාරී තන්ත්‍රයක් පිහිටුවීම සඳහා සෑම රටකම සිටින සියලුම බුද්ධිමත් උගත් මිනිසුන් එක්සත් කිරීමට මා හට හැකි

වූ විට, (එය කිරීමට මා අපේක්ෂා කරමි) එහි කාලය වැඩි ඈතක නොවන බව මම දැඩි ලෙස විශ්වාස කරමි."
(නැපෝලියන් සහ ඉස්ලාම්, පැරිස් 1914)

## - මහත්මා ගාන්ධි

" යංග් ඉන්දියා" නම් වූ පුවත්පතක මහත්මා ගාන්ධි සමඟ පැවැත්වූ සංවාදයකදී, මුහම්මද් (නබි) තුමාගේ ගුණාංගයන් ගැන එතුමා තම කියවීම මෙලෙස අවධි කළේය:

"අදටත් අවිවාදයෙන් යුතුව පිළිගත හැකි, මිලියන සංඛ්‍යාත ජන තාවගේ සිත් නොරිදවා දිනාගත් පුද්ගලයාගේ ජීවිතය ගැන දැන ගැනීමට මා හට අවශ්‍ය විය. එහිදී ඉස්ලාම් දහම හිමිකරගෙන තිබෙන ජයග්‍රාහී ස්ථානය සඳහා අසිපත කිසිම විටක හේතු නොවීය යයි මා හට ඉඳුරා පැවසිය හැක. දැඩි සරල බව, ධර්ම දූතයාගේ අසීමිත ස්ව-කාර්යක්ෂමතාවය, පොරොන්දු කෙරෙහි සත්‍යවන්ත බව, තමාගේ මිතුරන් හා අනුගාමිකයන් කෙරෙහි ඔහු දැක්වූ දැඩි උනන්දුව, තමාගේ නිර්භීත භාවය, දෙවිඳුන්

කෙරෙහි සහ තමාගේ අරමුණු කෙරෙහි වූ විශ්වාසය, යන මෙවන් (සත්) ගුණාංගයන් (ඉස්ලාම් දහමේ ව්‍යාප්තිය සඳහා) මාර්ගය සකස් කළා මිසක් කඩුව සෑම දෙයක්ම ඔවුන්ට පෙර ගෙන ගොස් සෑම බාධකයක්ම ජය ගැනීමට සැලැස්වූයේ නැත. නබිතුමාගේ චරිතාපදානයේ දෙවන වෙළුම කියවීමෙන් පසු, මට කණගාටුයි, එම ශ්‍රේෂ්ඨ ජීවිතය ගැන කියවීමට මට තවත් දෙයක් නොතිබුණි."

## - ලාමාර්ටින්

"ප්‍රංශ (දේශපාලකයෙකු, කතුවරයෙකු මෙන්ම) කවියෙකු වූ "ලමාර්ටින්" ("අල් අත්රාක්" නම් වූ කෘතියේ) විශිෂ්ඨ නායකයෙකු සතු නිර්ණායක, මූලිකාංග තුනක් සඳහන් කළේය. ඒවා නමින්:

1- අරමුණෙහි උසස් බව.

2- අඩු පහසුකම්.

3- විශිෂ්ඨ ප්‍රතිඵල.

එතුමා : දාර්ශනිකයෙක්, කථිකයෙක්, ධර්ම ශාස්තෘවරයෙක්, ව්‍යවස්ථාදායකයෙක්, රණශූරයෙක්, විකෘති අදහස් කඩා බිඳ දැමූවෙකි, ස්ථූප මෙන්ම රූප වලින් තොර

වන්දනාව කරා මඟ පෙන්වූවෙකි. මේ පොළොවේ අධිරාජයන් 20ක් පිහිටුවා. එක් ආධ්‍යාත්මික අධිරාජයක්ද පිහිටවූවෙකි, ඔහු නමින් මුහම්මද්ය. පුද්ගලයෙකුගේ ශ්‍රේෂ්ඨත්වය මැනීම සඳහා වූ සියලුම මිනුම් ක්‍රම භාවිතා කරමින් උත්සාහ කළත් ඔහුට වඩා ශ්‍රේෂ්ඨයෙකු සොයා ගත හැකි වේද? "

## - ඇඩ්වර්ඩ් ගිබ්බොන්

"මුහම්මද්ගේ ප්‍රතිපත්තියට හැර තහවුරු කිරීමට නොහැකි පැහැදිලි දෙවියෙකු සිටී යනුවෙන් ඕනෑම දාර්ශනිකයෙකු විශ්වාස කරයි. වර්තමානයේ එය පිළිගැනීමට අපගේ බුද්ධියට නොහැකි වුවද එය (උසස් වූ) ප්‍රතිපත්තියකි."

## - බොස්වර්ත් ස්මිත්

මුහම්මද් සෑම ස්ථානයකටම තමාගේ සංකල්පය ප්‍රචාරය කිරීමට පටන් ගත් මොහොතේ සිට ජීවිතයේ අවසානය දක්වා තමා දෙවිඳුන්ගෙන් වු ධර්ම ශාස්තෘ කෙනෙක් යැයි සමාජය අතරට ගෙන ගියා"

(බොස්වර්ත් ස්මිත්ගේ කෘතිය: ආසියාවේ සාහිත්‍යය / පෙරවදනය).

"මුහම්මද් දේශපාලන නායකත්වය මෙන්ම ආධ්‍යාත්මික නායකත්වය යන තනතුරු දෙකම එකවර හෙබවීය. එනමුත් ඔහුට පූජකයන්ගේ අහංකාරය නොතිබුණි, සීසර්ට වැනි හමුදා භටයන්ද නොවීය. සන්නද්ධ හමුදාව, පුද්ගලික ආරක්ෂක නිලධාරීන්, සුවිසල් මාලිගා මෙන්ම ස්ථිර ආදායම් මාර්ගයක්ද නොවීය. දේව ආශිර්වාදය මතය තමා ප්‍රක්ඥාවන්තයි යමෙකු පවසයි නම් එසේ පැවසිය හැක්කේ 'මුහම්මද්' හට පමණි. මක් නිසාදයත් ඔහු පාලකයෙකු ලෙස බලය නිසි ලෙස හැසිරුවා මිසක් අල්ප වස්තූන් තමන් සතුකර ගැනීම සඳහා උත්සාහ නොකළේය. එමෙන්ම තම පවුලේ හිතවතුන් හට තාන්න මාන්න පිරිනැමුවේ නැත."

## - ඇනී බෙසන්ට්:

ලේඛිකාවක් මෙන්ම කාන්තා අයිතිවාසිකම් පිළිබඳ බ්‍රිතාන්‍ය ක්‍රියාකාරිණියක් වන ඇනී බෙසන්ට් පවසයි:

ශේෂ්ඨ වූ නබිගේ ජීවිතය පිළිබඳ මෙන්ම ඔහුගේ චරිතය හදාරන කෙනෙකු එතුමාණන් ඉගැන්වූ ආකාරය සහ එතුමා ජීවත් වූ ආකාරය මෙන්ම සමාජය තුල එතුමා කෙබඳු චරිතයක්ද යනුවෙන් (එතුමාගේ අනුගාමිකයන් විසින්) හඳුනාගනු ලැබුවේද යන කරුණු පිළිබඳ හදාරන කෙනෙකුට මෙම ශ්‍රේෂ්ඨ නබි පිළිබඳ ගරුත්වයක් ඇති වීම අරුමයක් නොවේ. ධර්ම ශාස්තෘවරු අතරින් උසස්වූ දෙවිඳානන්ගේ ශ්‍රේෂ්ඨ ධර්ම දූතයෙකු විය. නමුත් මෙහි මා සඳහන් කරන්නේ සෑම පුද්ගලයෙකුට හුරුපුරුදු කරුණුය. එමෙන්ම මා පෞද්ගලිකව එතුමාගේ ජීවිත කතාව නැවත නැවත කියවන විට අමුතුම ආකාරයෙන් එතුමගේ ජීවිත කතාව මාගේ විස්මය ඉහල නැංවීය. මෙම ශ්‍රේෂ්ඨ අරාබි ගත්වරයානන් ගැන වෙනස්ම ආකාරයේ ගරුත්වයක් මා තුල ඇති විය.

(මුහම්මද්ගේ චරිතාපදානය මෙන්ම ඉගැන්වීම්. වර්ෂ 1932, 4 වන පිටුව)

## - ජේම්ස් මයික්නර්

ජේම්ස් මයිකනර් අවසන් ධර්ම ශාස්තෘවරයාගේ පෞරුෂය තුළ පවතින දයාවේ සුරූපය ගැන කථා කරන්නේ අවසන් ධර්ම ශාස්තෘවරයාගේ සරල බව (සල්), ඔහුගේ මනුෂ්‍යත්වය, ත්‍යාගශීලිත්වය සහ ඔහුගේ ස්ථිරභාවය පෙන්වා දීමෙනි. මයිකනර් මෙසේ පවසයි: "ඉස්ලාමයේ මූලධර්ම සකස් කළ දේවානුභාවයෙන් යුත් මිනිසා මුහම්මද් (සල්) උපත ලැබුවේ පිළිම වන්දනා කරන ගෝත්‍රයක ය. ඔහු දුප්පතුන්ට, අගහිඟකම් ඇති අයට, වැන්දඹුවන්ට, අනාථයන්ට, වහලුන්ට හා දුර්වල මිනිසුන්ට ප්‍රේම කළේය. මුහම්මද් නබි (සල්) තුමා සිය විශිෂ්ට ලක්ෂණ සමඟ අර්ධද්වීපයේ සහ සමස්ත මැදපෙරදිග විප්ලවයක් ගෙන ආවේය. ඔහු තම ආශීර්වාද ලත් දෑතින් පිළිම විනාශ කළ අතර සර්වබලධාරී අල්ලාහ්ට නමස්කාර කරන ආගමක් ස්ථාපිත කර සිටියේය. අවසන් ධර්ම ශාස්තෘ මුහම්මද් කාන්තාවන්ට ගරු කළ අතර කාන්තාරයේ

කුරිරු මානසිකත්වයෙන් ඔවුන්ව බැඳ තබන වහල්භාවයේ බාධක ඉවත් කළේය. ඔහු (සල්) සමාජ සමානාත්මතාවය ඉල්ලා සිටි අතර, ඔහුගේ ජීවිතයේ අවසාන දින කිහිපය තුළ ඔහු රජෙකු හෝ සාන්තුවරයෙකු වීමට ඉල්ලා සිටියද, ඔහු තරයේ කියා සිටියේ තමා අල්ලාහ්ගේ වහලුන් අතරින් තවත් එක් වහලෙක් බවයි. එමෙන්ම තමාව මුළු ලෝකයටම යවන ලද ශුභාරංචිය පවසන්නෙකු සහ අනතුරු අඟවන්නෙකු ලෙස පත්කර ඇති බව පැවසීය.

ඉස්ලාමය වරදවා වටහාගත් ආගම, රීද්ර්ස් දිජිට්ස් සඟරාව, (ඇමරිකානු ප්‍රකාශනය), මැයි 1955, පිටු 68-70

## - මයිකල් හාර්ට්

මයිකල් හාර්ට් තාරකා විද්‍යාඥයෙකි, ගණිතඥයෙකි එමෙන්ම ඉතිහාසඥයෙක්ද වේ. ඉතිහාසයේ වඩාත්ම බලගතු අමරණීය පුද්ගලයන් සියය යන ග්‍රන්ථය ප්‍රකාශට පත් කිරීම සඳහා මානව සංහතිය තුල ප්‍රබල ලෙස බලපෑම් කළ ශ්‍රේෂ්ඨයන් පිලිබඳ ගවේෂණයක යෙදුණේය.

මනුෂ්‍යත්වය තුල ප්‍රබල ලෙස බලපෑම් කළ සිය දෙනෙකුට වඩා ඔහු එහි සඳහන් කළේය. ඒ අතර:
අල් මසීහ් (ඊසා අලෛහිස් සලාම් තුමා) - මූසා (අලෛහිස් සලාම් තුමා) - අසූස් - ඇරිස්ටෝටල් - ගෞතම බුදු රජාණන් වහන්සේ - කොන්ෆියුසියස් - හිට්ලර් - ප්ලේටෝ - සොරොස්ටර් තවත් බොහෝ අය ගැන සඳහන් කළේය. එමෙන්ම ඔවුන් සමාජය තුල ඇති කරන ලද විප්ලවීය වෙනෙස කෙතරම්ද යන කාරණාව මත ප්‍රමුඛස්ථානය ලබා දීමට කටයුතු කළේය. එකී ස්ථාන අංක එක සිට සියය දක්වා ලබා දීම සඳහා හේතු කාරණා වුනු දේවල් පිළිබඳවද ඔහු එහි සඳහන් කළේය. එහිදී ඔහු ප්‍රථම ස්ථානය ලබා දී තිබෙන්නේ නබි මුහම්මද් (සල්) තුමන් හටය. ඒ පිලිබඳ කරුණු සඳහන් කරමින් ඔහු මෙලෙස පවසයි:

"ලෝකයේ වඩාත්ම බලගතු පුද්ගලයින්ගේ ලැයිස්තුවට නායකත්වය දීමට මම මුහම්මද්

තෝරා ගැනීම සමහර පාඨකයින් පුදුමයට පත් කළ හැකි අතර අනෙක් අය විසින් ප්‍රශ්න කරනු ලැබිය හැකි නමුත් ආගමික හා ලෞකික මට්ටමින් අතිශයින්ම සාර්ථක වූ එකම මිනිසා ඔහු විය."

(අමරණීයයන් සිය දෙනා, පිටු අංකය 33, මයිකල් හාර්ට්)

## - සරෝජිනී නායිඩු

ඉන්දියානු කවියෙක් වන " සරෝජිනී නායිඩු" පවසයි (ඉස්ලාමයේ පරමාදර්ශයන්) :
නියතව ආරාධනා කර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන එකම දහම ඉස්ලාමය වේ. සලාතය සඳහා ආරාධනා කර සලාතය ස්ථාපිත කරනු ලබන විට ප්‍රජාතන්ත්‍රවාදය දිනකට පස් වතාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ගොවියා සහ රජු "අල්ලාහු අක්බර්" (අල්ලාහ් ශ්‍රේෂ්ඨය) යනුවෙන් පවසමින්, එකම අවස්ථාවේ (රුකූ කරමින්) නැමී සිටින මොහොත මාගේ සිත් ගත්තේය. ඉස්ලාම් දහම මානවයා අතර ස්වභාවිකව ඇති කර තිබෙන එම එක්සත් භාවය ගැන දිගටම මා පුදුම වුනෙමි.

## - තෝමස් කාලයිල්

තෝමස් කාලයිල් (වීරයන් සහ වීර වන්දනාව - ලන්ඩන් 1959) නම් කෘතියේ කතුවරයා.

"එක් මිනිසෙක් තනි අතින්, වඩාත්ම බලවත් සහ ශිෂ්ඨසම්පන්න ජාතියක් හා සටන් කරන (බදුවී නොහොත්) සංචාරක අරාබිවරු ගෝත්‍රිකයින් අතර දශක දෙකකට අඩු කාලයකදී අන්‍යොන්‍ය බැඳීමක් ඇති කිරීමට හැකි වුනේ කෙසේද?"

## - ස්ටැන්ලි ලින් පෝල්

බ්‍රිතාන්‍ය පෙරදිගවාදියෙකු මෙන්ම පුරාවිද්‍යාඥයෙකු වන 1854 හි උපන් ස්ටැන්ලි ලින් පෝල් මහතා පැවසූහ:

මුහම්මද් (සල්) තුමන් කරුණාවන්ත මෙන්ම සෙනෙහවන්ත කෙනෙකු ලෙස සිටීය. එමෙන්ම රෝගීන් වෙත ගොස් සුවදුක් විමසුවා, දුගීන් බැහැ දැක්කා, වහලුන්ගේ ආරාධනාවන් පිළිගෙන එයට ප්‍රතිචාර දැක්වූවා. එතුමා තමාගේ ඇඳුම් නැවත පිළිසකර කර ගත්තා. - කිසිදු සැකයක් නොමැත - ඔහු උතුම් ධර්ම

ශාස්ත්‍රෘවරයෙකි. ඔහු දුප්පත් අනාථ දරුවෙකු ලෙස වැඩුණේය. පසුව ඔහු විජයග්‍රාහී ශ්‍රේෂ්ඨ නායකයෙකු විය.
ග්‍රන්ථය : මුහම්මද්ගේ කථාවන් සහ මේස කථා (The Speeches and Table-Talk of the Prophet Muhammad - 1893)

## - ජෝර්ජ් බර්නාඩ් ෂෝ:

ලේඛකයෙකු වූ ජෝර්ජ් බර්නාඩ් ෂෝ නබි තුමන් ගැන කළ වර්ණනාවකදී පැවසූහ: "අනිවාර්යෙන්ම ඔහු මනුෂ්‍යත්වයේ ගැලවුම්කරුවා ලෙස හැඳින්විය යුතුයි, යයි මා විශ්වාස කරමි. එමෙන්ම ඔහු මෙන් තවත් පුද්ගලයෙකු සමකාලීන ලෝක ආඥාදායකයා වෙයි නම්, නියතව සතුට සහ සාමය රැදෙන ආකාරයට ප්‍රශ්න විසඳෙනු ඇත.
(අව්‍යාජ ඉස්ලාමය, සිංගප්පූරුව, වෙළුම 1, අංක 8, 1936)

## 04. ලුහුඬින්

**ඉස්ලාම් දහම තුල මිනිසාව අදේවවාදය වෙතට රැගෙන යන කිසිම ඉගෙන්වීමක් නොමැත. එමෙන්ම බුද්ධිය ව්‍යාකූල කරවන කිසිවක්ද නැත. ඉස්ලාම් දහම සරලයි ශක්තිමත්.**

* මෙම විශ්වයේ ඇති සියල්ල නිර්මාණය කළේ එකම දෙවියෙකි. සෑම මැවීමක්ම විනිශ්ච දිනයේ ඔහු වෙත ඒකරාශී කරනු ලබයි.

* උත්පාදකයා සෑම සමාජයක් වෙතම පහළ කළේ එකම පණිවිඩයකි, ගැලවීම සඳහා එකම ක්‍රමයකි, එය සුපැහැදිලි මෙන්ම සරල පණිවිඩයක් විය. එය නමින් ඒකීය දෙවිඳුන් විශ්වාස කොට ඔහුට පමණක් වන්දනාමාන කිරීම වේ. යම් ජන සමාජයක් වෙත ධර්ම දූතයෙකු පහළ කරනු ලැබීම යනු එම ජනයාගේ (ආධ්‍යාත්මික) මං මාවත එළිය

කරවන ආලෝකයක් සේ විය. ඔවුන් (තම අනුගාමිකයන් හට) ගැලවීමේ මඟ පැහැදිළි කර දුන්නේය. එමෙන්ම උත්පාදකයාව නමස්කාර කිරීම තුලින් එම නබිගේ ඉගෙන්වීම් සහ ක්‍රියා අනුගමනය කිරීම තුලින් කෙසේ ගැලවීමේ මඟ කරා යොමුවිය හැකිද යනුවෙන් පැහැදිළි කළේය. සමහරුන් වැරදි ලෙස අවබෝධ කරගෙන සකල ලෝ පරිපාලක අල්ලාහ් වෙත සමීප වීම සඳහා තම ධර්ම ශාස්තෘ වරයාණන්ව අතරමැදියෙකු ලෙස හෝ දෙවියෙකු ලෙස පත්කරගෙන තිබෙන්නාක් මෙන් නොව.

* ඉස්ලාමය තුල පූජකවරුන් නොමැත. ආගම දහම සියල්ලන් හට අයිති වේ. සකල ලොව පරිපාලක (ඒකීය දෙවිඳුන්) ඉදිරියේ සෑම මනුස්සයෙකුම එක සමාන වේ. (මනුස්සයින්) ඔවුන්ගේ ක්‍රියාකාරකම් මත, හැසිරීම් මත සහ ඔවුන් රැස්කරගත් කුසල් අකුසල් මත විමසනු ලබයි. එහිදී ඔවුනොවුන්ගේ ලිංග භේදය හෝ වර්ග භේදය කිසිම විටක බලපාන්නේ නැත.

* උත්පාදකයා ඒකීය දෙවියෙකු ලෙසින් වන්දනාමාන කරනු ලැබිය යුතුයි, එය ඔහුගේ අයිතිවාසිකමකි. එමෙන්ම දාසයන් කෙරෙහි තිබෙන යුතුකම වන්නේ තම දෙවිඳුන් හා සෘජු සබඳතාවයන් ඇතිකර ගැනීමය.

* සෑම දරුවෙකුම සොබා දහමේ දරුවෙකු ලෙස උපත ලබයි, එම කුඩා දරුවා සොබා දහම තුල තම උත්පාදකායාගෙන් උපකාර පතන, වන්දනා මානයන් වලදී සෙසු දේවල් වලට පරිබාහිරව තම උත්පාදකයා වෙත පමණක්ම හැරෙන තමා වටා සිටින කිසිවෙකුගේ මැදිහත්වීමකින් තොරව (දෙවිඳුන් පිලිබඳ ස්වභාවික මතයක) සිටී. නමුත් ඔහු තමා වැඩිවියට පත්වෙන අවස්ථාවේ තමාගේ කල්ක්‍රියා පිලිබඳ වගකීම් දරන, සිතුවිල්ලේ පූර්ණ නිදහස හිමි, තම අභිමතය පරිදි තමා කැමති දෙයක් විශ්වාස කරන, පූර්ණ නිදහස භුක්ති විඳින කෙනෙකු බවට පත්වෙයි. ඒ අතර ඔහු තමාව උත්පාදනය කළ දෙවිදාණන් ඒකීය

දෙවියෙකු ලෙස පිළිගනිමින් සොබාදහමෙහි තමාව තරකර ගනී. නොඑසේ නම් එම දරුවා තම ධර්මය මෙන්ම (ආධ්‍යාත්මික) මාවත අතහැර දෙවිඳුන් හා තමා අතර අතරමැදියන් ඇතිකරගනී. කෙසේ නමුත් එම දරුවාගේ සංස්කෘතිය ඔහු හැදෙන පරිසරය (පවුල මෙන්ම අධ්‍යාපන ආයතන) වැනි ස්ථාන තුලින් ඒකීය දෙවිඳුන්ව පිළිගෙන කෙසේ ඔහුට සෘජුව වන්දනාමාන කල යුතුද, නැත්නම් එම දරුවාට මේ විශ්වයේ නිර්මාතෘ අතර අතරමැදියන් මෙන්ම සඟයන් ලෙස (යේසුස් වහන්සේව, කන්‍යා මේරි තුමිය නොහොත් මර්යම් (අලෛහිස් සලාම්) තුමියව, බුදුරාජාණන් වහන්සේව, ස්තූප, පමණක් නොවේ නබි මුහම්මද් (සල්) තුමන්වද) පත්කර ගැනීම පිලිබඳ (මනංකල්පිතයන්) කියා දෙනු ලබයි. කාරණය නම්, කුඩා දරුවාගේ දහම් පිලිබඳ වූ විශ්වාසය තමා වටා තිබෙන සොබාවය හා බැඳී තිබීමය. එය ඔහුගේ අනාගත ආධ්‍යාත්මික ජීවිතයේ විශ්වාසයන් සහ වන්දනාවන් පිලිබඳ තීරණ ගැනීමට හේතු

සාධක වේ. ඔහු ලොකුමහත් වෙන විට තේරීමේ නිදහස ඔහුට තිබුණද තම සමාජයෙන් තමා උරුම කරගත් දේ වෙනස් කිරීම පිළිබඳ දැඩි අසීරු භාවයක් ඔහු අත්විඳියි.

* මුල් පාපයක් කියා දෙයක් නැත, අන් අයගේ කර මත තම පව් පැටවීමක් හෝ එයින් තමා නිදහස් වීමක්ද නොමැත. අල්ලාහ් සෑම පුද්ගලයෙකුවම ඔහු තමාගේ හිය බැතිය සහ යහපත්කම ගැන පරීක්ෂා කරයි.

* ඉස්ලාම් දහම විද්‍යාවට පටහැනි නොවේ, එමෙන්ම අප මතක තබා ගත යුතුයි උත්පාදකයෙකු සිටී යනුවෙන් ඉස්ලාම් දහම විශ්වාස නොකළ බොහෝ බටහිර විද්‍යාඥයින් තම සොයාගැනීම් ඔස්සේ තහවුරු කර තිබේ.

* ඉස්ලාම් යන නම කිසිම මනුස්ස නමක් සමග හෝ ස්ථානයක් හෝ කිසිම පක්ෂයක් වෙත සම්බන්ධ වී නොවේ. එනමුත් සර්ව

බලධාරී අල්ලාහ් වෙත වූ සම්බන්දතාවය පිළිබිඹු කරයි.

* අල්ලාහ් තම ධර්ම ශාස්තෘ තුමාණන්ව පිවිතුරු ඉස්ලාමයේ පණිවුඩය සමඟ මනුස්ස සංහතියේ සෑම දෙනා වෙතම පහළ කළේය.

ශුද්ධ වූ අල් කුර්ආන් 7:158 **මිනිසුනි! නියතව මම නුඹ සියලුදෙනාටම අයත් අල්ලාහ්ගේ දූතයා වෙමි. අහස් හා පොළොවෙහි රාජ්‍ය ඔහුටම අයත්ය. (සැබවින්ම) නැමදුම් ලැබීමට සුදුස්සා ඔහු හැර අන් කිසිවෙකු නැත. ඔහුම ප්‍රාණවත් කරයි. තවද මරණයට පත් කරයි යැයි (නබි) නුඹ පවසන්න. එහෙයින්, නුඹලා අල්ලාහ්වද, (සක්ෂරතා දැනුම නොමැති) උම්මි නබි වන ඔහුගේ දූතයාවද විශ්වාස කරන්න. ඔහුද, අල්ලාහ්වද ඔහුගේ වදන්ද විශ්වාස කරයි. නුඹලා යහමඟ ලැබීම පිණිස ඔහුවම පිළිපදින්න.**

ශුද්ධ වූ අල් කුර්ආන් 34:28 **(ඕ:නබි!) අපි නුඹව මිනිසුන් සියල්ලන්ටම සුභාරංචි පවසන්නා ලෙසද, අවවාද කරන්නා ලෙසද හැර නොයැව්වෙමු. නමුත් මිනිසුන්ගෙන් වැඩිදෙනෙක් නොදනිති.**

* ඉස්ලාම් දහම පිළිගැනීම සරල මෙන්ම පහසුය, කළ යුතුව තිබෙන්නේ දෙවිඳුන්ගේ

ඒකීය භාවය (පිළිගෙන) සාක්ෂිදැරීම සහ මුහම්මද් (සල්) තුමන්ව ධර්ම දූතයෙකු ලෙස පිළිගැනීම, යනාදිය කියා පාන විශ්වාසයේ මුතු වදන් පෙළ "**ෂහාදාව**" නමින් සුප්‍රසිද්ධ පහත සඳහන් වාක්‍ය කීමය.

**අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ ලා ෂරීක ලහු ව-අෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු ව-රසූලුහු, ව-අෂ්හදු අන්න රුසුලුල්ලාහි හක්කුන් ව-අෂ්හදු අන්නල් ජන්නත හකකුන් ව-න්නාරු හක්කුන්.**

ඒකීය සත්‍ය දෙවිඳුන් වන අල්ලාහ් හැර අන් කිසි දෙවියෙකු නොමැත ඔහුට කිසිම සගයෙකු නොමැත, එමෙන්ම මුහම්මද් අල්ලාහ්ගේ දාසයෙකු මෙන්ම (අල්ලාහ් විසින් පහල කරනු ලැබූ අවසන්) ධර්ම ශාස්තෘ බවත් (පිළිගෙන) මා සාක්ෂි දරමි. එමෙන්ම සියලුම ධර්ම ශාස්තෘවරුන් සත්‍ය බවත් ස්වර්ගය මෙන්ම අපායද සත්‍ය බවත් මා (පිළිගෙන) සාක්ෂි දරමි.